# රණවිරුවා

2022 සැප්තැම්බර් • 247 කලාපය



## යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන්
## ආගමික සහජීවනයට මුල්තැනක්...

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර



# කිරිවෙහෙර පුදබිමේදී යුද්ධ හමුදා ධජයන්ට සෙත් පතමින්



ඔක්තෝබර් මස 10 දිනට යෙදී ඇති 73 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ ආශිර්වාද පූජාව ඉකුත් සැප්තැම්බර් 21 වන දින ඓතිහාසික කතරගම කිරිවෙහෙර අභියසදී හා කතරගම දේවාල පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

යුද්ධ හමුදා ධජයන් පෙරටු කරගත් නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් මෙම ආශිර්වාද පූජාව සඳහා එක්වූහ. සියලුම යුද්ධ හමුදා රෙජිමේන්තු, ආරක්ෂක සේනා මූලස්ථාන, පුහුණු පාසල්, සේනාංක, බලසේනා සහ ඒකකවලට අයත් ධජ මේ සඳහා එක්කර තිබිණ.



එහිදී, කතරගම කිරිවෙහෙර රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය කොබවක ධම්මින්ද නාහිමියන් ප්‍රමුඛ ගරුතර මහා සංඝරත්නය විසින් ආගමික වතාවත් සිදුකර ආශිර්වාද එක් කළේය. එම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපති විසින් කතරගම ඓතිහාසික පුදබිමේ සංවර්ධන කටයුතු සඳහා මෙන්ම කතරගම දේවාලයේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරනු ලැබීය.



මෙම සම්ප්‍රදායානුකූල චාරිත්‍රයට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, ආරක්ෂක සේනා ආඥාපති (මධ්‍යම) මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සහ 12 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරීන් පිරිසක් ද එක්වූහ.

# යුද්ධ හමුදා ධජයන්ට සෙත්පැතීම මෙවරත් ජය ශ්‍රී මහා බෝ සමිඳු අභියසදී

ඔක්තෝබර් මස 10 වන දිනට යෙදී තිබෙන 73 වන යුද්ධ හමුදා සංවත්සර සැමරුමට සමගාමීව සියලු යුද්ධ හමුදා ධජයන්ට සෙත්පතමින් සිදුකරනු ලැබූ ආගමික උත්සවය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 24 වන දින ඓතිහාසික අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියසදී පැවැත්විණි.




මෙම ආගමික උත්සවයේදී ලංකාරාම රජමහා විහාරාධිපති අතිපූජ්‍ය රලපනාවේ ධම්මජෝති නාහිමියන් විසින් විශේෂ අනුශාසනාවක් සිදුකළ අතර, එහිදී මාතෘ භූමිය වෙනුවෙන් යුද්ධ හමුදාවේ දායකත්වය සහ කැපවීම මහත් අභිමානයෙන් යුතුව සිහිපත් කළේය. මෙහිදී, ආගමික වතාවත් සිදුකර ආශිර්වාද එක් කිරීම සඳහා රුවන්වැලිසෑය විහාරාධිපති අතිපූජ්‍ය ආචාර්ය පල්ලේගම හේමරතන නාහිමි ඇතුළු විහාරස්ථාන නියෝජනය කරමින් මහා සංඝරත්නය වැඩම කරනු ලැබූහ. මෙම උත්සව අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, යුද්ධ හමුදා අධ්‍යක්ෂක මණ්ඩලයන්හි අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නිලධාරීන් රැසක් සහභාගී වූහ.



## යුද්ධ හමුදා ධජයන්ට සෙත්පැතීම ශ්‍රී දළදා මාලිගාව අභියසදී

ඔක්තෝබර් මස 10 දිනට යෙදී ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 73 වන සංවත්සර දිනයට සමගාමීව ආශිර්වාද එක් කිරීමේ සහ ධජයන්ට සෙත් පැතීමේ තෙවන ආගමික උත්සවය ඉකුත් සැප්තැම්බර් 28 වන දින ඓතිහාසික මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී පැවැත්විණි. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම ආගමික වතාවත්වලට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සමඟින් ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති, 11 වන සේනාංකයේ සේනාංකාධිපති, විධායක ජෙනරාල්, පිරිස් පාලන අධ්‍යක්ෂක ඇතුළු පිරිසක් ද සහභාගී වූහ. මෙහිදී, යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී දළදා මාලිගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා පිළිගන්වනු ලැබූ මූල්‍ය පරිත්‍යාගය ගන්ධ කුටියේ ආගමික වතාවත් පැවැත් වූ අස්ගිරි පාර්ශ්වයේ අනුනායක පූජ්‍ය වෙඩරුවේ උපාලි හිමිපාණන් විසින් පිළිගනු ලැබීය. මෙම ආගමික උත්සවයේ සියලු කටයුතු සහ එහි දෙවන අදියර මහනුවර, පල්ලෙකැලේ පිහිටි 11 වන සේනාංකයේ සේනාංකාධිපතිගේ අධීක්ෂණය යටතේ එම සේනාංක මූලස්ථානය විසින් සංවිධානය කරනු ලැබීය.







# යුද්ධ හමුදා සංවත්සරයට සර්ව ආගමික ආශිර්වාද

රටේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදාව විසින් සිදුකරන ලද අපරිමිත මෙහෙය අගයමින් 73 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව ආශිර්වාද වැඩසටහන් මාලාවක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම අවස්ථාවන් සඳහා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අනෙකුත් නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.




බොරැල්ල, සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානයේදී පැවැති ආශීර්වාද දේවමෙහෙය




කොළඹ 06 මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිලේ දී පැවති හින්දු "ආශීර්වාද" පූජාව




කොල්ලුපිටිය ජුම්මා ඉස්ලාම් පල්ලියේදී සිදුකළ ආගමික වතාවත්

# යුද්ධ හමුදාධිපති මධ්‍යම ආරක්ෂක සේනා මූලස්ථානයේ ප්‍රථම නිල සංචාරයට එක්වේ


ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය සැප්තැම්බර් 29 වන දින දියතලාව ප්‍රදේශයේ ස්ථාපිත එම ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක නිරත විය. ආරක්ෂක සේනා මූලස්ථාන පරිශ්‍රය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා පුහුණු පාසල් සරඹ භූමියේදී භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනැමුණ.



එහිදී, යුද්ධ හමුදාධිපති විසින් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ ස්ථාපිත සියලුම සේනාංක, බලසේනා සහ ඒකකයන්හි සේවයේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයන් අමතමින් කැපවීමෙන් රාජකාරි ඉටුකිරීමේ වැදගත්කම, වෘත්තීය දැනුම නිරන්තරයෙන් වැඩිදියුණු කරගැනීමේ අවශ්‍යතාවය, ස්වයං විනය ඉහළ මට්ටමකින් පවත්වාගැනීමේ වැදගත්කම සහ යුද්ධ හමුදාව මගින් ක්‍රියාත්මක කරනු ලබන හරිත කෘෂිකාර්මික වැඩසටහන ආදී වූ කරුණු පිළිබඳව අවධාරණය කරන ලදී. මෙම සංචාරය සඳහා 11, 12 වන සේනාංකයන්හි සේනාංකාධිපතිවරුන්, ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම), බලසේනාධිපතිවරු, අණදෙන නිලධාරීන්, නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද එක්වූහ.









# අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික සහ ප්‍රායෝගික රයිෆල් වෙඩි තැබීමේ තරඟාවලිය - 2022



යුද්ධ හමුදා සුළු අවි සංගමය සහ "ස්නයිපර්වරුන්ගේ නිවහන" ලෙස වඩාත් ප්‍රචලිත දියතලාවේ පිහිටා ඇති යුද්ධ හමුදා ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසල සමගින් එක්ව පවත්වනු ලැබූ "අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික සහ ප්‍රායෝගික රයිෆල් වෙඩි තැබීමේ තරඟාවලිය - 2022" පසුගිය සැප්තැම්බර් 30 වන දින අවසන් විය. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා සුළු අවි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

රයිෆල් වෙඩි තැබීමේ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සෑම වර්ෂයකටම වරක් මෙම අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික සහ ප්‍රායෝගික රයිෆල් වෙඩි තැබීමේ තරඟාවලිය පවත්වනු ලබයි. මෙම වසරේදීද පැවැත්වූ එම තරඟාවලිය සඳහා විවෘත, සේවා රෙජිමේන්තු සහ නවක යන කාණ්ඩ ත්‍රිත්වය යටතේ යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් වෙඩික්කරුවන් 400 කට වැඩි පිරිසක් සහභාගී වූහ.



මෙහිදී, විවෘත කාණ්ඩයේ ශූරතාවය ගැමුණු හේවා බලකායත්, දෙවන ස්ථානය ගජබා රෙජිමේන්තුවත්, තෙවන ස්ථානය කමාන්ඩෝ රෙජිමේන්තුවත් හිමිකර ගත්හ. තවද, ආධුනික කාණ්ඩයේ ශූරතාවය ගැමුණු හේවා බලකායත්, දෙවන ස්ථානය ගජබා රෙජිමේන්තුවත්, තෙවන ස්ථානය කමාන්ඩෝ රෙජිමේන්තුවත් දිනාගැනීමට සමත් වූහ.

සේවා රෙජිමේන්තු කාණ්ඩයේ ශූරතාවය යුද්ධ හමුදා සේවා බලකායත්, දෙවන ස්ථානය යුද්ධ හමුදා පොලිස් හේවා බලකායත්, තෙවන ස්ථානය යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායත් දිනාගනු ලැබීය. තරඟාවලියේ දක්ෂතම වෙඩික්කරු (විවෘත කාණ්ඩය) - බලලත් නිලධාරී 1 ඩබ්ලිව්පීඑන් ධම්මික (ගැමුණු හේවා බලකාය), දක්ෂතම වෙඩික්කරු (නවක කාණ්ඩය) - සාමාන්‍ය සෙබළ ජයසිංහ ඩබ්ලිව්ජීයූඑල් (ගජබා රෙජිමේන්තුව), දක්ෂතම වෙඩික්කරු (සේවා රෙජිමේන්තු කාණ්ඩය) - මාණ්ඩලික සැරයන් ප්‍රියන්ත කුමාර ජීජී (යුද්ධ හමුදා සේවා බලකාය) විසින් හිමිකරගන්නා ලදී.

ප්‍රායෝගික වෙඩි තැබීමේ අංශයෙන් බ්‍රිගේඩියර් සහ මේජර් ජෙනරාල් කාණ්ඩය යටතේ හිමි කුසලාන සහ සහතිකපත් යුද්ධ හමුදා සන්නාහ සන්නද්ධ බලකායේ බ්‍රිගේඩියර් ඩබ්ලිව්පී කාරියවසම් විසින් දිනාගනු ලැබීය. එහිදී, එම කාණ්ඩය යටතේ දක්ෂතම වෙඩික්කරුට හිමි කුසලානය සහ සහතිකපත ගැමුණු හේවා බලකායේ බ්‍රිගේඩියර් කේඑම්වී කොඩිතුවක්කු විසින් හිමිකර ගන්නා ලදී. ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, යුද්ධ හමුදා ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්එස්ජීබී ජයමහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# බිම් බෝම්බ ඉවත් කිරීමේ ප්‍රථම කාන්තා කණ්ඩායම ක්‍රියාන්විත සඳහා සූදානම්









ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාන්විතයන් සඳහා නව පරිච්ඡේදයක් එක් කරමින් යුද්ධ හමුදාව වෙතින් පවත්වනු ලැබූ ජාත්‍යන්තරව පිළිගත් මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ උසස් ප්‍රමිතීන්ගෙන් සමන්විත පාඨමාලාව පසුගියදා නිමාවට පත්විය. එහිදී, අදාළ පාඨමාලාව හැදෑරූ කාන්තා නිලධාරිනියන් සහ කාන්තා සෙබළියන් 54 දෙනකුගෙන් සමන්විත ප්‍රථම කණ්ඩායම වෙත පසුගිය සැප්තැම්බර් 08 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ප්‍රවීණතා සහතික පත්‍ර පිරිනමනු ලැබීය.

මෙම පාඨමාලාවේ පළමු අදියර 2021 දෙසැම්බර් මස 30 වන දින ආරම්භ වූ අතර, බූ ඔය ඉංජිනේරු බලසේනා මූලස්ථානයේදී එය මාස හයක් පුරාවට පැවැත්විණ. එමෙන්ම, ක්ෂේත්‍ර පුහුණුව සමග එහි දෙවන අදියර 2022 ජූනි මස 6 දින ආරම්භ වූ අතර, එය යාපනය, මයිලඩි ප්‍රදේශයේ පිහිටි 10 වන ක්ෂේත්‍ර ඉංජිනේරු බලකා මූලස්ථානයේදී පවත්වන ලදී. මෙම පාඨමාලාවන් යුද්ධ හමුදා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ අධීක්ෂණය මත පැවැත්විණි.

කණ්ඩායම් දෙකකින් සමන්විත මෙම බිම්බෝම්බ ඉවත් කරන්නන්ගෙන් පළමු කණ්ඩායම ශ්‍රී ලංකාවේ මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ රාජකාරීන් සඳහා අනුයුක්ත කිරීමට අපේක්ෂා කෙරේ. එසේම, එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී යටතේ බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාන්විත සඳහා ඔවුන් යෙදවීමේ හැකියාවද ලැබේ.

යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ද සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට එක්වූහ.

# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාධි පාඨමාලාවේ නිල ලාංඡනය යුද්ධ හමුදාධිපති වෙත පිරිනැමේ



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාධි පාඨමාලාවේ උපාධිධාරීන් සඳහා නිර්මාණය කරන ලද නිල ලාංඡනය එම විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් කේපීඩීඑ කරුණාසේකර (විශ්‍රාමික) විසින් ඉකුත් සැප්තැම්බර් 16 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවී සංකේතාත්මකව පළඳවන ලදී.

එම පාඨමාලාවේ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය සන්නද්ධ හමුදා සේනාධිනායක ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය සැප්තැම්බර් 14 වන දින පැවැත්වුණු අතර, එහිදී පාඨමාලාව සම්පූර්ණ කරමින් උපාධිය ලබාගත් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ නිලධාරීන් 31 දෙනකු වෙත නිල ලාංඡන පළඳවන ලදී.

එහිදී, ජාතික ආරක්ෂක විද්‍යාලයේ මෙරට පවත්වන උපාධි පාඨමාලාවට අයත් විෂයමාලාව පිළිබඳව යුද්ධ හමුදාධිපති විසින් ඇගයීමට ලක්කරනු ලැබීය. යුද්ධ හමුදාධිපති විසින්ද කලකට ඉහතදී විදේශ පාඨමාලාවක් වශයෙන් මෙම උපාධි පාඨමාලාව හදාරා ඇත.

# කමාන්ඩෝ සාමාජිකයින් 12 දෙනකුගේ සේවය ඇගයේ





මාතෘභූමියේ සුපරීක්ෂාකාරී ආරක්ෂකයින් වන කමාන්ඩෝ භටපිරිස් මව්බිම වෙනුවෙන් සිදුකරනු ලබන අසමසම සහ නිර්භීත කාර්යභාරය ඇගයීමට ලක්කරමින් කළුතර ප්‍රදේශයේ පරිත්‍යාගශීලී පවුලක සාමාජිකයින් විසින් පර්චස් 148 ක ප්‍රමාණයකින් යුත් ඉඩමක් කමාන්ඩෝ රෙජිමේන්තුවේ අවශ්‍යතා සහිත භටපිරිස් වෙත බෙදාදීම සඳහා පරිත්‍යාග කරන ලදී. ලංකා බැංකුවේ හිටපු ප්‍රධාන නීති නිලධාරිනී නීතිඥ ගයා ජයසිංහ මහත්මිය, විශේෂඥ වෛද්‍ය ඔකාවාස් චන්ද්‍රභානු ද අල්විස් මහතා සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පදිංචිව සිටින විද්වත් පර්යේෂක පුෂ්පා වීරසිංහ මහත්මිය යන එකම පවුලේ දානපතියන් විසින් කළුතර, පයාගල ප්‍රදේශයේ පිහිටි ඔවුන්ගේ පියාගෙන් සහ මුතුන් මිත්තන්ගෙන් ලද රුපියල් මිලියන 30 කට අධික වටිනාකමකින් යුත් මෙම ඉඩම කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථානයේ සේවයේ නියුතු නිලධාරියකුට, කමාන්ඩෝ භටයින් 10 දෙනකුට සහ සිවිල් සේවක මහතකු වෙත බෙදාදීම සඳහා කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත පරිත්‍යාග කරනු ලැබූහ.

මෙම ඉඩමේ කොටස් කරන ලද ඔප්පු 12 ක් ප්‍රතිලාභීන් වෙත බෙදාදීම ඉකුත් සැප්තැම්බර් 27 වන දින පෙරවරුවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරුණු අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. ලංකා බැංකුවේ ප්‍රධාන නීති නිලධාරිනී ලෙස සේවය කරන කාලයේදී නිර්භීත යුද්ධ හමුදා සාමාජිකයින් වෙත ඔවුන් සතු ඉඩම් පරිත්‍යාග කිරීමේ උදාර අරමුණ 2019 වසරේදී ගයා ජයසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කරනු ලැබූ අතර එවකට ලංකා බැංකුවේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ලෙස කටයුතු කළ කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් බ්‍රිගේඩියර් ලලන්ත ගමගේ (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණය මත කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථානය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය. කෙසේ වෙතත්, රට තුළ පැවති අනපේක්ෂිත තත්ත්වයන් සහ කොවිඩ් - 19 වසංගතය පැතිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය මේ වනතෙක් සිදුකිරීමට නොහැකිව පැවතිණි.

වැඩසටහන සමාප්තියේ කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මෙන්ම 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයු ඥානරත්න එන්ඩියූ පීඑස්සී විසින් මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් කටයුතු කරනු ලබන රණවිරුවන් කෙරෙහි දක්වනු ලැබූ කරුණාවන්තබව සහ ත්‍යාගශීලීත්වය වෙනුවෙන් පරිත්‍යාගශීලීන් වෙත කමාන්ඩෝ රෙජිමේන්තුවේ සහ යුද්ධ හමුදාවේ කෘතඥතාව පුදකළේය.



# ලෝක ළමා දිනයට සමගාමීව පාසල් උපකරණ බෙදාදෙමින්




නිදහස් නිවහල් රටක් ගොඩනගන්නට ප්‍රාණදානය හා කාය දානය ලබාදුන් රණවිරු දූ පුතුන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමේ අරමුණින් ලෝක ළමා දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව රුපියල් ලක්ෂ 12 ක පමණ වටිනාකමකින් යුත් පාසල් උපකරණ, ජාත්‍යන්තර දිස්ත්‍රික් 306 සී 1 සිංහ දිස්ත්‍රික්කය යටතේ ඇති කොළඹ ප්ලැටිනම් සිංහ සමාජය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත ලබාදුන් අතර, එම පාසල් උපකරණ ප්‍රදානය කිරීමේ වැඩසටහනක් සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ජානකී ලියනගේ මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් පසුගිය සැප්තැම්බර් 26 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි.

රට තුළ පවතින සෞඛ්‍යමය වාතාවරණය මත ඉහත පාසල් උපකරණ ප්‍රදානෝත්සවය සඳහා සංකේතාත්මකව සියලු රෙජිමේන්තු ආවරණය වන පරිදි පාසල් දූවා දරුවන් 25 දෙනකු පමණක් සහභාගී වූහ. පාසල් උපකරණ ප්‍රදානය කිරීමේ අවස්ථාවට ජාත්‍යන්තර දිස්ත්‍රික් 306 සී 1 සිංහ දිස්ත්‍රික්කයේ සිංහාධිපති සිංහ ගාමිණී කුමාරසිංහ MJF MAF JP ජාත්‍යන්තර දිස්ත්‍රික් 306 සී 1 සිංහ දිස්ත්‍රික්කයේ සිංහ කාන්තා සංසදයේ සභාපතිනි ප්‍රධාන සිංහ කාන්තා නිල්මිණී කුමාරසිංහ සහ කොළඹ ප්ලැටිනම් සිංහ සමාජයේ සභාපති සිංහ නිපුන කුලරත්න ඇතුළු සිංහ සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ සුරතින් සිදුකෙරිණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද මෙම අවස්ථාවට එක්වෙමින් සිංහ සමාජය වෙත විශේෂ ස්තුතියක්ද පුදකරනු ලැබීය.



# "ආර්ය" පදනමේ ව්‍යාපෘතීන් පිළිබඳව යුද්ධ හමුදාධිපති දැනුවත් කෙරේ



යුද්ධ හමුදාවේ සේවයේ නියුතු රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් සමාජ සුභසාධන කටයුතුවල නිරත සංවිධානයක් වන "ආර්ය" පදනමේ සාමාජිකයින් පසුගිය සැප්තැම්බර් 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ. එහිදී, එම සාමාජිකයින් විසින් තම සංවිධානයේ කාර්යභාරය, දැනට සිදුකර ඇති සහ ඉදිරියේදී සිදුකිරීමට නියමිත සුභසාධන ව්‍යාපෘතීන් පිළිබඳව යුද්ධ හමුදාධිපති දැනුවත් කරන ලදී.

මෙම අවස්ථාවට ආර්ය පදනමේ සභාපති චරිත් කිරිඇල්ල, ලේකම් ශමේන්ද්‍ර වික්‍රමාරච්චි, එහි ජ්‍යෙෂ්ඨ උපදේශක වෛද්‍ය සමාධි රාජපක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් වන වෛද්‍ය ලලිත් බණ්ඩාර, විශාරද ජගත් වික්‍රමසිංහ ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# පුස්තකාල පුහුණු හා ග්‍රන්ථ සංරක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥයකුගේ සහාය යුද්ධ හමුදාවට




පුස්තකාල පුහුණු හා ග්‍රන්ථ සංරක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥයකු වන කලණ චන්දිමාල් වීරතුංග වාකිස්ට මහතා විසින් යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත කිරීමට යෝජිත පුස්තකාලය සඳහා බෞද්ධ දර්ශනය ඇතුළත් ග්‍රන්ථ කට්ටල 18 ක් (ග්‍රන්ථ 508 ක්) පසුගිය සැප්තැම්බර් 16 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී ප්‍රදානය කරන ලදී.

රටේ සංවර්ධනය සඳහා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන කාර්යභාරය අගය කරමින් යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පරිහරණය සඳහා, පරිත්‍යාගශීලී කලණ චන්දිමාල් වීරතුංග වාකිස්ට මහතා විසින් 2009 වර්ෂයේ සිට දිවයින පුරා ස්ථාපිත යුද්ධ හමුදා පුස්තකාල සියයකට අධික ප්‍රමාණයක් සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාළව මෙලෙස ග්‍රන්ථ ප්‍රදානය කර ඇත.

ඔහු විසින් ප්‍රධාන වශයෙන්, දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පුස්තකාලය, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ පුස්තකාලය, යාන්ත්‍රික පාබල රෙජිමේන්තු පුස්තකාලය සහ මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලේ පුස්තකාලය සඳහා එලෙස ග්‍රන්ථ පරිත්‍යාග කොට ඇත. මෙම අවස්ථාවට අධ්‍යක්ෂ පුහුණු බ්‍රිගේඩියර් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී ද සහභාගී විය.

# ගජබා රෙජිමේන්තුවේ ප්‍රවීණයකුගෙන් යුද්ධ හමුදාධිපතිට සුභපැතුම්



ගජබා රෙජිමේන්තුවේ ප්‍රවීණ සාමාජිකයකු වන බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩීඑම් වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී (විශ්‍රාමික) ඉකුත් සැප්තැම්බර් 22 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. එහිදී ඔවුන් විසින් යුද්ධ හමුදාවේ සහ ගජබා රෙජිමේන්තුවේ ඉදිරි ප්‍රගතිය සඳහා වැදගත්වන කරුණු රැසක් පිළිබඳව සුහදව අදහස් හුවමාරු කරගන්නා ලදී.

# එතෙර කෙළිබිම දිනූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට දිරි දෙමින්



ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර ක්‍රීඩා පිටියේ කැපී පෙනෙන දක්ෂතා දැක්වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් අගයමින් ඔවුන්ගේ ක්‍රීඩා හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් මූල්‍යමය දිරි දීමනා සහ සුබපැතුම් පිරිනැමීම ඉකුත් සැප්තැම්බර් 20 වන දින පෙරවරුවේ සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා "ආසියානු කුසලාන ශූරතාව - 2022" ජයග්‍රහණය කළ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයකු වන යුද්ධ හමුදා ක්‍රිකට් ක්‍රීඩක සැරයන් තීක්ෂණ එම්එම්, "ආසියානු දැල්පන්දු ශූරතාව - 2022" ජයග්‍රහණය කළ ශ්‍රී ලංකා ජාතික දැල්පන්දු කණ්ඩායමේ කෝප්‍රල් අල්ගම ටීටී, කෝප්‍රල් ද සිල්වා කේබීවයි, කෝප්‍රල් පෙරේරා එම්ඒඅයිජේ සහ "ආසියානු කායවර්ධන ශූරතාවලිය - 2022" හි ලෝකඩ පදක්කම දිනාගත් කායවර්ධන ක්‍රීඩක කෝප්‍රල් රාජපක්ෂ ආර්ඒඩීපී ද සහභාගී වූහ.

එම අවස්ථාවේදී, යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ ඊළඟ නිලයට උසස්වීම් ලබාදෙනු ලැබීය. ඒ අනුව, සාමාන්‍ය සෙබළ තීක්ෂණ එම්එම් සැරයන් නිලයටත්, සාමාන්‍ය සෙබළ අල්ගම ටීටී කෝප්‍රල් නිලයටත්, සාමාන්‍ය සෙබළ ද සිල්වා කේබීවයි කෝප්‍රල් නිලයටත් සහ සාමාන්‍ය සෙබළ පෙරේරා එම්ඒඅයිජේ කෝප්‍රල් නිලයටත් උසස් කරනු ලැබීය. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා ආඥාපති (මුලතිව්) මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ යූඑස්පී එන්ඩියූ, අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී සහ යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ද එක්වූහ.

# ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ 78 වන සංවත්සරය අභිමානවත් අයුරින් සැමරේ





ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ 78 වන සංවත්සරය ඉකුත් සැප්තැම්බර් 04 වන දිනට යෙදී තිබුණි. "අත්තිඩිය ඊගල්ස් ලේක්සයිඩ්" සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති එම සංවත්සර සැමරුම් උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගී වූ අතර, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න සහ හිටපු ත්‍රිවිධ හමුදාධිපතිවරුන් කිහිපදෙනකු ද මෙම අවස්ථාවට එක්වූහ.

උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ සාමාජිකයින් කිහිපදෙනකු වෙත ගෞරවාන්විත සේවා පදක්කම ප්‍රදානය කිරීමද නවත් විශ්‍රාමික සාමාජිකයින් කිහිපදෙනකු වෙත යාවජීව සාමාජිකත්වය පිරිනැමීමද මෙම උත්සව අවස්ථාවට සුවිශේෂීත්වයක් එක්කරන ලදි.

උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමයේ ලේකම් ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය (විශ්‍රාමික) විසින් ස්තුති කථාව සිදුකරනු ලැබීය. මෙම සංවත්සර සැමරුම් උත්සවයට හිටපු ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයින් විශාල පිරිසක් සහභාගී වූහ. වර්ෂ 1944 දී ස්ථාපිත කරනු ලැබූ ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමය මේ වනවිට දිවයින පුරා ව්‍යාප්ත සන්නද්ධ හමුදා සංගම් 48 ක් ඒකාබද්ධව ත්‍රිවිධ හමුදා සාමාජිකයින් 45,000 කින් පමණ සමන්විත වේ.

# රන් අස්වනු නෙලීමේ මංගල්‍යය


ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානය අසල අක්කර 12 ක අස්වැද්දූ කුඹුරු යායේ "රන් අස්වනු නෙලීමේ මංගල්‍යය" ඉකුත් සැප්තැම්බර් 16 වන දින සම්ප්‍රදායානුකූල චාරිත්‍ර සහ ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු එම "රන් අස්වනු" නෙලීමේ මංගල්‍යයේදී යුද්ධ හමුදාධිපති සමගින් යුද්ධ හමුදා සාමාජිකයන් පිරිසක් සංකේතාත්මකව මෙම කන්නයේ ප්‍රථම වී අස්වැන්න නෙලීම සිදුකරනු ලැබූහ.

අදියර තුනක් යටතේ සිදුකරන එම සමස්ත ව්‍යාපෘතිය යුද්ධ හමුදා මූලස්ථානයේ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව මගින් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් මත එම බලකායේ හටපිරිස්වල ශ්‍රම දායකත්වයෙන් සිදුකරන ලදී. මෙම කටයුත්ත සාර්ථකව සිදුකිරීමට යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී සහ යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඒකේ රාජපක්ෂ ආර්එස්පී දායකත්වය ලබා දුන්හ.

අස්වනු නෙලීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.







# විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය එළිදකී

යුද්ධ හමුදා විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය ලෙස *http://alt.army.lk/doo/* වෙබ් අඩවිය එළිදැක්වීම ඉකුත් සැප්තැම්බර් 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ හමුදාධිපති ලේකම් කාර්යාලයේ පැවති කෙටි උත්සවයකදී සිදු කෙරිණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් මෙම නව වෙබ් අඩවිය විවෘත කරන ලද අතර, එම අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, අධ්‍යක්ෂ විදේශ මෙහෙයුම් සහ යුද්ධ හමුදා මූලස්ථානයේ සමස්ත ආරක්ෂක සම්බන්ධීකාරක මේජර් ජෙනරාල් ආර්ඒඩීඑස් ශාන්ත රණවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් කිහිපදෙනකු සහභාගී වූහ.




මෙම නව වෙබ් අඩවිය මගින් මෙරට එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී ඉතිහාසය, ආයතන ව්‍යුහය, පුහුණුවීම් පිළිබඳ විස්තර සහ එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරියෙහි නියුතු කණ්ඩායම්වල අපේක්ෂිත ඉදිරි වැඩසටහන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

# අභිමන් ගමනකට උණුසුම් සුභ පැතුම්







මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනකු වෙත නිල ලාංඡන පැළඳවීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් පසුගියදා සිදුකෙරිණ. විශේෂ බලකායේ මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, කොළඹ 3 පිහිටි ජාතික ආරක්ෂක විද්‍යාලයේ ජාතික ආරක්ෂාව හා උපාය මාර්ගික අධ්‍යයන පාඨමාලා අංක 1 හදාරනු ලබන මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ යුද්ධ හමුදා මූලස්ථානයේ සමස්ත ආරක්ෂක සම්බන්ධීකාරක ධූරය හොබවන උසස්වීම් ලැබූ ගජබා රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් ආර්ඒඩීඑස් ශාන්ත රණවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එලෙස උසස්වීම් ලැබූ නිලධාරීහු වූහ.

# ගජබා රෙජිමේන්තුවට නව නිවාඩු නිකේතනයක් සඳහා මුල්ගල් තැබේ





යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හි සිදුකරන ලද සංචාරය අතරතුර, පසුගිය සැප්තැම්බර් 30 වන දින දියතලාව ප්‍රදේශයේ ඉදිකිරීමට නියමිත ගජබා රෙජිමේන්තුවේ නව නිවාඩු නිකේතනය සඳහා මුල්ගලතැබීමටද එක්විය. එම අවස්ථාවට 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුළු පිරිසක් එක්වූ අතර, ගජබා රෙජිමේන්තු සියලු නිලයින්ගේ ප්‍රයෝජනය උදෙසා මෙම නිවාඩු නිකේතනය ඉදිකිරීමට නියමිතය.

# ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශකයින් යුද්ධ හමුදාධිපති හමුවෙති



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් විකාස් සූඩ් (Captain Vikas Sood) සහ සහකාර ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් පුනීත් සුෂිල් (Lieutenant Colonel Puneet Sushil) පසුගිය සැප්තැම්බර් 29 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය. මෙම සුහද හමුවේදී දෙරට අතර ද්විපාර්ශ්වීය වශයෙන් වැදගත්වන කරුණු සහ අන්‍යෝන්‍ය වශයෙන් පවතින අවශ්‍යතාවයන් පිළිබඳ අදහස් හුවමාරු කරගනු ලැබීය. තවද, දෙරටේ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීම මෙන්ම අත්දැකීම් හා තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමේ හැකියාව පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

# බංගලාදේශ මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි



මෙරට බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කොමදෝරු එම් ශෆියුල් බාරි (Commodore M Shafiul Bari) පසුගිය සැප්තැම්බර් 06 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම හමුව අතරතුර, යුද්ධ හමුදාධිපති විසින් එම ආරක්ෂක උපදේශක වෙත සිය සුබපැතුම් එක්කරමින් දෙරට අතර ද්විපාර්ශ්වීය වශයෙන් වැදගත්වන කරුණු සහ අන්‍යෝන්‍ය වශයෙන් පවතින අවශ්‍යතාවයන් පිළිබඳ අදහස් හුවමාරු කරගන්නා ලදී. තවද, දෙරටේ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් තවදුරටත් වර්ධනය කිරීම මෙන්ම අත්දැකීම් හා තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමේ හැකියාව පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරී කණ්ඩායමට යුද්ධ හමුදාධිපතිගෙන් සුබපැතුම්



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ පුහුණුව ලබන ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ශිෂ්‍ය නිලධාරීන් 31 දෙනකුගෙන් සමන්විත පළමු කණ්ඩායම පසුගිය සැප්තැම්බර් 06 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් ඔවුන් වෙත සිය සුබපැතුම් එක්කරමින් සංකේතාත්මකව සිහිවටන පිරිනැමීමද කටයුතු කළ අතර, එදින රාත්‍රී එම ශිෂ්‍ය නිලධාරීන් හා උපදේශක මණ්ඩලය වෙත භෝජන සංග්‍රහයක්ද පිරිනමන ලදී.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමගින් ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර (විශ්‍රාමික) සහ ධනංජනී කරුණාසේකර මහත්මියද එක්වූහ.



# යුද්ධ හමුදාධිපති අනුරාධපුර "අභිමංසල - 1" හි සංචාරයක





අනුරාධපුර ශ්‍රී මහා බෝ සමිඳුන් අභියසදී 73 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව පැවති ආශිර්වාද පූජාවෙන් අනතුරුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ අනුරාධපුර "අභිමංසල - 1" හි රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා සංචාරයක නිරත විය.

එහිදී, සෑම රණවිරුවකු වෙතම අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අඩංගු ත්‍යාග පාර්සල් පිරිනැමූ යුද්ධ හමුදාධිපති එම රණවිරුවන් සමග දිවා භෝජන සංග්‍රහයකට ද එක්විය. මෙම සංචාරය සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක, අභිමංසල - 1 සුවතා නිකේතනයේ සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් එක්වූහ.

# අභාවප්‍රාප්ත මේජර් උෂාන් වික්‍රමසිංහ වෙත අවසන් ගෞරව





ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පාඨමාලා අංක 28 යටතේ කෙඩෙට් නිලධාරියකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක් වූ ගජබා රෙජිමේන්තුවේ මේජර් උෂාන් වීරසිංහ (විශ්‍රාමික) ගේ දේහය පිළිබඳ අවසන් කටයුතු ඉකුත් සැප්තැම්බර් 08 වන දින පස්වරුවේ නැදිමාල "නිසල අරණ" සුසාන භූමියේදී පූර්ණ හමුදා ගෞරවාචාර මධ්‍යයේ සිදුකෙරිණි. පෑපිලියාන, විහාර මාවතේ පිහිටි එම නිලධාරීගේ නිවසට පැමිණි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එම දේහයට පුෂ්පෝපහාර පුදකර අවසන් ගෞරව දැක්විය. මේජර් උෂාන් වීරසිංහ (විශ්‍රාමික) ගේ පවුලේ සාමාජිකයින් සමගින් අදහස් හුවමාරු කරගත් යුද්ධ හමුදාධිපති වන්නි මෙහෙයුමේදී එම නිලධාරී සිදුකළ කැපවීම සහ රණශූරත්වය පිළිබඳ සිහිපත් කළේය. මානුෂීය මෙහෙයුම් සාර්ථකව අවසන් කිරීමට නිර්භීතව සිය දායකත්වය දැක්වූ 1 වන ගජබා රෙජිමේන්තුවේ කීර්තිමත් රණවිරුවකු වූ මේජර් උෂාන් වීරසිංහ (විශ්‍රාමික) මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් සිදුකරනු ලැබූ අමිල සේවය පැසසුමට ලක්කරමින් එතුමන් වෙත රණ ශූර පදක්කම සහ දේශපුත්‍ර පදක්කම ඇතුළු තවත් පදක්කම් රැසක් පිරිනමා ඇත.

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවෙන් නව නිවාස ව්‍යාපෘතියක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ හටපිරිස් විසින් නිවාස නොමැති තම සහෝදර සාමාජිකයින් හට නව නිවාස පහක් ඉදිකරදීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබූහ. යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ බලකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම මත සිදුකළ මෙම කටයුත්තට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේද නොමඳ සහාය හිමිවිය.

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සහ 4 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ මූලාධාර මත ඉදිකරන ලද එහි එක් නිවසක් ඉකුත් අගෝස්තු 21 වන දින නිකවැරටිය, රස්නායකපුර පදිංචි 4 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයකු වෙත භාරදෙන ලදී. එම නව නිවසේ යතුරු සංකේතාත්මකව ප්‍රදානය කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ බලකාධිපති සහභාගී විය. තවද, යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක, 4 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක්ද ඊට එක්වූහ.

# උපකරණ මාස්ටර් ජෙනරාල් ගේ යාපනය සංචාරය





යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත යාපනය ප්‍රදේශයේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පරිපාලන හා හටනිවාසවල පවතින ගැටළු පිළිබඳ සොයාබැලීමේ අරමුණින් උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර යූඑස්පී ඉකුත් සැප්තැම්බර් 05 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සංචාරයක නිරත වූහ.

මෙම සංචාරයේදී, ඔවුහු ප්‍රථමයෙන් පලාලි යුද්ධ හමුදා මූලික රෝහලේ සංචාරය කරමින් එහි මුළුතැන්ගෙය සහ ශල්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණය කරනු ලැබූහ. ඉන් අනතුරුව, හෙතෙම 55 වන බලසේනා මූලස්ථානය සහ 15 වන (ස්වෙච්ඡා) ගජබා රෙජිමේන්තුවේද සංචාරය කරමින් සෙසුනිලයන්ගේ හටනිවාස, උපකරණ ගබඩා, සලාක ගබඩා සහ මුළුතැන්ගෙයි පරිශ්‍රයන් නිරීක්ෂණය කරනු ලැබූහ. සංචාරයේ දෙවන අදියර ලෙස, 52 වන සේනාංක මූලස්ථානයද ඔවුන්ගේ නිරීක්ෂණයට බඳුන් වූ අතර එහිදී, එම සේනාංක මූලස්ථාන සම්මන්ත්‍රණ ශාලාවේදී හටකාර්ය සම්පාදනය පිළිබඳ සාකච්ඡාවක්ද පැවැත්විණ. ඒ සඳහා ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (උතුර), සියලුම සේනාංකාධිපතිවරු, බ්‍රිගේඩියර් පාලන හා හටකාර්ය සම්පාදන නිලධාරීන්, බලසේනාධිපතිවරු, කර්නල් පාලන හා හටකාර්ය සම්පාදන නිලධාරීන් සහ මාණ්ඩලික නිලධාරීන් ද සහභාගී වූහ.




# දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් වෙනුවෙන් නව නිවසක්

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පුලෝලි - බටහිර පදිංචි ජයරූබන් නන්දිනී යන මහත්මිය වෙනුවෙන් නව නිවසක් ඉදිකිරීම සඳහා ඉකුත් අගෝස්තු 24 වන දින මුල්ගල තබන ලදී.

එම නිවස ඉදිකිරීම සඳහා මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණයෙන් විදේශගතව සිටින ෂීලා එමානුවෙල් යන මහත්මිය විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. 551 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීසීඑ් වික්‍රමසිංහ යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී ගේ අධීක්ෂණය යටතේ එම බලසේනාවේ හටපිරිස් විසින් මෙම නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන්හ. යාපනය අර්ධද්වීපයේ නිවාස නොමැතිව සිටින පවුල් වෙනුවෙන් නිවාස ලබාදීම උදෙසා යුද්ධ හමුදාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා සත්කාරක ව්‍යාපෘතියට සමගාමීව මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

# ඉංග්‍රීසි පාඨමාලාව සාර්ථකව අවසන් කරමින්

සෙසුනිලයන්ගේ භාෂා කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) විසින් සංවිධානය කරන ලද ඉංග්‍රීසි ප්‍රවීණතා පාඨමාලාවක් ඉකුත් අගෝස්තු 18 වන දින අවසන් විය. එම පාඨමාලාවේ සහතිකපත්‍ර ප්‍රදානය කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහභාගී විය. එහිදී, පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස සාමාන්‍ය සෙබළ ද සිල්වා ඒපීඩී තේරී පත්වූ අතර, දෙවන හා තෙවන ස්ථාන පිළිවෙලින් කෝප්‍රල් ජයසිංහ එම්ඒඑන්ඒබී සහ තුවක්කු සෙබළ පනාගොඩ පීඑච්කේ විසින් හිමිකර ගත්හ. මෙම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු රැසක් නියෝජනය කරමින් සෙසුනිලයින් තිස් දෙදෙනකු සහභාගී වූ අතර, එය මසක කාලයක් පුරා පැවැත්විණ.






# යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට මුල්වෙයි

මඩ/මන්මුනේ බටහිර පාවට්කොඩිච්චේනෙ විනායගර් විද්‍යාලයේ විදුහල්පතිතුමන්ගේ ඉල්ලීමකට අනුව 231 වන බලසේනා බලප්‍රදේශයේ පිහිටි 7 වන ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ භටපිරිස් එම විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ ඉදිකිරීම් කටයුතු සඳහා සිය ඉංජිනේරු සහ තාක්ෂණික දැනුම ලබාදුන්හ. මෙම ඉදිකිරීම් කටයුතු ඉකුත් සැප්තැම්බර් 07 වන දින ආරම්භ කළ අතර ඒ සඳහා අවැසි යටිතල පහසුකම් සඳහා එම ප්‍රදේශයේ වැසියන් සිය මූල්‍ය ආධාර ලබාදී තිබුණි.

මෙම ව්‍යාපෘතියේ සමාරම්භක අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, මඩකලපුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අහිලා කනගසූරියම් මහත්මිය, 231 වන බලසේනාවේ බලසේනාධිපති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ආර් මුරුගේෂ් පිල්ලේ මහතා, මඩ/මන්මුනේ බටහිර පාවට්කොඩිච්චේනෙ විනායගර් විද්‍යාලයේ විදුහල්පති එස් පුෂ්පහරන් මහතා, දෙමව්පියන් සහ සිසු සිසුවියන් පිරිසක් ද එක්වූහ.

# යුද්ධ හමුදාවේ සම්බන්ධීකරණයෙන් වියළි සලාක පාර්සල් පරිත්‍යාගයක්

අම්පාර ප්‍රදේශයේ විවිධ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් 2000 ක් අතර වියළි සලාක පාර්සල් බෙදාදීම සහ අවශ්‍යතා සහිත පාසල් සිසු සිසුවියන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලිපි ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු 20 වන දින පැවැත්විණ. නා උයන ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය අගුළුගමුවේ ආරියනන්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් යුතුව, නා උයන බෞද්ධ සංගමයේ කමිටු සාමාජිකයින්ගේ අනුග්‍රාහකත්වය මත ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ ස්ථාපිත 24 වන සේනාංකයේ හටපිරිස් මෙම කටයුත්ත සම්බන්ධීකරණය කරනු ලැබුහ.



ඒ යටතේ පැවති එක් වැඩසටහනක් 24 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් මත 241 වන සහ 242 වන බලසේනාවන්හි සහයෝගය ඇතිව දීඝවාපිය විහාරස්ථාන පරිශ්‍රයේ පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා ආඥාපති (නැගෙනහිර) මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. තවද, දීඝවාපිය සිංහල පාසල් පරිශ්‍රයේද එලෙස පරිත්‍යාග බෙදාදීමේ වැඩසටහනක් පැවති අතර ඒ සඳහා සිංහල, දමිළ සහ මුස්ලිම් යන ජන කොටස්වලට අයත් විවිධ ආර්ථික දුෂ්කරතා සහිත පවුල්වල සාමාජිකයන් සහභාගී වූහ. එම වියළි සලාක පාර්සල් ලබාගැනීමට පැමිණ සිටි ප්‍රතිලාභීන් අතර ගැබිණි කාන්තාවන් 200 ක්ද වූහ. එහිදී, පිරිනමන ලද අධ්‍යාපන උපකරණවල වටිනාකම රුපියල් මිලියන 10 කට වැඩිවූ අතර, රුපියල් 5000.00 බැගින් වූ ලිපි ද්‍රව්‍ය පාර්සල් 400 ක් එහිදී එම දරුවන් අතර බෙදාහැරිණි.



# සිවිල් වැසියන් වෙත වියළි සලාක පරිත්‍යාගයක්





ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති දකුණු පලාතේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා පිරිසකගේ අනුග්‍රාහකත්වය මත මුලතිව්, පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ සිවිල් වැසියන් සහ එම ප්‍රදේශයේ යුද්ධ හමුදා සාමාජිකයන් අතර සංහිඳියාව සහ සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් තවත් ප්‍රජාමූලික වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 12 වන දින මුලතිව් දිස්ත්‍රික්කයේදී පවත්වන ලදී.

ඒ අනුව 682 වන බලසේනාවේ හටපිරිස් විසින් සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක, කඩුගන්නාව පාරමිතා භාවනා මධ්‍යස්ථානාධිපති හා බෙල්ලන්විල රජමහා විහාරයේ විහාරාධිපති ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නාහිමිපාණන්ගේ අනුග්‍රාහකත්වයෙන් සහ කොළඹ රාජකීය විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සහෝදර සංගමයේ ප්‍රධාන අනුශාසක ගවරගිරියේ ප්‍රේමරතන හිමියන්ගේ සම්බන්ධීකරණයෙන් ප්‍රදේශයේ දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන අවශ්‍යතා සහිත සිවිල් වැසියන් වෙනුවෙන් සහල්, පරිප්පු, කුළුබඩු, සබන්, ධාන්‍ය වර්ග, කිරිපිටි ආදී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක පාර්සල් 125 ක් මෙලෙස බෙදා දෙන ලදී. මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට 68 වන සේනාංකයේ සේනාංකාධිපති, 682 වන බලසේනාවේ බලසේනාධිපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ආඥාපතිගේ යුධෝපකරණ බලකා රෙජිමේන්තු සංචාරය





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පසුගිය ඉකුත් සැප්තැම්බර් 12 වන දින දොඹගොඩ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තු මූලස්ථානයේ සංචාරයක නිරත විය. එහිදී ආඥාපති, යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තු මූලස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ජීඒ මුණසිංහ ආර්එස්පී ඒටීඕ ඇතුළු මාණ්ඩලික නිලධාරීන් විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. ඉන් අනතුරුව, පැවති සුහද සාකච්ඡාවේදී යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තුවේ කාර්යභාරය පිළිබඳ මධ්‍යස්ථාන සේනාවිධායක විසින් ආඥාපති දැනුවත් කරන ලදී.

තවද, ආඥාපති විසින් දොඹගොඩ කර්මාන්ත ශාලාවේ ටයර් නැවත පිරවීමේ ඒකකය ඇතුළු එම කඳවුරේ ප්‍රධාන ස්ථාන කිහිපයක් නිරීක්ෂණය කිරීමටද එක්වූ අතර, එහිදී එහි සේවයේ නියුතු භටපිරිස්හි සුවදුක් විමසා බැලීමටද අමතක නොකළේය. එසේම, කඳවුර තුළ පවතින සුභසාධන පහසුකම් සහ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා ගතයුතු පියවරයන් පිළිබඳ ආඥාපති විසින් උපදෙස් ලබාදුන් අතර, එම කඳවුරු පරිශ්‍රයේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා පුහුණු පාසලේද සංචාරයක නිරත විය. තවද, එහිදී එතුමන් එම පුහුණු පාසලේ ක්‍රියාකාරී අංශයන් නිරීක්ෂණය කරමින් භටපිරිස් සමඟ සුහදව අදහස් හුවමාරු කරගැනීමටද කටයුතු කරන ලදී.

# වියළි සලාක පාර්සල් පරිත්‍යාගයක්







කෑගල්ල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ප්‍රධානත්වයෙන්, තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනම සහ Tan Ngak Buay) Kee Meng Lang පදනමේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය, උඩුගොඩ, හෙට්ටිමුල්ල, කොටියාකුඹුර, ගලිගමුව, අරන්දර යන ප්‍රදේශවල ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන අඩු ආදායම් ලාභී පවුල් 300 කට අධික පිරිසකට වියළි සලාක පාර්සල් බෙදාදීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 31 වන දින කෑගල්ල ප්‍රධාන තැපැල් කාර්යාලයේදී සිදු කෙරිණි. 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධතාවයෙන් අවශ්‍යතා සහිත පවුල් තෝරා ගැනීමෙන් පසුව මෙම පරිත්‍යාගයන් සිදුකරන ලදී.

ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත උත්සවය පැවැත්වූ අතර, එහිදී බෙදාදුන් එක් වියළි සලාක පාර්සලයක වටිනාකම රුපියල් 1500.00 ක් විය. 611 වන පාබල බලසේනා මූලස්ථානයේ සහයෝගය ඇතිව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතුන්ගේ සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් අවශ්‍යතා සහිත අඩු ආදායම්ලාභී පවුල් තෝරාගැනීම සිදුකරන ලදී.



# මධ්‍යම ආඥාපති 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සංචාරයක

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් සැප්තැම්බර් මස 6 වන දින 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සංචාරයක නිරත විය. එහිදී, එම බලකායේ අණදෙන නිලධාරී මේජර් ඩීඑච්එස්එල් කුමාරසිරි ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි ආඥාපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර හිමිවිය. අනතුරුව එම ඒකක හටපිරිස්වල පාලන අවශ්‍යතා හා රාජකාරී ස්වභාවය පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.





# 12 වන පාබල සේනාංකාධිපති ඒකක සංචාරයක





12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 06 සහ 07 යන දෙදින 121 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සහ 23 වන ගජබා රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. මෙහිදී, එහි හටපිරිස් ඇමතූ සේනාංකාධිපති එම ඒකක වෙතින් සිදුකරනු ලබන සේවය ඇගයීමට ලක්කළේය. තවද, නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩපවත්වා ගැනීම, රිය අනතුරු වළක්වා ගැනීම, නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ විනය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සහ ඒකක බලප්‍රදේශයන්හි ඕනෑම හදිසි අවස්ථාවයන්ට මුහුණදීම සබැඳිව දැනුවත් කරන ලදී. මෙම අවස්ථාවට 122 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්එන් කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ද සහභාගී විය.

# නව බුදුමැදුරට මුල්ගල තැබේ





ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මගපෙන්වීම යටතේ එම ආරක්ෂක සේනා මූලස්ථානයේ බුද්ධ මන්දිරයක් ඉදිකිරීමට කටයුතු සැලසුම් කරන ලදී. ඒ අනුව ඉකුත් සැප්තැම්බර් 05 වන දිනට යෙදුණු සුබ මොහොතින් එහි මුල්ගල තැබීමේ කටයුතු සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම ආරක්ෂක සේනා මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන පවුල්වලට අතහිත





මැදවච්චිය යකාවැව ප්‍රදේශයේ ජීවත්වන ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන පවුල් 50 ක් සඳහා වියළි ආහාර බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජූලි මස 30 වන දින 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. මෙම ප්‍රජාසත්කාරක වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය කොළඹ සෙන්ට්‍රල් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයේ අධිපති චමින්ද රාජපක්ෂ මහතා ඇතුළු එම පවුලේ සාමාජිකයන් විසින් ලබාදෙනු ලැබූහ. මෙම වැඩසටහන 211 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ අංශය සහ 2(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලදී.

# විරු සෙබළියන් ජීවිතයක් බේරයි



මී පැණි එකතුකිරීම තම ජීවිකාව කරගත් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පදිංචි දමිළ සිවිල් වැසියකු පසුගියදා මී පැණි සොයා කැලෑබද ප්‍රදේශයකට ගොස් තිබිණ. එහිදී, ඔහු අනපේක්ෂිත ලෙස වලසකුගේ දරුණු ප්‍රහාරයකට ලක්ව ඇත. කෙසේ හෝ ඉන් දිවි බේරාගැනීමට සමත්ව ඇති ඔහු ඉතා අසීරුවෙන් ප්‍රදේශයේ වූ 4 වන කාන්තා බලකා කඳවුර සමීපයට පැමිණ තිබිණ. එහිදී, වහා ක්‍රියාත්මක වූ එම බලකායේ නිලධාරිනියන් සහ සෙබළියන් බරපතළ තත්වයේ පසුවූ එම පුද්ගලයාට ක්ෂණික ප්‍රතිකාර ලබාදී ඔහුව කඩිනමින් කිලිනොච්චි මහ රෝහල වෙත යැවීමට කටයුතු කරනු ලැබූහ. අවාසනාවන්ත ලෙස ජීවිතයෙන් සමුගැනීමට වුවද ඉඩ තිබුණු එම පුද්ගලයාගේ දිවි බේරාගැනීමට කාන්තා බලකා සාමාජිකාවන්ගේ එම ක්‍රියා කලාපය නිසැකවම හේතුවිය. එම විරු සෙබළියන්ගේ උතුම් මෙහෙවර හේතුවෙන් එම ඒකකයටත් සමස්ත යුද්ධ හමුදාවටත් අත්කර දුන්නේ මහත් ගෞරවයකි. "රණවිරුවා" හි මෙම සටහන එම විරු සෙබළියන්ට උපහාර පිණිසමය.

# ගිලන් හදට රණවිරු සත්කාරයක්





14 වන පාබල සේනාංකයට අයත් 144 වන පාබල බලසේනාව හා 2(සේව) ශ්‍රී ලංකා පාබල බලඇණියේ හටපිරිස් මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා තැඹිලි වතුර (ගෙඩි 2000 ක්) පරිත්‍යාග කිරීමේ මාහැඟි වැඩසටහනක් පසුගියදා අගෝස්තු 22 වන දින සංවිධානය කරනු ලැබූහ.

14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න අර්ඩබ්ලිව්පී ගේ මූලිකත්වයෙන් 144 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්වී කොඩිතුවක්කු ගේ මගපෙන්වීම යටතේ මෙම කටයුත්ත සිදුවිය. මේ සඳහා 2(සේව) ශ්‍රී ලංකා පාබල බලඇණියේ හටපිරිස් සිය ශ්‍රමදායකත්වය ලබාදුන්හ. එහිදී, තැඹිලි සපයා ගැනීමට ප්‍රදේශවාසීන් විශාල අනුග්‍රහකත්වයක් ලබාදී තිබීම විශේෂත්වයකි.

# විරු දිරියෙන් නව සෙවණක්





මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශයේ කඩවත් රඹෑව, ඇටවීරගොල්ලෑව, මැදවච්චිය යන ලිපිනයෙහි පදිංචි දිළිඳු පවුලක නිසංසලා යන මහත්මිය හට නව නිවසක් ඉදිකරදීම සඳහා 2 (සේව) විජයබාහු පාබල රෙජිමේන්තු හටපිරිස් මැදිහත් වූහ. 211 වන පාබල බලසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ සිදුකළ මෙම සත්කාරයට ඕෂධී හේරත් යන මහත්මිය මූල්‍ය දායකත්වය ලබාදුන්නාය. පසුගිය සැප්තැම්බර් 08 වන දින සුබ මොහොතින් අදාළ නිවස ඉදිකිරීම සඳහා මුල්ගල තැබිණ.

# ඉගෙනුමට අත්වැලක්





681 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු ඒකක බලප්‍රදේශයේ සුගන්ධිපුරම් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සුගන්ධිපුරම් මධ්‍යම පෙරපාසලේ ළමුන් සඳහා දිවා ආහාර වේලක් සහ පෙරපාසල් පොත් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 05 වන දින සිදුකෙරිණ.

# 73 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව ධර්ම දේශනාවක්







73 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව ඉකුත් සැප්තැම්බර් 08 දින පනාගොඩ යුද්ධ හමුදා බෝධිරාජාරාම විහාරස්ථානයේදී බෝධිපූජාවක් සහ ධර්ම දේශනාවක් පැවැත්විණ. මේ සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# පාඨමාලා ජයග්‍රහණ ලබාගනිමින්





යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත යුද්ධ හමුදාවෙහි සාමාන්‍ය සෙබළ. ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවලුන්ගේ පුද්ගලික හා සාමූහික නායකත්ව දැනුම වර්ධනය කර යුද්ධ හමුදා අණපනත් හා නියෝග තුළින් ඔවුන්ගේ බුද්ධි මට්ටම ඉහළ නංවමින් තමා යටතේ සිටින පිරිස කාර්යක්‍ෂමව මෙහෙයවීම සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීම සහ උපදේශන හැකියාව වර්ධනය කිරීම සඳහා සටන් පුහුණු පාසල (අම්පාර) වෙතින් කණිෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව අංක 44 සහ ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව අංක 58 පාඨමාලාවන් ආරම්භ කර ඉකුත් අගෝස්තු 29 වන දින සාර්ථකව අවසන් කරන ලදී.

එම පාඨමාලාවන් සඳහා යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු යටතේ ඇති නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක වෙතින් සිසු සිසුවියන් 103 දෙනකු ද ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව අංක 58 සඳහා සිසු සිසුවියන් 248 දෙනකු ද සහභාගී වූහ. මෙම පාඨමාලාවල අවසන් දේශනය එම පුහුණු පාසලේ අණදෙන නිලධාරී කර්නල් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී විසින් සිදුකරන ලදී. එහිදී, කණිෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාවේ විශිෂ්ට සාමාර්ථයක් ලබාගෙන එහි ප්‍රථම ස්ථානය හිමිකරගැනීමට සෙ/557539 ලා/කෝ සෝමරත්න ටීඒආර්ඩබ්ලිව්එම්එම්බී - 2 කරෙ සමත්වූ අතර, ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාවෙහි විශිෂ්ට සාමාර්ථයක් ලබාගෙන ප්‍රථම ස්ථානය සෙ/2107316 කාසෙ පීරිස් පීඑස්ආර් - 1 ශ්‍රීලයුකාබ හිමිකරගන්නාය.

# රණවිරු සවියෙන් වැව්බැම්ම පිළිසකර කෙරේ





කතරගම, සෙල්ලකතරගම ප්‍රදේශයේ පිහිටි කරවිලේ වැවේ වැව්බැම්ම පසුගිය දිනවල ප්‍රදේශයට ඇදහැළුණු අධික වර්ෂාව හේතුවෙන් දැඩි ලෙස අබලන් විය. එහිදී, 12 වන පාබල සේනාංකාධිපතිගේ උපදෙස් මත වහා ක්‍රියාත්මක වූ 122 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි හටපිරිස් එය ප්‍රතිසංස්කරණය කිරීමට ක්‍රියාකළහ. පසුගිය අගෝස්තු 29 වන දින ගම්වැසියන්ගේද සහය ඇතිව සිදුකළ එම ප්‍රතිසංස්කරණ කටයුතු නිරීක්ෂණය සඳහා 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, වාරිමාර්ග ඉංජිනේරු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# වාහන නඩත්තුව පිළිබඳ වැඩමුළුවක්





රුහුණු විශ්වවිද්‍යාලයේ ඉල්ලීමකට අනුව 61 වන සේනාංකය විසින් එම විශ්වවිද්‍යාලයෙහි උපාධි අපේක්ෂකයින් සඳහා "වාහන ක්‍රියාකරවීම සහ ඒවායේ නඩත්තු කටයුතු" යන මැයෙන් වැඩමුළුවක් ඉකුත් සැප්තැම්බර් 06 වන දින 61 වන පාබල සේනාංක මූලස්ථානයේදී පවත්වනු ලැබූහ. 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් මත බූස්ස කඳවුරේ ක්ෂේත්‍ර වැඩපොළෙහි අණදෙන නිලධාරී සහ එහි තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් කරාපිටිය වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබන උපාධි අපේක්ෂකයින් සඳහා මෙම එක්දින වැඩමුළුව පවත්වන ලද අතර, එහිදී ඔවුනට න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙනු ලැබීය. මෙම වැඩමුළුව සඳහා වෛද්‍ය සිසුන් 22 දෙනකු සහභාගී වූ අතර, වැඩමුළුව අතරතුර උපදේශක කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා සැසියක්ද පැවැත්වූහ.

# වියළි සලාක පරිත්‍යාගයක්



681 වන බලසේනා බලප්‍රදේශයේ පිහිටි 6 වන බලඇණිය ගැමුණු හේවා බලකායේ හටපිරිස් සිය ත්‍යාගශීලීභාවය පෙන්නුම් කරමින් ඉකුත් අගෝස්තු 31 වන දින තෙරාවිල් ප්‍රදේශයේ අවශ්‍යතා සහිත පවුල් පහක් වෙත වියළි සලාක පාර්සල් පරිත්‍යාග කරනු ලැබීය. හටපිරිස්හි මූල්‍ය දායකත්වයෙන් බෙදාදෙනු ලැබූ අතර මෙම වියළි සලාක අතරට සහල්, පරිප්පු, සීනි, කුළුබඩු, ධාන්‍ය වර්ග සහ පිටි ඇතුළත් විය. මෙම ව්‍යාපෘතිය 6 වන බලඇණිය ගැමුණු හේවා බලකායේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ සිදුකෙරිණි.

# ලේ දන්දීමේ වැඩසටහන් රැසක්



12 වන සේනාංකයට අයත් 122 වන බලසේනාව යටතේ සේවයේ නියුතු සාමාජිකයින් 100 දෙනකුට අධික පිරිසක් ඉකුත් සැප්තැම්බර් 09 වන දින ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් සඳහා එක්වූහ. හම්බන්තොට දිස්ත්‍රික් රෝහලේ ලේ බැංකුවේ සම්බන්ධීකරණයෙන් එම රෝහලේ ප්‍රතිකාර ලබන රෝගීන්ගේ ප්‍රතිකාර කටයුතු වෙනුවෙන් මෙම මාහැඟි කටයුත්ත සිදුකෙරිණ. ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මඟපෙන්වීම යටතේ 12 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී, 122 වන බලසේනාවේ බලසේනාධිපති සහ කොළඹ රාජකීය විද්‍යාලයීය රතු කුරුස සංගමය එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

513 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ තෙලිප්පලෙයි රෝහලේ රුධිර පාරවිලයන මධ්‍යස්ථානය සමග සම්බන්ධතාවයෙන් යුතුව ලේ දන්දීමේ වැසටහනක් 2022 අගෝස්තු 20 වන දින තෙලිප්පලෙයි හිදී ක්‍රියාත්මක කෙරිණි. මේ සඳහා 513 වන පාබල බලසේනාව යටතේ ඇති 11 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 16 වන බලඇණි ගැමුණු හේවා බලකායට අයත් සාමාජිකයින් ස්වේච්ඡාවෙන්ම එක්වූහ.





කොළඹ රාජකීය විද්‍යාලයේ රතු කුරුස සමාජය විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් ආරක්ෂක සේනා (බටහිර) බලප්‍රදේශයෙහි සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් ඉකුත් අගෝස්තු 26 වන දින රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් සඳහා එක්වූහ. නාරාහේන්පිට මධ්‍යම රුධිර බැංකුවේ සම්බන්ධීකරණයෙන් රාජකීය විද්‍යාලයේ රතු කුරුස සමාජය විසින් මෙම වැඩසටහන සංවිධානය කර තිබුණි. 14 වන පාබල සේනාංකය සහ ආරක්ෂක සේනා (බටහිර) බලප්‍රදේශයෙහි ස්ථාපිත රෙජිමේන්තු මධ්‍යස්ථානයන්හි සාමාජිකයින් 270 ක පමණ පිරිසක් එලෙස තම රුධිරය පරිත්‍යාග කරමින් මෙම පුණ්‍ය කටයුත්ත සඳහා දායක වූහ.

54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත 543 වන පාබල බලසේනාධිපති ගේ අධීක්ෂණයෙන් ලේ දන්දීමේ වැඩසටහනක් තලෙයිමන්නාරම් දිස්ත්‍රික් රෝහලේදී ඉකුත් සැප්තැම්බර් 03 වන දින පැවැත්විණ. මන්නාරම රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි සිදුකළ මෙම රුධිර පරිත්‍යාගය සඳහා 11 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ සහ 4 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් සෙසුනිලයින් මෙන්ම සිවිල් පුද්ගලයින් රැසක් සහභාගී වූහ.





පූජ්‍ය හෝමාගම සීලවංශ ස්වාමීන් වහන්සේගේ ජන්ම දිනය නිමිත්තෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 11 වන දින පිට්පන හෝමාගම පිහිටි පුරාණ විහාරස්ථානයේදී පැවැත්විණ. ඒ සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ රාජකාරී නියුතු හටපිරිස් විශාල පිරිසක් සහභාගී වූහ.

# "මුලතිව් සටන" හා "යුද සාහිත්‍යය" පිළිබඳ දේශනයක්



59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරිබණ්ඩාර යූඑස්පී ගේ අදහසකට අනුව එම පාබල සේනාංකය හා ඒ යටතේ පාලනය වන පාබල බලසේනා සහ ඒකකයන් හි රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් "යුද සාහිත්‍ය" සහ "මුලතිව් සටන" පිළිබඳ දේශනයක් ඉකුත් සැප්තැම්බර් 09 වන දින 59 වන පාබල සේනාංක දේශන ශාලාවේදී පවත්වනු ලැබීය. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේද සහභාගීත්වයෙන් පැවති එම දේශනය යුද්ධ හමුදා මූලස්ථානයේ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කරන "රණවිරුවා" සඟරාවේ ප්‍රධාන සංස්කාරක ලුතිනන් කර්නල් ඊඒඒ සුජිත් චමින්ද විසින් මෙහෙයවනු ලැබීය.



එම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රමා, 591, 592 වන පාබල බලසේනාධිපතිවරු ඇතුළු හමුදා සාමාජිකයින් 300 ක් පමණ සහභාගී වූහ.

# බුවැලිකඩ හා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී "යුද සාහිත්‍යය" දේශන

බුවැලිකඩ පිහිටි සංඥා පුහුණු පාසලේ සහ වේරහැර පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් "යුද සාහිත්‍ය" පිළිබඳ දේශන දෙකක් ඉකුත් සැප්තැම්බර් 23 සහ 28 යන දෙදින තුළ පවත්වනු ලැබීය. ඒ සඳහා ආරාධිත දේශකයා වශයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් ඊඒඒ සුජිත් චමින්ද සහභාගී විය.



බුවැලිකඩ පිහිටි සංඥා පුහුණු පාසලෙහි පැවති දේශනයෙහි අවස්ථාවක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති දේශනයෙහි අවස්ථාවක්

# ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට මත්ස්‍ය ව්‍යාපෘතියක්





ආලංකුලම්හි පිහිටි 65 වන සේනාංක මූලස්ථානය විසින් එම ප්‍රදේශයේ ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නංවා ඔවුනට අමතර ආදායමක් උපයාදීමේ අරමුණින් වවුනිකුලම්, තෙන්නියන්කුලම් සහ තෙරන්කන්දල් ජලාශවලට මිරිදිය මත්ස්‍ය පැටවුන් 285,000 ක් මුදාහැරීම ඉකුත් අගෝස්තු මස 29 - 30 දිනවලදී සිදුකරන ලදී. කිලිනොච්චිය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහ උතුරු පළාත් සභාවේ මිරිදිය ධීවර ඒකකයේ අනුග්‍රාහකත්වය මේ සඳහා හිමිවිය. 65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මැදිහත්වීමෙන් ප්‍රදේශයේ අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව එම මිරිදිය මත්ස්‍ය පැටවුන් තොගය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. 10 වන හා 17 වන ශ්‍රී ලංකා පාබල හමුදා භටපිරිස් සමග එකතුව 65 වන පාබල සේනාංක මූලස්ථානයේ සිවිල් සම්බන්ධීකරණ කාර්යාලයේ සංවිධානයෙන් මෙම කටයුත්ත සිදුකෙරිණ.

# ලෝක ළමා දිනයට ඇගයුම් උත්සවයක්





11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්තේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි ලෝක ළමා දිනයට සමගාමීව පල්ලේකැලේ පිහිටි විරු කැකුළු පෙරපාසලෙහි ඉගෙනුම ලබන සිඟිති දරුවන් වෙනුවෙන් සංවිධානය කළ ඇගයුම් උත්සවයක් එම පෙරපාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී, ආශා අතාවුද මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම උත්සවයට සිඟිති දරුවන් 158 දෙනකු සහභාගී වූහ.

# වී අස්වැන්න නෙලමින්





යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයක් මත පරිසර හිතකාමී තිරසර හරිත කෘෂිකාර්මික ගොවිතැන යුද්ධ හමුදා කඳවුරු තුළ ව්‍යාප්ත කිරීම අරමුණු කරගනිමින් මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල තුළ අක්කර 02 ක පමණ වගාකරන ලද වී අස්වැන්න නෙලීම පසුගිය සැප්තැම්බර් 17 වන දින එම පුහුණු පාසලේ සේනාවිධායකගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

# සේවාමුක්ත භට සංගමයේ 13 වන වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වේ





විජයබාහු පාබල රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ 13 වන වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් සැප්තැම්බර් 17 දින කුරුණෑගල, බෝයගනේ පිහිටි විජයබාහු පාබල රෙජිමේන්තු මූලස්ථානයේ බහුකාර්ය ශාලාවේදී පැවැත්විණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්එම්යූඑන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සහභාගී විය. එහිදී, විජයබාහු පාබල රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ නව සභාපති ලෙස මේජර් ජෙනරාල් කාවින්ද ගුණවර්ධන (විශ්‍රාමික) පත්කරනු ලැබූ අතර අනතුරුව, එම සේවාමුක්ත භට සංගමය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ සංගමයේ සාමාජිකයින්ගේ ඇගයීමට ලක්වූ අතර, එම සංගමයේ සාමාජිකයින්ට ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට ඇති වැඩසටහන් පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව හිමිවිය. මෙම අවස්ථාව සඳහා විජයබාහු පාබල රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක මෙන්ම එම රෙජිමේන්තුවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් සහ සෙසුනිලයන් 488 දෙනකු එක්ව සිටියහ.

# නායකත්වය සහ අභිප්‍රේරණය පිළිබඳ වැඩමුළුවක්





වාද්දුව දළදාවත්ත පුරාණ මහා විහාරයේ මහානායක ස්වාමීන්දයන් වහන්සේ විසින් කරන ලද ඉල්ලීමකට අනුව එම විහාරස්ථානයේ පාසල් සිසුන් සඳහා නායකත්වය පිළිබඳ වැඩමුළුවක් ඉකුත් සැප්තැම්බර් 12 වන දින පැවැත්විණ. බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ ලුතිනන් කර්නල් කේඒඑන්පීකේ කොඩිතුවක්කු පීඑස්සී විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී. වාද්දුව මධ්‍ය මහා විද්‍යාලය, වාද්දුව බාලිකා විද්‍යාලය, වාද්දුව ශාන්ත මරියා විද්‍යාලය, වේරගම කනිෂ්ඨ විද්‍යාලය සහ පින්වත්ත කනිෂ්ඨ විද්‍යාලය යන පාසල්වල සිසු සිසුවියන් සහ ගුරුවරුන් 30 ක් පමණ මෙම වැඩමුළුවට සහභාගී වූහ. මෙම වැඩමුළුවේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලෙස සමාජයේ හැසිරිය යුතු ආකාරය, සමාජයේ ගෞරවනීය පුද්ගලයකු බවට පත්වන ආකාරය, එකිනෙකාට ගරු කිරීමේ වැදගත්කම සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල වටිනාකම ආදී කරුණු පිළිබඳව සිසුන් දැනුවත් කරන ලදී.

# පෙරියවලයන්කන්ඩු ගම්වාසීන්ට ජල පිරිපහදු යන්ත්‍රයක්



ජල හිඟය හේතුවෙන් පීඩාවිඳින වවුනියාව, පෙරියවලයන්කන්ඩු ප්‍රදේශයේ අවශ්‍යතා සහිත වැසියන් වෙත සහන සැලසීමේ අරමුණින් 15 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් ඉකුත් සැප්තැම්බර් 08 වන දින එම කඳවුරේ ප්‍රධාන දොරටුව අභියස ජල පිරිපහදු යන්ත්‍රයක් ස්ථාපිත කරන ලදී. එම ඒකකයේ අණදෙන නිලධාරී මේජර් ආර්එම්ජේබී රාජපක්ෂ ගේ ඉල්ලීමකට අනුව කුරුණෑගල ප්‍රදේශයේ වෙසෙන ආර්එම් පතිරාජ් මහතා විසින් මෙම ප්‍රජා මූලික ව්‍යාපෘතිය වෙනුවෙන් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. මෙම ජල පිරිපහදු ව්‍යාපෘතිය විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී පීඑස්සී අයිජී සහභාගී විය.












# ලෝක ළමා දිනයේ පොඩ්ඩන්ට තිළිණ

2022 ලෝක ළමා දිනයට සමගාමීව විරු කැකුළු පෙරපාසල - මැනිංටවුන් හි අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් උදෙසා ත්‍යාග පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 30 වන දින පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය එක් වූ අතර, උප සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු සහ මැනිංටවුන් විරු කැකුළු පෙරපාසල භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකා දීපිකා ප්‍රශාන්ති චන්ද්‍රසේන යන මහත්මීන්ද එක්වූහ. එහිදී, සභාපතිනිය විසින් එම දරුවන් හට ප්‍රනීත තේ පානයක්ද, මහජන බැංකු ගිණුම් තැන්පතුවක් සහ මහජන බැංකුව විසින් පරිත්‍යාග කරන ලද පාසල් උපකරණ රැසක් ලබාදීමටද කටයුතු කරනු ලැබුවාය. මෙම අවස්ථාවට මහජන බැංකු ශාඛා කළමණාකාරිනී ඉෂානි වීරසිංහ මහත්මිය සහ ප්‍රාදේශීය කළමණාකරු මාධව කනත්ත හේවගේ මහතා ඇතුළු සේවා වනිතා ඒකක ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරිනියන් රැසක්ද සහභාගී වූහ.

# ජාත්‍යන්තර ලෝක ළමා දිනය නිමිති කරගෙන වැඩසටහන් රැසක්

ලෝක ළමා දිනය නිමිති කොටගෙන යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයට අයත් සියලුම පෙරපාසල්වල දරුදැරියන් විවිධ වැඩසටහන් සිදුකරනු ලබති. එම පෙරපාසල්වල ඉගෙනුම ලබන දූ දරුවන් හට ලබාදීමට එස්කේටීසීඑම් ආයතනය (SKTCM Distributors) විසින් රුපියල් ලක්ෂ 8 ක වටිනාකමකින් යුත් චොක්ලට් සහ රුපියල් ලක්ෂ 85 ක වටිනාකමකින් යුත් සම්පූර්ණ යොදය සහිත පියෝඩිල් කිරිපිටි පැකට් තොගයක් පිරිනමන ලදී. එම පරිත්‍යාග යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජනකී ලියනගේ මහත්මිය වෙත පසුගිය සැප්තැම්බර් 28 වන දින එතුමියගේ කාර්යාල පරිශ්‍රයේදී භාරදෙන ලද්දේ එම ආයතනයේ කළමනාකරු සම්පත් පෙරේරා මහතාගේ පුරතිනි. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) කර්නල් නලින්ද මහවිතාන ගේ සම්බන්ධීකරණයෙන් එම මාහැඟි කටයුත්ත සිදුවූ අතර, එහි වටිනාකම රුපියල් මිලියන 1.7 කට ආසන්නය.



# සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රයේ සංචාරයක





රණවිරුවන්ගේ විශේෂ අවශ්‍යතා සහිතව අධ්‍යාපනය හදාරනු ලබන දරුවන්ගේ කායික සහ මානසික සුවදුක් බැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් සැප්තැම්බර් 07 වන දින සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රය - මැනිංටවුන් හි නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. මෙම අවස්ථාව සඳහා සේවා වනිතා ඒකකයේ උප සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය, සේවා වනිතා ඒකකයේ හිටපු සභාපතිනිය මෙන්ම සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රයේ ප්‍රධාන අධීක්ෂණ නිලධාරිනී සෝනියා කෝට්ටේගොඩ මහත්මිය සහ සේනාවිධායක බ්‍රිගේඩියර් රාජා ගුණසේකර ඇතුළු පිරිසක් ද සහභාගී වූහ. එහිදී, කුඩා දරුවන් ගේ සුවදුක් සොයාබැලූ සභාපතිනිය එම ආයතනයේ අභිවෘද්ධිය උදෙසා ඉදිරි සැලසුම් පිළිබඳව ප්‍රධාන අධීක්ෂණ නිලධාරිනී සමඟ සුහද පිළිසඳරකද නිරත වූවාය. අනතුරුව සේවා වනිතා ඒකකය යටතේ පාලනය වන *Seva Vanitha Budgt Centre* හි නිරීක්ෂණය කිරීමටද සභාපතිනිය අමතක නොකළාය.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායක ගේ අදහසකට අනුව මතුගම සහ වැලිපැන්න ශාසනාරක්ෂක බලමණ්ඩලයේ පිහිටි විහාරස්ථාන 15 කට වැඩි ප්‍රමාණයක් සඳහා වියළි සලාක මළු ප්‍රදානය කිරීම සහ පිටිගල ප්‍රදේශයේ අසරණ පවුලක ආබාධිත දරුවකු වෙත රෝද පුටුවක් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 05 වන දින වැලිපැන්න සෙනවිරත්නාරාම විහාරස්ථානයේදී පවත්වන ලදී. ඉංජිනේරු බලකා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් මහින්ද ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩියූ විසින් සංවිධානය කළ අතර, මෙම සේවා වනිතා ශාඛාවේ අධීක්ෂණය යටතේ 12 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව විසින් පරිත්‍යාගශීලීන් සම්බන්ධීකරණය සිදුකරන ලදී. එම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# ශ්‍රීලවියාඉබ සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි කටයුත්තක්

මින්නේරියෙහි ස්ථාපිත 3 ශ්‍රීලවියාඉබ සහ ශ්‍රීලවියාඉ (කාලතුවක්කු) බළඇණිය තුළ රාජකාරී නියුතු සාමාජිකයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන් 50 දෙනකු හට පාසල් පාවහන් මිළදී ගැනීම සඳහා රු. 200,000.00 ක වටිනාකමින් යුතු තිළිණ පත් පිරිනැමීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු 27 වන දින 3 ශ්‍රීලවියාඉබ - මින්නේරියහිදී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ශ්‍රීලවියාඉබ සේවා වනිතා ශාඛාවේ සභාපතිනී නන්දනී සමරකෝන් මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් මෙන්ම ආඥාපති යුද්ධ හමුදා හකාස අණසක හා ශ්‍රීලවියාඉ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.



# සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවෙන් නව මැහුම් හලක්





ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ ආධාර මත 6 වන සන්නද්ධ රෙජිමේන්තුවේ නවතමයෙන් ඉදිකරන ලද මැහුම් හල විවෘත කිරීම ඒකක අණදෙන නිලධාරී සහ සෙසුනිලයින්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු 02 වන දින එම ඒකක කඳවුරු භූමියේදී සිදුකරනු ලැබූහ.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි පරිත්‍යාගයක්



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ රාජකාරී නියුතු පිළිකා රෝගී තත්වය හේතුවෙන් ප්‍රතිකාර ලබන සරත් කුමාර යන සිවිල් සේවක මහතා විසින් කරන ලද ඉල්ලීමකට අනුව පසුගියදා ඔහුට මූල්‍ය පරිත්‍යාගයක් සිදුකෙරිණ. ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩ්එස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ විසින් තම පුද්ගලික ධන පරිත්‍යාගයෙන් එහිදී ඔහුට වෛද්‍ය ප්‍රතිකාර සඳහා රුපියල් 50,000.00 ක මුදලක් ලබාදෙන ලදී.

අදාළ මුදල කාලතුවක්කු රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය චාමා වනසිංහ මහත්මිය විසින් එම සිවිල් සේවක මහතා වෙත පිරිනැමුවාය.

# ලෝක ළමා දිනයට සංඥා බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්




ශ්‍රී ලංකා සංඥා බලකායේ සේවයේ නියුතු සෙසු නිලයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ පාසල් යන දරුවන් හට පාසල් පොත් බෙදාදීමේ වැඩසටහන සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීමේ අදහසින් සංවිධානය කෙරුණු සුබසාධක පොළක් ඉකුත් අගෝස්තු 26 වන දින එම රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැත්විණ. එම රෙජිමේන්තු සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ අදහසකට අනුව ලෝක ළමා දිනයට සමගාමීව එම කටයුත්ත සිදුවිය.

# සන්නද්ධ බුද්ධි බලකා මහ සභා රැස්වීම



2022 වර්ෂය වෙනුවෙන් පැවැත්වූ සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ මහ සභා රැස්වීම ඉකුත් අගෝස්තු 27 වන දින ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා නිලධාරී නිවස්නයේදී එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මිය සහ උප සභාපතිනි රජිතා ජයසූරිය ඇතුළු සේවා වනිතා සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබූහ. එහිදී, නව නිලධාරී මණ්ඩලය තෝරා ගැනීමද ඉදිරි වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කිරීමද සිදුවිය.

# ගැහේබ සේවා වනිතා සාමාජිකාවෝ අභිමංසල 2 හි සංචාරයක



ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුවිනි ලමාහේවා මහත්මිය සහ එහි සියලු සාමාජිකාවන් ඉකුත් අගෝස්තු 18 වන දින අභිමංසල 2 - කුඹුරුපිටිය සුවසහන නිකේතනයෙහි සංචාරයක නිරත වූහ. එහිදී, රණසිතයට පත් නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් සඳහා සංගීත රසාස්වාදයක් ලබාදෙමින් ඔවුනට ත්‍යාග පාර්සල් පිරිනැමීමටද කටයුතු කෙරිණ. තවද එම වාට්ටු සංකීර්ණයේ වා කවුළු පද්ධතිය සඳහා ව්‍යාපාරික කේඑච් නිරෝෂා නිශාන්ති මහත්මිය විසින් බට පැළලි ප්‍රදානයක්ද සිදුකරනු ලැබුවාය. එම උත්සව අවස්ථාට ගැමුණු හේවා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු සාමාජිකාවන් සහ අභිමංසල 2 කුඹුරුපිටිය සුවසහන නිකේතනයේ සේනාවිධායක කර්නල් ඩබ්ලිව්ජීඑච් රාජකරුණා ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සමග සංගීත රසාස්වාදය ලබාදීම සඳහා කලාකරුවන් රැසක්ද සහභාගී වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානයක්



ආර්ථික අපහසුතා ඇති රණවිරුවන්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ දූවාදරුවන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 03 වන දින සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනියක වන ඉනෝකා කරුණාරත්න මහත්මියගේ ප්‍රදානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ආරක්ෂක සේනා මූලස්ථානය නැගෙනහිර ආඥාපති හා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සහ සිංහ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මියද එම අවස්ථාවට සහභාගී වූහ. "රණවිරු අභිනන්දන පූජා 2022" ශිෂ්‍යත්ව වැඩසටහන් මාලාවේ ප්‍රධාන සංවිධායක ප්‍රසාද් ලොකුබාලසූරිය මහත්මා මීට අනුග්‍රාහක දායකත්වය ලබාදෙනු ලැබීය. මසකට රුපියල් 2750.00 බැගින් මාස 12 ක් සඳහා වූ ශිෂ්‍යත්ව 26 ක් සහ රුපියල් 2500.00 ක් වටිනා ශබ්දකෝෂ 26 ක් පිරිනැමීම, රුපියල් 9000.00 ක් වටිනා පාසල් උපකරණ ඇතුළත් කට්වල 34 ක් පිරිනැමීම හා මසකට රුපියල් 3000.00 බැගින් මාස 12 ක් සඳහා වූ ශිෂ්‍යත්ව 2 ක් පිරිනැමීම එහිදී සිදුවිය.

තවද, එම උත්සව අවස්ථාවේදී මෙම රෙජිමේන්තුවට අයත් නිලධාරී/සෙසුනිලයින්ගේ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්ව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ඇති දූ දරුවන් 7 දෙනකු සඳහා එක් අයකුට රුපියල් 20000.00 බැගින් වූ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමද සිදුවිය. මෙම උත්සව අවස්ථාව සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ හමුදා සම්බන්ධීකරණ නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් රැසක්ද, සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක්ද සහභාගී වූහ.




# පුදුකුඩිඉරිප්පු හිදී සිදුකරනු ලැබූ වීර ක්‍රියාව

**සෙ/410053 කෝප්‍රල් පුෂ්පකුමාර ඩබ්ලිව්එම්එන්**
**පිඩබ්ලිව්වී**
7 වන ගැමුණු හේවා බළඇණිය

අටකලම්පන්න, මාදම්පෙ ගම් පියසෙහි ලෙස්ලි රණසිංහ සහ ඔහුගේ ප්‍රිය භාර්යාව වන ඇග්නස් පළන්සූරිය යන දෙපළගේ නම් වීරෝදාර දෙමව්පියන් යුවලක් ලෙස ඉතිහාසයට එක්වන බව එදා මේ ලක් පොළොවේ කිසිවකු නොසිතන්නට ඇත. ඓතිහාසික සමනල කුඨයේ වැඩ වසන ශ්‍රී සුමන සමන් දේවරාජයාණන්ගේ පහසෙන් පෝෂණය වන රුවන්පුර අටකලම්පන්න මාදම්පේ ගමේ මෙම යුවලට දාව කුළුදුල් දරුවා ලෙස 1977 ජනවාරි මස 14 වන දින නිලන්ත පුෂ්පකුමාර මෙලොවට බිහිවිය. පසුව කාලයාගේ ඇවෑමෙන් නිලන්ත පුෂ්පකුමාර දරුවන් සිව්දෙනකුගෙන් යුත් පවුලක වැඩිමහල් පිරිමි දරුවා බවට පත්විය.

ගොඩමඩ දෙකම සරුසාරය පලබරය
කඳුරොද ගම්මාන තරමක පිරිසරය
ඒ ගම මැදින් ගලනා ගග මනහරය
කඩමණ්ඩිය පිහිටියේ ගම කෙරවලය

එදා සාගර පළන්සූරිය කිවිසරයන්ගේ ඉහත වැනුමට පාදකවූ කලල්ඇල්ල පින්නගල රමණීය ගම් පියසේ හරිත වර්ණයන්ගේ පැහැයෙන් ආශිර්වාදය ලද පරිසරය වීරෝදාර රණවිරුවකු නිසා කීර්තිමත් වනු ඇතැයි කිසිවකු සිතන්නට නැතුවා විය හැකිය. එහෙත් දෛවෝපගත ලෙස නිලන්ත පුෂ්පකුමාර රණවිරුවාද පළන්සූරිය මොහොට්ටාලගේ නිලන්ත පුෂ්පකුමාර වූයේ ඔහුද සාගර පළන්සූරිය පරපුරේ වෙමිනි.

නිලන්ත පුෂ්පකුමාර දරුවා "අ" යනු "ආ" යනු කියා අකුරු කරන්නට පිවිසුනේ කලා කුසලතාවයන්ට තෝතැන්නක් වූ මාදම්පේ විජය මහා විද්‍යාලයටය. එදින සටහන් වනුයේ වර්ෂ 1982 ක් වූ ජනවාරි මස 21 වන දින ලෙසය. මාදම්පේ විජය මහා විද්‍යාලය එවකට දෙස් විදෙස් කීර්ති නාමයක් නැංවූ කලාකරුවන් රැසක් බිහිකළ සංගීතය හා නාට්‍යකරණය තුළින් ජාතියට ඉමහත් සේවයක් කලාවූ රුවන්පුර ප්‍රමුඛ තක්ෂිලාවකි. මාදම්පේ විජය මහා විද්‍යාලයේ ගුරු මව්වරුන් පියවරුන් ආදර සැලකිලි හා ඔවදන් හිතට ගනිමින් නිලන්ත පුෂ්පකුමාර දරුවා ක්‍රමයෙන් වැඩෙන්නට විය. ඔහු පිළිබඳ මතකයන් අවදිකරන සැණින්ම, කුඩා නිලන්තට අකුරු කියවූ පද්මා පියසීලී ගුරුමෑණියන්ගේ මුවින් පිටවූයේ පාසලට ආදරය කරන ගමට ආදරය කරන ගමේ කෙත්යායේ සුවඳ මැද මෝරා වැඩුණු දරුවකු බවයි.

ක්‍රමයෙන් වැඩෙන නිලන්ත සිසුවාගේ දෑස නතර වූයේ "අ" යනු "ආ" යනු ඉගෙනගත් සුන්දර පෙළපොත් මත පමණක් නොවේ. පාට කූරක් චිත්‍ර කොළයක් නෙත ගැටුණු පමණින් නිලන්ත සිසුවා ඒ මත යමක් සිත්තමට නැගීමට අමතක කළේ නැත. පෙළපොතට දැක්වූ ආදර සෙනෙහස තරම්ම සෙනෙහසක් අත්පන්දුවටද දැක්වීමට නිලන්ත අමතක නොකළ අතර, ඔහු නොමැති පාපන්දු තරගයක් මාදම්පේ, කලල්ඇල්ල, පින්නගල ගමේ කෙත්යායක නම් කිසිම දිනක තිබුනේ නැති තරම්ය.

තම ගුරුපියස වූ රමණීය මාදම්පේ විජය විද්‍යාලයෙන් අ.පො.ස. (සා/පෙළ) දක්වා සිප්සතර හැදෑරූ නිලන්ත පුෂ්පකුමාර සිසුවා ළමා අවධියේ සිටම සමාජශීලීත්වය ප්‍රියකළ, අයුක්තියට අසාධාරණයට එරෙහිව නැගීසිටි ජවසම්පන්න හා එඩිතර අයකු වන ලකුණු මතින් ඔහුගේ ගම්පියස ආශීර්වාද ලැබීය. 1995 වසරේදී මොහු පාසලෙන් හැරයාමේ සහතිකය ලබාගත්තේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳීමේ අටියෙනි. එම කාලය තුළ ලක්මාතාව එල්ටීටීඊ කුරිරු ත්‍රස්තවාදයේ වියරු පීඩාවන්ට ලක්ව වැළපෙන මොහොතක් විය. තම මව්බිම රැකගැනීම උදෙසා මොරදෙන ආත්මයේ හඬට කන්දුන් පුෂපකුමාර වර්ෂ 1995 දෙසැම්බර් මස 18 වන දා ශ්‍රීලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බලසේනාවට ආධුනික සොල්දාදුවකු ලෙස එක්විය.

රටපුරා යුධ ගිනිදැල්වලින් වෙලුනු මොහොතක යුද්ධ හමුදාවට බැඳීම එතරම් සුදුසු නොවන්නක් බව තරුණ නිලන්තට එවකට පාසලේ ගුරුවරුන් ප්‍රකාශ කරද්දී සිනහ මුසුව ඔහු පවසා සිටියේ "මැරෙනවනම් කොතනක හිටියත් මැරෙනව" යනුවෙන් යැයි ඔහුට අකුරු කළ ගුණවතී ගුරු මාතාව සිහිකරන ලද්දේ මහත් ආඩම්බරයෙනි. තරුණ වියට එළඹ සිටි නිලන්ත එවකට මහා දේහධාරියකුව සිටියේය. ත්‍රස්ත උවදුරින් රට ගලවාගැනීමේ සටනට ජීවය දියහැකි උදාර රණවිරුවකුගේ මූලික ලක්ෂණ ඔහුගේ දේහ ලක්ෂණ තුළින් මනාව කියාපෑවේය. පාසල තුළ ක්‍රීඩාවෙන් ලද පන්නරයද ගැමි පරිසරයෙන් ලබාගත් මානසික ශක්තියද තම ජවය කරගත් නිලන්ත පුෂ්පකුමාරට යුද්ධ හමුදා පුහුණුව එතරම් වෙහෙසකර එකක් නොවේ යැයි ප්‍රකාශකර සිටි බව ඔහු පිළිබඳ මතකයන් අවදි කළ මාදම්පේ විදුහලේ විදුහල්පති අම්මඩුවේ විමල හිමියෝ වදාළසේක.

ප්‍රතාපවත් දේහධාරී එඩිතර තාරුණ්‍යයේ සෑම ලේ බිඳුවකම මාතෘභූමිය රැකගැනීම වෙනුවෙන් වූ ප්‍රතිඥාව ලියවී තිබිණ. සෑම සිහිනයකම මාතෘභූමියේ ඒකීයත්වය හා නිදහස පිළිබඳව නොවෙනස් වූ ප්‍රාර්ථනාව ගැවසී තිබිණි. වරෙක පුෂ්පකුමාරගේ සොහොයුරිය වන නිලූකා රත්නායක හා සොයුරු දුමින්ද මල්සිරි පවසන්නේ තම සොහොයුරාට විවාහවීම, නිවසක් තනා පදිංචිවීම වැනි සාම්ප්‍රදායික ආකල්ප එතරම් වැදගත් නොවූ බවයි.

වර්ෂ 1995 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වුණු පසු නිලන්ත පුෂ්පකුමාර දියතලාව ගැමුණුහේවා බලකා රෙජිමේන්තු පුහුණු පාසල වෙතින් ආධුනික පුහුණු පාඨමාලාව අංක 19 වෙත ඇතුළත්වී යුධ ශිල්ප ක්‍රම පිළිබඳ දැනුම ලබා ගනියි. උපදේශකයින්ගේ අණට කීකරුව නිසි යුද දැනුම ලැබ නිලන්ත පුෂ්පකුමාර 1996 මාර්තු මස 02 වන දින මව්බිම සුරකීම සඳහා තිර අදිටනින් යුතුව පුහුණු පාඨමාලාව නිම කරයි. දෙදහස් පන්සිය වසරක හෙළ විරුවන් ගිය මගෙහි ඉදිරියට පියමන් තැබීමට "මා නිවත්ත අභික්කම" හෙවත් "නොනැවති ඉදිරියට" යන්න ආදර්ශ පාඨය කරගත් තුන් සිංහලයම එක්සේසත් කළ වීර දුටුගැමුණු නම් වූ අද්විතීය නරපතියාගේ නමට ජීවයක් ලබාදීම සඳහා ආරම්භ කරන ලද ගැමුණු හේවා බලකාය වෙත ඔහු ඇතුළත් වේ. ගැමුණු හේවා බලකා ඒකකයක් වන 5 වන ගැමුණු හේවා බළඇණිය ආධුනික සෙබළ නිලන්ත පුෂ්පකුමාරගේ පළමු සේවාව ලබාගැනීම සඳහා වාසනාවන්ත වේ.

මෙම බළඇණිය වෙත ඇතුළත්ව ක්‍රියාන්විත රාජකාරී කරමින් සිටියදී සිය හැකියාවන් සහ කුසලතාවයන් විදහාපාමින් එඩිතර මෙන්ම කාර්යශූර රණ සෙබළකු වශයෙන් සිය රාජකාරී කැපවීමෙන් හා ඉතා විශිෂ්ට ලෙස ඉටුකරන ලදී. පස්වන ගැමුණු හේවායින් සමඟ නිලන්ත පුෂ්පකුමාර රණවිරුවා යාපනය, මන්නාරම හා වව්නියාව යන ප්‍රදේශවලට තම සේවාව ලබාදෙමින් ලක්දේශයේ ආරක්ෂාව උදෙසා තම වගකීම ඉටු කළේය. නිලන්ත පුෂ්පකුමාර රණවිරුවාගේ සේවය අගයමින් ඔහු ලාන්ස් කෝප්‍රල් නිලයට උසස් කරනුයේ උසස් නිලධාරීන් ඔහු ගැන තිබූ විශ්වාසය හා ඔහුගේ කැප කිරීම මැනවින් හඳුනා ගනිමින්ය. ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාරගේ සේවය ඇගයීම වස් මේ කාලය වනවිට ඔහු පූර්ණභූමි, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම්වලින්ද, යුද්ධ හමුදා ස්වර්ණ ජයන්තිය පදක්කම, හා වන්නි මානුෂිය මෙහෙයුම් පදක්කමෙන්ද පිදුම් ලැබීමට තරම් භාග්‍යවන්ත විය.

මේ සිව්වන ඊළම් යුද්ධයේ අඳුරු සෙවණැලි ලක් පොළොව වෙලා ගැනීමට අර අඳිමින් තිබූ අවාසනාවන්ත කාලයක ඇරඹුමයි. ගැමුණු හේවා බලකායේ තවත් ප්‍රහාරක ඒකකයක් වන 7 වන ගැමුණු හේවා බළඇණිය මෙම කාලය වනවිට යුද බිමේ අත්දැකීම් බහුල රණකාමීන්ගෙන් සමන්විත වූ ප්‍රහාරක බළඇණියක් විය. ආරම්භයේ පටන් සටන් බිමේ හොඳින් සතුරාට මුහුණදී ජයග්‍රහණ රැසක් අත්පත්කර ගනිමින් සතුරා විනාශ කර ඉදිරියට ඇදෙමින් තිබූ මෙම බළඇණියට තවත් වීරෝදාර හේවායකු වන ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාරගේ සක්‍රිය දායකත්වය ලබාගැනීම භාග්‍යයක් විය.

ඉන් පසු මෙම රණවිරුවා 7 වන ගැමුණු හේවා බළඇණිය සමඟ ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙමින් සතුරු ත්‍රස්තවාදීන් විනාශකර කැපවීමෙන් විශිෂ්ටයකු ලෙස සටන් වැදී 2009 ජනවාරි මාසයේදී මුලතිව් නගරය ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගැනීමේ තීරණාත්මක මෙහෙයුමට සක්‍රිය දායකත්වය ලබාදුනි.

ඒ 2009 ජනවාරි මස දෙවන සතියයි. තම 32 වන උපන් දිනය එළඹෙන විට ගමට එන්නට නිලන්ත පුෂ්පකුමාරට අවස්ථාව ලැබුණි. හෙළ බසට ඇලුම්කළ කවිකාර සාගර පලන්සූරිය පරපුරේ ඇග්නස් පලන්සූරිය මාතාව ළමා අවධියේ ජාතික තොටිල්ලේ පද මුමුණා දේශමාමක පුත්‍රයෙක් ලෙස ඇති දැඩි කළ නිලන්ත පුෂ්පකුමාර නම් තම ආදරණීය රණවිරු පුතුට එදින දීර්ඝායුෂ ප්‍රාර්ථනා කළාය. නැවත සේවයට යාමට මත්තෙන් ඔහු තම

ජීවන චාරිකාවේ අවසන් නිවාඩුවේ වැඩි කාලයක් වැය කර තිබුණේ යුදබිමේදී දිවි පිදූ තම ගම්මානයේම ජීවත් වූ හමුදාවේ මිත්‍රයකුගේ මළගමේ කටයුතු සංවිධානය කිරීමටය.

දින කිහිපයක් පවුලේ අයවලුන් සමඟ ගතකිරීමෙන් පසු තම නිවාඩු කාලය අවසන් කර නැවත ක්‍රියාන්විත රාජකාරියට පැමිණි නිලන්ත පුෂ්පකුමාර ත්‍රස්තවාදීන් සතුව තිබූ අවසන් බලකොටුව වූ පුදුකුඩුඉරිප්පු නගරය මුදාගැනීමේ තීරණාත්මක මෙහෙයුමට වීර හේවායකු ලෙස 7 වන ගැමුණු හේවා බලඇණිය සමගින් එක්විය. තිස් වසරක සාප ලත් යුද්ධය තීරණාත්මක අවසානයක් කරා එළඹ ඇති බවත්, රුදුරු ත්‍රස්තවාදය අවසන්කර ලබන මානුෂීය ජයග්‍රහණය අතපොවන මානයට ලංවී ඇති බවත්, මේ මොහොත තමන් සතු සෑම ශක්තියක්ම, හැකියාවක්ම මව්බිම විසින් ඉල්ලා සිටින අවස්ථාවක් බවත් ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර ඒත්තුගෙන සිටියේය.

ඓතිහාසික විජයග්‍රහණයක් ලබමින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ ප්‍රධානතම බලකොටුව වූ මුලතිව් නගරය අත්පත්කරගත් 7 වන ගැමුණු හේවා බලඇණිය ඇතුලු අනෙකුත් ප්‍රහාරක සේනාංක පුදුකුඩිඉරිප්පු නගරය ත්‍රස්තවාදීන්ගෙන් මුදවාගැනීම සඳහා 2009 ජනවාරි මස 31 වන දින ගමන් ඇරඹීය.

2009 පෙබරවාරි මස 01 වන දින "ඒ 35" මාර්ගය අත්පත්කර ගැනීම සිය අරමුණ කරගත් මෙම බලඇණියේ රණවිරුවන් 2009 ජනවාරි මස 31 රාත්‍රියේ හෙට දවසේ ලබන ජයග්‍රහණය පිළිබඳ සිහින මවමින් යුධබිමේ නිසි ලෙස ස්ථානගතවිය.

ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර තම බලඇණියේ ඩෙල්ටා කණ්ඩායමේ ආයුධාගාරය භාරව කටයුතු කළ අතර, ඔහුද පසුදින අරඹන තීරණාත්මක සටනට සිය දායකත්වය ලබාදීමේ අරමුණින් සූදානම්ව සිටියේය. ත්‍රස්තවාදයට එරෙහි මානුෂීය මෙහෙයුමේ තීරණාත්මක ක්‍රියාන්විතයක් සඳහා සූදානමින් සිටි 7 වන ගැමුණු හේවා බලඇණියට එරෙහිව රුදුරු ත්‍රස්තවාදීහු 2009 පෙබරවාරි 01 වන දින අලුයම පහේ කණිසම වනවිට දැවැන්ත ප්‍රහාරයක් ආරම්භ කළහ. තමන් සතු සෑම සන්නද්ධ අංශයක්ම සංවිධානගතකර ඉතා දැඩි ප්‍රහාරයක් 7 වන ගැමුණු හේවා බලඇණිය ස්ථානගතව සිටි ප්‍රදේශයට දියත් කිරීමට එල්ටීටීඊ ත්‍රස්තවාදීන් පියවර ගෙන තිබුණි. 7 වන ගැමුණු හේවා බලඇණියේ ඉදිරි ආරක්ෂක වළල්ල වෙත හා ඩෙල්ටා කණ්ඩායම් මූලස්ථානයට ඉදිරියෙන් හා පසුපසින් දැඩි ලෙස එල්ල කළ ප්‍රහාර හමුවේ නොසැලුණු වීරෝදාර රණවිරුවෝ උපරිම ප්‍රහාර දියත් කරමින් සිය ඒකායන අරමුණ වූ ජයග්‍රහණය පතා රොද බැඳ සිටියහ.

ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව මුලතිව් නගරයේ බලය තහවුරු කරගැනීමත් සමග පසුබා ගිය කොටි ත්‍රස්තවාදීහු නැවත ඊට තුදුරින් පිහිටි කලපුවෙන් පැමිණ හමුදාව සමග සටනට වන්හ. 7 වන ගැමුණු හේවා බලඇණියේ අණදෙන නිලධාරී සහ ඩෙල්ටා කණ්ඩායමේ නිලධාරී අණදෙන මෙහිදී භටපිරිස්වලට අණදෙමින් ඔවුන් මෙහෙයවීමේ කටයුතුවල නිරතව සිටියහ. නන්දිකඩාල් කලපුවත්, පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයත් අතර සිදුවූ මෙම දරුණු සටනේදී පණිවුඩ යන්ත්‍රය හා අවි ගබඩාව භාරව සිටියේ ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාරය. ඒ වනවිට සෑම අතින්ම සැපයුම් මාර්ග අවහිර වී තිබූ බැවින් අතිරේක භටපිරිස් කැඳවීම අසීරු වී තිබුණි.

"මරාගෙන මැරෙනවා මිසක් මුන්ට අවි ගබඩාව නම් අල්ලන්න දෙන්නෙ නැහැ" යි යන අරමුණ නිලන්ත පුෂ්පකුමාර තරයේ සිතට ගන්නට ඇත. පුරා පැය හතක් දරුණු සටන් ඇවිළෙමින් පවතිද්දී සෙබළුන්ගේ අත තිබූ පතරොම් හා අමතරව ලබාදී තිබූ පතරොම් සියල්ල අවසන් වෙමින් තිබියදී ඉතාමත් දුෂ්කරතා මධ්‍යයේ බලඇණිය වෙතින් අවශ්‍ය අවම ප්‍රමාණයට පතරොම් ලබාදීමට කටයුතු කර තිබුණි.

එවකට කණ්ඩායම් භාර නිලධාරීන් ඇතුළු සගයන් 70 දෙනකු තුවාල ලබා සිටි අතර, ඔවුන් සුරක්ෂිත ස්ථාන වෙත ගෙන්වා ගැනීමට නොහැකි පරිදි මෙම දරුණු සටන ව්‍යාප්ත වෙමින් පැවතුණි. මෙම සටන ත්‍රස්තවාදීන්ට වාසිදායක විය. දරුණු සටන් මධ්‍යයේ ලේ කැකෑරෙමින් බලාසිටි ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර "ඩී" කණ්ඩායමේ ආයුධ භාරව කටයුතු කළේය. තවත් නිමේෂයකින් තුවාල ලැබූ නිලධාරීන් ප්‍රමුඛ සෙබළුන්ගේ ජීවිත රැකගැනීමටත් තම ආයුධ ත්‍රස්තයන් අතට පත්වීම වළක්වාලීම සඳහාත් තීරණාත්මක තීන්දුවක් ගැනීමේ අභිමුවට ඔහු පැමිණ තිබුණි.

පියා නොමැති පවුලක වගකීම කරටගෙන තම මව සෙනහසෙන් රැකබලාගත් දයාබර පුත්‍රයකුගේ වගකීම් සමූහය පසෙකලා මාතෘභූමියේ සියදහසක් දරුවන්ගේ අනාගතය උදෙසා, තම පුද්ගලික අභිමතාර්ථයන් සමග මුළු මහත් ජීවිතයක් කැපකිරීමට ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර තීරණාත්මක තීන්දුවක් ගතතේය. තුවාල ලත් නිලධාරීන් ඇතුළු ස්වකීය සටන් සගයින්ගේ ජීවිත ආරක්ෂාව හා තමා සන්තකයේ තිබූ ආයුධ සතුරන්ගේ අතට පත්වීමේ අවදානම සිතට ගත් ලාන්ස් කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර, තමා සන්තකයේ තිබූ ක්ලේමෝ බෝම්බය ඇගෙහි රඳවාගෙන තමා
ෙ ද ස ට


වීර සෙබළෙක් කොටින් මැදට පැන ක්ලේමෝ බෝම්බයක් පුපුරුවා ගෙන දිවි පුදයි

ප්‍රහාර එල්ල කරමින් පැමිණෙමින් සිටි ත්‍රස්තවාදීන් සමූහය ඉදිරියට ස්වේච්ඡාවෙන්ම පැන ක්ලේමෝ බෝම්බය පුපුරවා ගනිමින් විශාල සතුරු ජීවිත ප්‍රමාණයක් වනසමින් තම උත්තම ජීවිතය, මාතෘභූමියේ නිදහසේ නාමට කැප කළේය. තවද, මෙම රණවිරුවාගේ සේවය ඇගයීම වස් ලාන්ස් කෝප්‍රල් නිලයේ සිට කෝප්‍රල් නිලය දක්වා උසස් කරන ලද්දේ ඔහුට කරනු ලබන ගෞරවයක් වශයෙනි.

මව්බිමේ නිදහස හා ස්වෛරීත්වය ප්‍රාර්ථනා කළ දේශප්‍රේමී උත්තම මානවයෙක් ස්වකීම ජීවිතය තම මාතෘභූමියේ නාමයට අභිමානයෙන් යුතුව පූජාකරනු ලැබුවේය. එකී උත්තම පූජාවෙන් පොහොය කිහිපයක් ගෙවීයාමට මත්තෙන් ශ්‍රී ලංකා මාතෘභූමියෙන් ත්‍රස්තවාදයේ අඳුරු සෙවනැලි තුරන්කර පූර්ණ වූ, අභිමානවත් වූ නිදහසක් මව්බිමට ලබාදීමට වීරෝදාර පවුලට හැකිවිය. තම සටන් සගයන් වෙනුවෙන් හා මව්බිමේ රැකවරණය වෙනුවෙන් ස්වකීය ජීවිතය අතහැර දැමීමේ දුෂ්කර තීන්දුව එඩිතරව ගත් දේශමාමක කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර වීරෝදාර රණවිරුවා වෙත පුදන ලද ඉහළම උපහාරය වූයේ තුන් සිංහලයම එක්සේසත් කළ නිදහස් ධජයේ උපහාරයයි. මව්බිමේ නිදහස උදෙසා අභීත ධෛර්යයෙන් යුක්තව සිය ජීවිත පරිත්‍යාගයෙන් සිදුකරන ලද අනභිභවනීය හා උත්කෘෂ්ට මෙහෙවර උදෙසා කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර වෙත වර්ෂ 2012 ක්වූ පෙබරවාරි මස



"මගෙ ලොකු පුතා මට රජෙක්."ඒත් ඒ රජා මට නැතිවුනා. පුතා එයාගෙ තරුණ ජීවිතය පූජා කළේ රට වෙනුවෙන්, යුද්දෙ හැටි ඔහොම තමයි. නිලන්ත පුතා මිය ගියේ බයගුල්ලෙක් වගේ නෙමෙයි. වීරයෙක් වගේ. පුතා මුළු රටටම වීරයෙක්. ඒ ගැන හිතනකොට මගේ දුක තුනී වෙනවා"

04 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිගරු ජනාධිපති හා සන්නද්ධ සේවා සේනාධිනායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් යුද සෙබලකු වෙත ජාතියෙන් පිදිය හැකි උසස්ම සම්මානය වන පරම වීර විභූෂණය පුදා උපහාර දක්වන ලදී.

කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාර හට සහෝදරියන් දෙදෙනකු සහ සහොදරයකු සිටින අතර, තම වැඩිමහල් පුත්‍රයා අභීත රණවිරුවකු ලෙස ජාතියට කැප කිරීමෙන් සිදුකළා වූ උතුම් මෙහෙවර උදෙසා දැනට ජීවතුන් අතර සිටින කෝප්‍රල් නිලන්ත පුෂ්පකුමාරගේ සදාදරණීය මෑණියන් වන ඇග්නස් පළන්සූරිය මහත්මියද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් "උත්තම පූජා" උපහාරයෙන් පුදනු ලැබිය.

# අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාවෙන් පරිත්‍යාගයක්





681 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 6 වන බළඇණිය ගැමුණු හේවා බලකා බලප්‍රදේශයේ ඉගෙනුම ලබන පාසල් ළමුන්ගේ දැනුම හා අධ්‍යාපන කටයුතු නංවාලීමේ අරමුණින් දියත් කෙරුණ අධ්‍යාපනික සත්කාරයක් ඉකුත් සැප්තැම්බර් 11 වන දින වල්ලිපුනම් සෙන්වෝලය ක්‍රීඩාංගනය අසලදී පවත්වනු ලැබීය. මේ යටතේ එහි උපකාරක පන්තියක ළමුන්ගේ ඉගෙනීම් කටයුතු ක්‍රමවත්ව සිදුකර ගැනීමට අවශ්‍ය මේස හා බංකු මෙන්ම අධ්‍යාපනික උපකරණද පරිත්‍යාග කෙරිණ.



# ටයිකොන්ඩෝ
## සටන් කලාවට පණ පෙවූ
# යුද්ධ හමුදා විරුවා



බදුල්ල ශ්‍රී රාහුල මධ්‍ය මහා විද්‍යාලය වෙතින් හා හාලිඇල මධ්‍ය මහා විද්‍යාලයෙන් සිත් සතර හදාරා තම දෙමාපියන් මෙන්ම ආරිය වීරසිංහ සහ වෛද්‍ය ආනන්ද අබේවික්‍රම යන අයගේ මගපෙන්වීම තුළින් කරාතේ ක්‍රීඩාව සඳහා යොමුවූ නලින්ද රත්නායක 1997 වර්ෂයේ අගෝස්තු මස 10 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය වෙත සාමාන්‍ය සෙබළකු ලෙස එක්වනුයේ යුද්ධ හමුදාවට තවත් කරාතේ ක්‍රීඩකයකුගේ අඩුව පුරවාලමිනි.

අනතුරුව එවකට ශ්‍රීලයුසේබ රෙජිමේන්තු සේනාවිධායක ලෙස කටයුතු කළ ලුතිතන් කර්නල් අසෝක පාණ්දෙණිය (විශ්‍රාමික මේජර් ජෙනරාල්) ඔහුව ටයිකොන්ඩෝ පාඨමාලාවක් සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත ක්‍රීඩා පාලක මණ්ඩලය වෙත යොමු කරවන ලද්දේ ඔහු සතු හැකියාවන් පිළිබඳ දීර්ඝ අධ්‍යයනකින් පසුවය.

ඒ අනුව, 1998 දෙසැම්බර් මස 08 වන දින යුධ හමුදා මූලස්ථානයේ ක්‍රීඩා පාලක මණ්ඩලය මගින් සියලුම රෙජිමේන්තු නියෝජනය කළ සෙනින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද පළමු ටයිකොන්ඩෝ පාඨමාලාවේදී ඔහු කොරියානු ජාතික මාස්ටර් Keun Woo Park මහතාගේ උපදේශකත්වයෙන් ඇරඹි පාඨමාලාවට සම්බන්ධ විය. ඉන් අනතුරුව සාසෙ නලින්ද රත්නායක වැඩිදුර පුහුණුවීම් සඳහා ක්‍රීඩා අමාත්‍යාංශ ටයිකොන්ඩෝ පුහුණු මධ්‍යස්ථානයේ කොරියානු ජාතික මාස්ටර් Ki Su Lee මහතා යටතේ අඛණ්ඩව පුහුණුවීම් සිදුකරන ලදී.


සෙනින් 50 දෙනකු සහභාගීත්වයෙන් පැවති එම පාඨමාලාවේ දක්ෂතම ක්‍රීඩකයා වූයේද සාසෙ නලින්ද ය. එහිදී, ක්‍රීඩකයින් 10 දෙනකු යුද හමුදාවේ ප්‍රථම ටයිකොන්ඩෝ උපදේශකයන් ලෙස පත්ව යුද හමුදාවේ ටයිකොන්ඩෝ ක්‍රීඩාව ව්‍යාප්ත කිරීමේ උපදේශකයන් වශයෙන් පත්වූ අතර, සාසෙ නලින්ද එහි පුරෝගාමියෙකි.

2000 වර්ෂයේ කෙඩෙට් නිලධාරීන්හට ටයිකොන්ඩෝ ක්‍රීඩාව පුහුණු කිරීම සඳහා ප්‍රථම උපදේශකයා ලෙස යුඅවිපී (දියතලාව) වෙත රපෝර්තු කරවන ලද්දේද නලින්ද රත්නායකය. ඔහු එහි උපදේශකත්වය සිදුකරන අතරතුර ක්‍රීඩා පුහුණුවීම්වල නිරතව 2001 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ටයිකොන්ඩෝ කම්ටුව, ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය, ක්‍රීඩා අමාත්‍යාංශය හා කොරියානු තානාපති කාර්යාලය මගින් පවත්වන ලද අන්තර් රෙජිමේන්තු ටයිකොන්ඩෝ ශූරතාවලිය, ජාතික ශූරතාවලිය, ජාතික මහා ක්‍රීඩා උළෙල සහ කොරියානු කුසලාන ශූරතාවලියන් සඳහා සහභාගී වී රන්, රිදී, ලෝකඩ පදක්කම් රාශියක් ලබාගෙන ඇත. තවද, විශේෂිත වූ දක්ෂතා අතුරින් 2002/2005 වර්ෂයන්හි ජාතික ශූරතාවලියන්හි දක්ෂතම ක්‍රීඩකයා ලෙසද හෙතෙම ජයග්‍රහණ ලබා ඇත.

ඔහුගේ ටයිකොන්ඩෝ ක්‍රීඩාවේ ජාත්‍යන්තර පසුබිම වශයෙන් ගත් කළ 2002 වසරේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර මලයාසියානු ටයිකොන්ඩෝ ශූරතාවලියේ රන් පදක්කම ලබාගත් අතර, එය ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාත්‍යන්තර රන් පදක්කම ලෙස ඉතිහාසගත වේ. ඉන් අනතුරුව 2002 වර්ෂයේ සිට ඔහු ජාත්‍යන්තර තරග සඳහා සහභාගී වී රන්, රිදී, ලෝකඩ පදක්කම් රාශියක් හිමිකරගෙන ඇති අතර, ඒ අතුරින්



2006 වර්ෂයේ 10 වන දකුණු ආසියානු ටයිකොන්ඩෝ තරඟාවලියේ ලෝකඩ පදක්කමද, 2006 වර්ෂයේ ලන්ඩනයේ පැවති එක්සත් රාජධානි ටයිකොන්ඩෝ ජාතික ශූරතාවලියේ රන් පදක්කමද දිනාගෙන ඇති ඔහු 2007 වර්ෂයේ කොරියාවේ පවත්වන ලද පලවන ලෝක ටයිකොන්ඩෝ පුම්සේ ශූරතාවලිය සඳහා ප්‍රථම වරට ශ්‍රී ලංකාව නියෝජනය කර 14 වන ස්ථානය ලබාගෙන තිබීම විශේෂත්වයකි.



සාසෙ නලින්ද රත්නායක ගේ ඉහත දක්ෂතා කරණකොට ගෙන ඒ හරහා යුද්ධ හමුදාවට අත්කරදී ඇති අභිමානය වෙනුවෙන් 2009 වර්ෂයේදී අධිකාරිලත් නිලධාරියකු ලෙස ඔහුව 2/ලුතිනන් නිලයට උසස් කිරීම ඔහුගේ යුද්ධ හමුදා දිවියේ සුවිශේෂී සන්ධිස්ථානයකි. තවද, 2016 වර්ෂයේ කොරියාවේ පවත්වන ලද බැංකින් මුන් ටයිකොන්ඩෝ පුම්සේ ශූරතාවලියේදී ඔහු ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ ඉතිහාසයේ ප්‍රථම පුම්සේ රන් පදක්කම දිනාගැනීමද ඉතිහාසගත වන්නකි.





එසේම, මෙම නිලධාරියා 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 04 වන දින සිට 26 වන දින දක්වා දකුණු කොරියාවේ මුජු නගරයේදී රටවල් 17 නියෝජනය කරමින් පුහුණුකරුවන් 25 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති ලෝක ටයිකොන්ඩෝ මාස්ටර්ස් පාඨමාලාව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වී ඇත. එයින් තේරීපත් වූ දක්ෂතම පුහුණුකරුවන් 05 දෙනා අතුරට ඇතුළත්ව ඉන් දක්ෂතම පුහුණුකරු වශයෙන් තේරී පත්වීමටද ඔහු සුදුසුකම් ලැබුවේ එය ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව ලෙස සනිටුහන් කරමිනි.

තත් නිලධාරී ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ ඉතිහාසයේ ශ්‍රී ලංකාව සතු කලුපටි 6 වන ශ්‍රේණිය සමත් දෙදෙනා අතුරින් එක් අයකු වේ. එම ශ්‍රේණිය සමත් යුද්ධ හමුදා ටයිකොන්ඩෝ ඉතිහාසයේ පළමු උපදේශකයාද මොහු වන අතර, මෙම නිලධාරී 2022 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා ලෝක හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩා කමිටු සභාපති වශයෙන් පත්කර ඇති බැවින් මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථමවරට ලෝක හමුදා ක්‍රීඩා කවුන්සිලයේ ක්‍රීඩා කමිටු සභාපති ධූරය හොබවන ප්‍රථම අවස්ථාව වන බවද පෙන්වා දෙමි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය, ජාතික විද්‍යායතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වන ලද පාඨමාලා හදාරා එම අත්දැකීම් තුළින් ටයිකොන්ඩෝ ජ්‍යෙෂ්ඨ උපදේශකයකු වශයෙන් යුද්ධ හමුදා ටයිකොන්ඩෝ පාඨමාලා 5 සඳහා උපදේශකත්වය දායාද කරමින් ටයිකොන්ඩෝ ජ්‍යෙෂ්ඨ උපදේශකයකු වී ශ්‍රීලයුසේබ රෙජිමේන්තු ටයිකොන්ඩෝ ප්‍රධාන උපදේශක ලෙස ක්‍රියාකර ඇති ඔහු ශ්‍රීලයුසේබ කණ්ඩායම වසර කිහිපයක් අඛණ්ඩව ශූරතාවලිය දිනාගැනීම දක්වා ඉහළට ඔසවා තබන්නට කටයුතු කොට ඇති බව මෙහිලා ප්‍රශංසාත්මකව සඳහන් කරමි.

යුධ හමුදා ටයිකොන්ඩෝ සංචිතයේ වසර 20 ක් පුරාවට ජාතික හා ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ ලබාගැනීම සඳහා ක්‍රීඩකයකු හා පුහුණුකරුවකු වශයෙන් යුද්ධ හමුදාවට මහත් කීර්තියක් හා අභිමානයක් අත්කර දුන් මෙම නිලධාරී යුද්ධ හමුදාවේ ටයිකොන්ඩෝ ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයකු, ප්‍රවීණ ජාත්‍යන්තර පුහුණුකරුවකු, සංචිතභාර නිලධාරී, තාක්ෂණික නිලධාරී හා කමිටු උප ලේකම් තනතුරු දරනු ලබන ටයිකොන්ඩෝ ක්‍රීඩාව හැදෑරූ පුරෝගාමීන් අතරේ දැනට යුද්ධ හමුදා සක්‍රිය සේවයේ සිටින ප්‍රථමයාද මොහු වේ. එවකට සිටි ටයිකොන්ඩෝ කමිටු සභාපතිවරුන් වන මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් ටීඩී වීරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, බ්‍රිගේඩියර් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ වත්මන් ටයිකොන්ඩෝ කමිටු සභාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ ඔහු යුද්ධ හමුදා ටයිකොන්ඩෝ සංචිතයේ අභිවෘද්ධිය තකා අඛණ්ඩ මෙහෙවරක නිරතව සිටින බව පෙන්වා දෙමි.

මෙවැනි දැනුම් සම්භාරයක් ඇති අතිදක්ෂ පුහුණුකරුවකුගේ සේවය යුද්ධ හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩාව වෙනුවෙන් යෙදවීම තුළින් එහි අභිවෘද්ධිය සඳහා ලැබෙන පිටුබලය අතිමහත් බැව් මෙහිලා අවසන්ව සටහන් තබමි.

ඉදිරිපත් කිරීම
ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය



# ජීවිතය සතුටින් සිටීමට සරල දිවි පෙවෙතකට හුරුවන්න (Minimalism)

# මනෝවිද්‍යාත්මක අත්වැලක්



සටහන -:
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගරු,
(මනෝවිද්‍යා උපදේශක)

අවම අවශ්‍යතාවලියන් තම ජීවිතය සපුරාගෙන සරල දිවි පෙවෙතකට හුරුවීම "අවම වාදය" ලෙස හඳුන්වයි. "මිනිමලිසම්" යනුවෙන් හඳුන්වනු ලබන්නේද එයම වන අතර, උදාහරණයක් ලෙස නොයෙක් නොයෙක් දෑ මිලදී ගැනීමට සිතීම සහ අන් අයගේ ජීවන රටාවන්වලට සමානව ජීවත්වීමට වෙරදැරීම නිසා සංකීර්ණ අවශ්‍යතාවයන් ගොඩනැගීම තුළින් ජීවිතයේ සරල බව අහිමි වීම ඔබ මා හොඳින් දන්නා කරුණකි.

අවම අවශ්‍යතාවලින් ජීවත්වන පුද්ගලයා "මිනිමලිස්ට්" කෙනෙකු ලෙස හැඳින්විය හැකි අතර, ඉන් අදහස් වන්නේ ඔහු ජීවිතය මනා ලෙස තේරුම්ගත් පුද්ගලයකු ලෙසය. සමාන්‍ය දිවි පෙවෙතකදී මිනිසුන් සිදුකරනු ලබන්නේ අනෙකා පරයා යමින් තමන්ගේ දිවි පෙවෙත සංකීර්ණ කර ගැනීමයි. නමුත් සරල දිවි පෙවෙතක් ගෙවන අවම වාදය අනුගමනය කරන කෙනෙකු තමන්ගේ සිතුවිලි සහ අවශ්‍යතාවයන් පාලනය කර ගනිමින් ඉදිරියට යාමට උත්සාහ දරයි. ලෝකයේ තිබෙන හැමදෙයක්ම තමන් සතුකර ගැනීමට වෙහෙස දරනවාට වඩා තමන් සතු දෙයින් සතුටින් ජීවත්වීම අවම වාදය අනුගමනය කරන්නන්ගේ ප්‍රතිපත්තියයි.

ඔබගේ දිවි පෙවෙත සරලවීම තුළින් ඔබගේ අවශ්‍යතාවයන් අඩුවන අතර, එමගින් ඔබගේ මානසික පීඩනය අඩුවන බව නොරහසකි. එම පීඩනය අඩුවීම තුළින් ඔබට නිදහස් මනසක් හිමිවේ. වර්තමානයේ අප හුරුවී සිටින්නේ අන් අය අනුගමනය කිරීමටයි. ඇත්ත වශයෙන්ම ඔබ සිතා බැලුවහොත් ඔබට කුමක් අවශ්‍ය වන්නේද යන්න, එකවිටම ඔබට ඒ සඳහා පිළිතුරක් නොතිබුණද "මිනිමලිස්ට්" කෙනෙකුට ඒ සඳහා පැහැදිලි පිළිතුරක් ඇත. මන්දයත් ඔවුන් ඔවුන්ට අවශ්‍ය මොනවාද යන්න පිළිබඳව මනා අවබෝධයක් තිබීමයි. තමන්ට ජීවිතේදී අවශ්‍ය දේ ගැන අවබෝධයක් ඇත යන්නෙන් අදහස් කරන්නේ තමන් විසින් තමන් හඳුනාගෙන ඇති බවයි. තමන්ට තමුන් හඳුනාගැනීම තුළින් ජීවිතය පවත්වා ගැනීමට ඉතා පහසුය. තමන් අනවශ්‍ය දේ වෙනුවෙන් කාලය වැය නොකරයි. එමෙන්ම තමන්ට අවශ්‍ය දේ දන්නා කෙනෙකුට කාලය මෙන්ම මුදල්ද ඉතිරිකර ගැනීමට හැක. මෙය මුදල් සඳහා පමණක්ම නොව කාලය, දැනුම විය හැකිය. නමුත් එසේ නොවන්නේ අපගේ අවධානය අනවශ්‍ය දේ සඳහා යොමුවීම නිසාය. අවම වාදයේදී අප සැමව පුහුණු කරනු ලබන්නේ අනවශ්‍ය දේවල් බැහැර කිරීම සඳහාය. අනවශ්‍ය පුද්ගලයින්, අනවශ්‍ය දේ, අනවශ්‍ය කටයුතු නොකිරීම තුළින් කාලය, ධනය, අපට ඉතිරිවීම තුළින් ජීවිතයේ සතුට විඳීමට එයම හේතුවකි. ජීවිතය සරල කිරීම තුළින් "සතුට" ඔබට ලැබෙන බව නොරහසකි. එබැවින් සරල දිවි පෙවෙතකට හුරුවන්න. එමගින් මානසික මෙන්ම කායික සතුටද ඔබට ලබාගත හැක.

එසේනම් අවම වාදය අප විසින් පුරුදු පුහුණු වන්නේ කෙසේද? ඒ සඳහා අපගේ අවශ්‍යතාවයන් කොටස් 03 කට බෙදිය හැක. අත්‍යවශ්‍ය, අවශ්‍ය සහ අනවශ්‍ය ද ලෙසයි. මෙය කුමන හෝ කරුණක් අරබයා වුවද ඔබට අවශ්‍යතා ලේඛණයක් සකස්කර ගත හැක. එමගින් හැම විටම අත්‍යවශ්‍ය දේ පමණක් තෝරාගත හැකි අතර, අවශ්‍ය සහ අනවශ්‍ය දේ බැහැර කළ හැක.

මේ සඳහා අප පුරුදු පුහුණු විය යුතුය. ඒ වෙනුවෙන් ඔබට 4 R ක්‍රමය, අනුගමනය කළ හැක.


Reduce - පරිභෝජනය සඳහා මිලදී ගැනීම අවම කිරීම.

Reuse - නැවත නැවත පරිභෝජනය සඳහා භාවිතා කිරීම.

Recycle - නව නිර්මාණයක් කිරීම සඳහා පරිභෝජනයෙන් තොර ද ලබාදීම.

Remove - පරිභෝජනය කළ නොහැකිනම් ඉවත් කිරීම.

සරල දිවි පෙවෙතට හුරු කිරීම සඳහා ලියන ලද මෙම ලිපිය ඔබ විසින් අවබෝධයෙන් යුතුව කියවා තමන් සතු ගුණාංගයන් වැඩිදියුණු විය යුතුය යන්න ඔබට හැගේනම් තවදුරටත් පොත පත පරිශීලනය කර අවම වාදය, "මිනිමලිසම්" ගැන ඔබේ දැනුම වර්ධනය කරගන්න. ඔබේ ජීවිතයේ නිර්මාණකරුවා ඔබම වන්න. අන් අයගේ සිතුම් පැතුම්වලට නොව ඔබගේ යහපත් සිතුම් පැතුම්වලට ජය ගැනීමට ඔබව පුහුණු කරන්න.



# ආත්මීය බැඳීම...

පැමිණ වින් කොහේදෝ සිටන්
මගේ ලෝකෙට එබී බැලුවත්
නොදැක්කා මෙන් ඉන්න විටදී
නෙතට නෙත ඔබේ එකට ගැටුනා...

මලක් මෙන් පිවිතුරුයි නුඹ මට
සුළඟ ඇවිදින් කියා දුන්නා
නෙතේ ඇඳි රුව හදේ කෙටුවට
ඇති තරම් පිං දෙන්න හිතුනා...

පරවෙලා වැහැරිලා තිබු සිත
ඔබේ සුසුමෙන් හොඳට තෙමුනා
සසර ගමනට ඉඟි කරද්දී
දෙයත් නොදැනිම තදට වෙළුනා...

ආත්මීය පෙම්වතුන් යනු පළමු හමුවීමේදීම නිමේෂයකින් හද තුළ හටගන්නා සංසාරගත හුරු බවකි.

- ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක

# “අන්තිමට විජේබණ්ඩාර ගෙදර ගියා”



සටහන:
ලුතිනන් කර්නල් සුචින් චමින්ද එදිරිසිංහ


රණබිම තුළ ඇඳුණු මකාලිය නොහැකි සිහිවටන කොතරම් සුන්දර වුව ද විටෙක එමගින් හදවතට දැනෙනුයේ මහා බරකි. එකී බොහොමයක් මතක කෙළවර ඇත්තේ වේදනාත්මක ඉතිරිවීම් පමණක් වීම ඊට හේතුවයි. හිත නිදහස් කර ගැනීමට නම් ඒවා කාට හෝ පැවසිය යුතුය. නොඑසේනම් කොහේ හෝ තැනක ලිවිය යුතුය. 90 දශකයේ මැද භාගයේදී මා අත්විඳි පහත සිදුවීම් සමුදාය අකුරු කරනුයේද එවන් පසුබිමකය.

ලුතිනන්වරයකු ලෙස එවක මා රාජකාරි කරන ලද්දේ නැගෙනහිර ප්‍රදේශයේ වූ කඳවුරකය. එය පොලොන්නරුව මඩකලපුව ප්‍රධාන මාර්ගයේ 118 කිලෝමීටර් කනුව ආසන්නයේ පිහිටා තිබුණි. පුනානි බලප්‍රදේශයට අයත්වූ එම කඳවුර පොදු ව්‍යවහාරයේදී "118 කඳවුර" ලෙස හැඳින්විණ. මා ඇතුළුව එහි සිටි සම්පූර්ණ භට සංඛ්‍යාව 40 කට අඩු වූ අතර, නිවාඩු ගිය හා අසනීප සෙබළුන් හැරුණු විට නිරන්තරව කඳවුරේ ඉතිරි වූ පිරිස ඉතා සීමිත විය. විශේෂයෙන්ම රාත්‍රී කාලයට බංකර් රාජකාරි සඳහා සෙබළුන් යෙදවූ පසු මුළු කඳවුරෙහිම රාජකාරියකින් තොරව ඉතුරු වූයේ වෛද්‍ය සහායක සෙබළා පමණි.

සාමාන්‍ය සෙබළ විජේබණ්ඩාර හලාවත ප්‍රදේශයේ පදිංචිව සිටි අයෙකි. එම කඳවුරේ සිටි එකම කතෝලික සෙබළා ඔහු වූ අතර, හෙතෙම බොහෝ ප්‍රියමනාප ගති ඇති කැපී පෙනෙන චරිතයක් විය. සෙබළ විජේබණ්ඩාර සිය පුද්ගලික අවිය ලෙස පරිහරණය කරන ලද්දේ LMG වර්ගයේ අවියකි. සිහින් සිරුරකින් හෙබි එතරම් උස අයකුද නොවූ ඔහුට එම බර අවිය පරිහරණය කිරීමට තරම් හයියක් ඇතිදැයි කෙනකුට සිතෙන තරම්ය. කෙසේවුවද කඳවුරේ සෑම ක්‍රියාන්විත කටයුත්තකදීම සිය LMG අවියද රැගෙන පෙරමුණ ගන්නේ විජේබණ්ඩාරය. ඔහු එතරම්ම ක්‍රියාශීලී නිර්භීත අයෙකි. එසේම තුමන දුන්කරනා හා අවදානමක් පැවතියද සෑම දිනකම සවස්වරුවේ කඳවුර තුළ ක්‍රිකට් ක්‍රීඩාකිරීමටද සෙබළු පුරුදුව සිටියහ. එවන් අවස්ථාවලදී විජේබණ්ඩාරගේ හඬ නිරතුරුව ඉස්මතුව පෙනිණ.

මා සිටි කඳවුරෙහි කුඩාවට සෑදූ වෛද්‍ය පරීක්ෂණාගාරයක් (MI Room) තිබූ අතර, එහි වෛද්‍ය සහායක ලෙස කටයුතු කරන ලද්දේ වෛද්‍ය බලකායට අයත් ජයසිංහ නම් කෝප්‍රල් වරයෙකි. එම විෂය පිළිබඳ මනා දැනුමක් සහිත අයකු වූ ඔහු නිරතුරු මා හා සමීපව කටයුතු කරන ලදී. කඳවුරේ ආරක්ෂක රාජකාරිවලින් නිදහස්ව සිටි එකම සාමාජිකයා ඔහු නමුදු වෛද්‍ය කටයුතුවලට අදාළ සිය මූලික කාර්යභාරයට අමතරව කඳවුරේ සෙසු ක්‍රියාකාරකම්වලදීද ඔහු නොපැකිලිව සහාය ලබාදුන්නේය. විශේෂයෙන්ම රාත්‍රී කාලයේ කඳවුරේ සියලු සෙබළුන් බංකර් රාජකාරිවලට බෙදීගිය පසු කඳවුර මධ්‍යයේ ඉතිරිවන එකම සෙබළා ඔහු පමණි. රාත්‍රියේ මා රූපවාහිනිය නරඹන සෑම අවස්ථාවකදීම ඒ අසලින් වාඩි වී සිට මා සමග මොනවා හෝ ආගිය තොරතුරක් කතාබස් කිරීම ඔහුගේ පුරුද්දකි.

එවක මා සිටි කඳවුරේ "පැනසොනික්" වර්ගයේ අඟල් 14 වර්ණ රූපවාහිනී යන්ත්‍රයක් තිබිණ. එහි විදුලිය නොවූවද





යාබද කඳවුරක සිට අනවසරයෙන් ඇදතිබූ විදුලි රැහැනක් ආධාරයෙන් ඉතා සීමිතව විදුලි පහසුකම් සපයාගෙන තිබිණ. කඳවුරේ සිටි සැම අයකුටම රූපවාහිනිය නැරඹීමේ පහසුකම් යන්තමින් හෝ ලැබුණේ එමගිනි. එවක "ස්වර්ණවාහිනී" රූපවාහිනී නාලිකාවෙහි පරීක්ෂණ විකාශය ඇරඹී අවධියයි. එබැවින් එහි දිවා රාත්‍රී අඛණ්ඩව ගීත ප්‍රචාරය විය. විශේෂයෙන්ම රාත්‍රිය පුරාවට එම නාලිකාවේ එලෙස ගීත ප්‍රචාරය වීම අපගේ බොහෝ සතුටට හේතුවූයේ එමගින් නිද්‍රාවර්ජිතව රාත්‍රිය ගෙවා දැමීමට පහසුවීම නිසාය. නමුත් එළැඹෙන සැම රාත්‍රියක්ම අවිනිශ්චිත බවින් පිරි අවදානම් සහිත රාත්‍රීන් වීම නිසාම කිසිවකුටත් නිදහසේ රූපවාහිනිය නැරඹීමේ හැකියාවක් නම් නොවීය. කෙසේ හෝ සැම දිනකම අලුයම තෙක්ම ඒ සඳහා ඉතිරිවූයේ මා හැරුණුවිට වෛද්‍ය සහායක කෝප්‍රල් ජයසිංහ පමණි. එසේ රූපවාහිනිය නරඹන අතරතුර මා මැදියමේ කඳවුර වටා බංකර්වල සෙබළුන්ගේ මුර රාජකාරී පරීක්ෂා කිරීමට යාමේදීද වෛද්‍ය සෙබල කෝප්‍රල් ජයසිංහ විදුලි පන්දමක්ද රැගෙන මා හා නොවරදවාම එක්විය. වෛද්‍ය බලකායට අයත් සෙබළකු වුවද කඳවුරේ ආරක්ෂාවට අදාළ කටයුතුවලදී ඔහු සිය උපරිම සහයෝගය ලබාදුන්නේය.

එම වෛද්‍ය සහායක කෝප්‍රල්වරයා නිවාඩු ගිය සැම අවස්ථාවකදීම වෛද්‍ය පරීක්ෂණාගාරයේ කටයුතු පැවරුණේ සෙබල විජේබණ්ඩාරටය. ඔහු වෛද්‍ය සෙබළකු නොවූ අතර එම විෂය පිළිබඳ කිසිදු පාඨමාලාවක්ද හදාරා තිබුණේ නැත. නමුත් මා එම කඳවුරේ රාජකාරී භාරගැනීමට පෙර සිටම ඔහු එම කටයුතුවල නියැලී සිට තිබිණ. වරක් මා සෙබල විජේබණ්ඩාර එලෙස වෛද්‍ය පරීක්ෂණාගාරයේ කටයුතු සිදුකිරීම පිළිබඳව සොයා බැලීමේදී දැනගත්තේ රසවත් කතාවකි. එනම් මුල් වකවානුවේ එම කඳවුරේ වෛද්‍ය සහායකයකු සිට නැති අතර වෛද්‍ය පරීක්ෂණාගාරයක්ද තිබී නැත. විජේබණ්ඩාර සිය පුද්ගලික පෙට්ටියක බෙහෙත් වර්ග කිහිපයක් තබාගෙන තිබී ඇත්තේ එවක ඔහුට වැළඳී තිබූ අසනීප තත්ත්වයන් කිහිපයක් හේතුවෙනි. කඳවුරේ සෙසු සහෝදර සෙබළුන්ගේ ද ඔහුට සමාන අසනීප තත්ත්වයන්වලදී විජේබණ්ඩාර තම බෙහෙත් ලබාදී තිබූ අතර ඒවායින් සාර්ථක ප්‍රතිඵලද ලැබී තිබිණ. අවසානයේ එය පුරුද්දක් ලෙස සිදුවී ඇති අතර, සෙබල විජේබණ්ඩාර කඳවුරේ කාට හෝ සාමාන්‍ය තරමේ අසනීප තත්ත්වයක් ඇති වූ සැණින් තමන්ගේ පෙර අත්දැකීම්වලට අනුව බෙහෙත් ලබා දී තිබිණ. කල්යාමේදී වෙනම වෛද්‍ය සහායකයකු පැමිණ වෛද්‍ය පරීක්ෂණාගාරයක්ද කඳවුරේ ස්ථාපිත වන තෙක්ම එහි සිටි නිල නොලත් වෛද්‍යවරයා ලෙස කටයුතු කරන ලද්දේ සෙබල විජේබණ්ඩාරය. කෙසේ හෝ එම කටයුතු පිළිබඳ ඉමහත් උනන්දුවකින් ක්‍රියාකිරීම නිසාම ඔහු වෛද්‍ය පරීක්ෂණාගාරයේ අමතර සහායකයා ලෙසද අඛණ්ඩව පත්කොට තිබුණේ ඊට සුදුසු වෙනත් අයකුද කඳවුරේ නොසිටි බැවිනි.

හොඳින් හඳ පායා ඇති දිනවල රාත්‍රී කාලයේ කඳවුරෙහි බංකර් රාජකාරීන්හි නිරත සෙබළුන් අතර සිදුවනුයේ බොහෝ සුහද ගනුදෙනුය. වෙනත් අඳුරු දිනවලදී තරම් හඳ ඇති කාලවල අවදානමක්ද නොවීම ඊට හේතුවයි. එහිදී බංකර් සිසාරා ඇසෙන්නේ කවි සීපදය. ගීත කොටස් ය. කඳවුරේ හොඳම සීපද කියන්නා වූයේ සෙබල විජේබණ්ඩාරය. තරඟයට මෙන් ඔහු සීපද කියද්දී තවත් සෙබළු ඊට පිළිතුරු කවිද කියූහ. කෙසේ හෝ එළිවනතුරුම එලෙස සෙබළුන් අවදියෙන් සිටීම හේතුවෙන් වෙනදා කඳවුර තුළ දකින පාලු මූසල බවද අවදානමද පහව යන්නේ නොදැනීමය. මේ අතර රාත්‍රියේ රාජකාරීන්හි නිරත සැම සෙබළකු වෙතම තේ හෝ කොත්තමල්ලි කෝප්පය බැගින්ද පිරිනැමේ. එහිදී, තේ සෑදීමේ කටයුතුවලදී මුල්වනුයේද විජේබණ්ඩාරය. එහිදී, ඔහු තේ බෙදද්දී හඬනගා කවියක් හෝ සීපදයක් කියන අයුරු රෑ මැදියමේ පවා මා අසාසිටි වාර අපමණය. එසේම ඔහු මා සිටි නිලධාරී නිවස්නයටද පැමිණ (එවක මා සිටි නිලධාරී නිවස්නය වූයේ කටුමැටි ගැසූ කුඩා මඩුවකි) මා අවදිව සිටින්නේදැයි බලා "සර්, තේ එකක් බොනවාද" යැයි අසන්නටද අමතක නොකළේය. රැයක් එළිවෙද්දී එලෙස දෙවරක් හෝ තුන්වරක් තේ බෙදීම සිදුකෙරේ. එවක ක්‍රියාන්විත ප්‍රදේශවල සැම කඳවුරකම තත්ත්වය එසේම විය. ඒ සැම කටයුත්තකින්ම බලාපොරොත්තු වූයේ රාත්‍රියේ සෙබළුන් ඇහැරවා තබාගැනීමය.

එම කාලසීමාව වනවිට සෙබල විජයබණ්ඩාරගේ නිවාඩු වාරය එළැඹ තිබිණ. ඊට සතියක ඇවෑමෙන් උදාවන නත්තල වෙනුවෙන් ඔහු සූදානම්ව සිටියේ කතෝලිකයකු වීම නිසාමය. ඒ වන විටද ඔහුට නිවාඩු යාමේ යෑමේ අවසරය හිමිව තිබුනද හදිසි අවශ්‍යතාවයකට නිවසට යාමේ වුවමනාවෙන් සිටි කඳවුරේ වෙනත් සෙබළකුට ඔහු තමාගේ නිවාඩු අවස්ථාව ලබා දී තිබිණ. අවුරුදු, වෙසක්, පොසොන් ආදී සැම විශේෂ කාලයකදීම විජේබණ්ඩාර සෙසු සහෝදර සෙබළුන්ට කොතෙකුත් තම නිවාඩු අවස්ථාව ලබාදී තිබිණ. නිවසට යාම සඳහා ඔහු වැඩිපුරම අවධානය යොමු කරනු ලැබුවේ නත්තල සඳහා පමණි. මෙවර ඔහු සිය නත්තල් නිවාඩුවද වෙලාසන නොගොස් අවසාන දින කිහිපයේ යාමට සූදානම්ව සිටියේ අන් කෙනකු වෙනුවෙන් සිය හොඳ හිත පතුරවමිනි.

118 කඳවුරේ කටයුතු එලෙස ගලායද්දී ක්‍රියාන්විත අවශ්‍යතාවයක් මත මා හට හදිසියේ යාබද "ඇනිකට් හන්දිය" කඳවුරට මාරුවීමට සිදුවිය. අනපේක්ෂිත ලෙස එම කඳවුරේ සිටි නිලධාරියා ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් මියයෑම මාහට එම කඳවුරට මාරු වීමට බලපෑ හේතුව විය. ඒ සමගම එතෙක් මා සිටි කඳවුරටද වෙනත් නිලධාරියකු රපෝර්තු කළ අතර, ඔහුද එම ප්‍රදේශයේම වූ වෙනත් කඳවුරක සිට පැමිණ තිබිණ.

**හොඳින් හඳ පායා ඇති දිනවල රාත්‍රී කාලයේ කඳවුරෙහි බංකර් රාජකාරීන්හි නිරත සෙබළුන් අතර සිදුවනුයේ බොහෝ සුහද ගනුදෙනුය. වෙනත් අඳුරු දිනවලදී තරම් හඳ ඇති කාලවල අවදානමක්ද නොවීම ඊට හේතුවයි. එහිදී බංකර් සිසාරා ඇසෙන්නේ කවි සීපදය. ගීත කොටස් ය. කඳවුරේ හොඳම සීපද කියන්නා වූයේ සෙබළ විජේබණ්ඩාරය. තරඟයට මෙන් ඔහු සීපද කියද්දී තවත් සෙබළු ඊට පිළිතුරු කවිද කියූහ. කෙසේ හෝ එළිවනතුරුම එලෙස සෙබළුන් අවදියෙන් සිටීම හේතුවෙන් වෙනදා කඳවුර තුළ දකින පාලු මූසල බවද අවදානමද පහව යන්නේ නොදැනීමය.**

කෙසේ වුවද මා වඩාත් ප්‍රිය කළ එම 118 කඳවුර හා එහි සෙබළු හැරදමා යාමට සිදුවීම පිළිබඳ මා තුළ වූයේ පශ්චාත්තාපයකි. කඳවුරෙන් නික්මයාමට මොහොතකට පෙර සෙබල විජේබණ්ඩාර මා හමුවට පැමිණියේ කෝඩියල් බීම වීදුරුවක් තැබූ ට්‍රේ එකක්ද අතැතිවය. ඒ වන විට වෛද්‍ය සහායක කෝප්‍රල්වරයා නිවාඩු මත සිටි බැවින් වෛද්‍ය පරීක්ෂණාගාරයේ කටයුතු පැවරී තිබුනේ සෙබල විජේබණ්ඩාරටය. " බීම එකක් බොමු සර්" එහිදී ඔහු කිව්වේ බොහෝ ලෙංගතු කමිනි. එවක ක්‍රියාන්විත ප්‍රදේශවල පිහිටි සෑම හමුදා කඳවුරකම තිබූ වෛද්‍ය පරීක්ෂණාග ාරවල කෝඩියල්, නෙස්ටොමෝල්ට් ආදිය සුලභ විය. එසේම යුද්ධය පැවතියද එකල ඕනෑම බෙහෙත් වර්ගයක්ද ඒවායේ හිඟ නොවීය. ඒ අනුව කඳවුරේ අසනීපවන සෙබළුන්ට කෝඩියල් හෝ නෙස්ටමොල්ට් ආදිය අමතරව සැපයූ අතර කඳවුරුභාර නිලධාරී ලෙස මා හටද ඉන් කෝඩියල් වීදුරුවක් සාදා දෙන්නට සෙබල විජයබණ්ඩාර අමතක නොකළේය. එවක ක්‍රියාන්විත සේවාවන්හි නියැලී සිටියදී එලෙස කඳවුරේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් කෝඩියල් වීදුරුවක් නොබිව් අයකු සොයාගත නොහැකි තරම්ය.

යාබද ඇනිකට් හන්දිය කඳවුරේ රාජකාරී භාරගෙන දින කිහිපයක් යනතෙක්ම මා සිත තුළ වූ නොසන්සුන් බව පහව නොගියේය. විශේෂයෙන්ම එම කඳවුර භාරව සිටි ලුතිනන්වරයාගේ මියයෑමට අදාළ සිදුවීමද පෙර මා සිටි 118 කඳවුරේ හටපිරිස් හදිසියේ දමා ඒමට සිදුවීමද මා සිත නිරතුරු දවන්නට විය. එසේම අවට ප්‍රදේශයේ ත්‍රස්ත ක්‍රියා දිනෙන් දින උත්සන්න වෙමින් පැවති අතර ඒවාට මුහුණදීමේදී බොහෝ සෙයින් කැපවන්නට ද අපහට සිදුවිය. ප්‍රදේශය වෙනත් කඳවුරු ආශ්‍රිතවද නිරතුරු යුද ගැටුම් සිදුවූ අතර ඒ හේතුවෙන් දිනපතා හමුදා සාමාජිකයන් හා ත්‍රස්තවාදීන් මියයෑම සාමාන්‍ය කරුණක් බවට පත්වන්නට විය.

මේ අතර එසේම අවට තිබූ සලකුණු අනුව පැහැදිලිවම පෙනෙන්නට තිබුනේ ත්‍රස්තවාදීන්ටද එමගින් බරපතළ හානි සිදුව තිබූ බවකි. ඒ වනවිට ඔවුන් ප්‍රදේශයෙන් පලාගොස් තිබුණද අතුරුදන් වූ සෙබලා සොයා ක්ෂණික ක්‍රියාන්විතයක් ද එහිදී ඇරඹීය. පසුව බුද්ධි අංශ මගින් හා වෙනත් විශ්වාස කටයුතු තොරතුරු ඔස්සේ දැනගනු ලැබූයේ ප්‍රහාරයෙන් මියගොස් සිටි සෙබලකුගේ සිරුර ත්‍රස්තවාදීන් විසින් රැගෙන ගොස් තිබූ බවකි. එහිදී, වඩාත්ම හද දවන සිදුවීම නම් එලෙස අතුරුදන්ව තිබුණේ 118 කඳවුරේ සිටි සෙබල විජේබණ්ඩාරය. සිය LMG අවියද රැගෙන මාර්ග සෝදිසි කිරීමේ ක්‍රියාන්විතයට එක්ව සිටි ඔහු ඇතුළු හටපිරිසට මඟ රැකසිටි ත්‍රස්තවාදීන් එලෙස ප්‍රහාරයක් එල්ලකොට තිබිණ.

එම සිදුවීමෙන් පසු පෙර සිටි 118 කඳවුරෙහි සෙබල විජේබණ්ඩාර හා බැඳුණු මතක නිරන්තර මා සිත දවාලන්නට විය. මා එහි සිටියේනම් එම සිදුවීම වළක්වාලීමට හැකිව තිබූ බවට මා තුළ වූයේ දැඩි විශ්වාසයකි. කෙසේ හෝ කිසිවක් ආපසු හැරවිය නොහැකි ලෙස සියල්ල සිදුවී හමාරය. යුද බිමක පයගසා සිටින ඕනෑම අයකුගේ ඉරණම අසුරු සැනින් වෙනස් විය හැකිය. ත්‍රස්තවාදයේ ස්වභාවය එයය. සෑමවම පොදු එම ධර්මතාවය පිළිබඳව යථාර්ථය අකමැත්තෙන් වුව පිළිගත යුතුව තිබේ. විජේබණ්ඩාරගේ අතුරුදන්වීමෙන් දින දෙකකට පසු එල්ටීටීඊ සංවිධානය විසින් ඔහුගේ සිරුර එවක ඔවුන්ගේ පාලන ප්‍රදේශයක්ව පැවති වාකරේ ප්‍රදේශයේ දී ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයට භාර දී තිබුණි. අනතුරුව එය ඔවුන්ගේ භාරයේ වාලච්චේන වෙත ගෙනඒමෙන් අනතුරුව හමුදා ආරක්ෂාව යටතේ පොලොන්නරුවටත් එතැන් සිට ඔහුගේ නිවසටත් පිටත්කර හැර තිබිණ. මෙහි තවත් විශේෂත්වයක් වූයේ සෙබල විජේබණ්ඩාරගේ සිරුර නිවස වෙත යවා තිබුණේ ඔහු නිවාඩු යාමට නියමිතව සිටි නත්තලට පෙර දිනයේදීමය. සුපුරුදු ලෙසම විජේබණ්ඩාර මෙවර නත්තලේදීද සිය නිවස වෙත ගිය ද අවාසනාවන්ත ලෙස නත්තලේ අර්ථය වූ ප්‍රේමය හා සාමය ඔහුට අහිමිවී තිබුණි.

ඇනිකට් හන්දිය කඳවුරෙහි මා සිටි නිලධාරී නිවස්නය සාදා තිබුනේ මහා මාර්ගය හොඳින් පෙනෙන තැනකය. එයද පකරන් තහඩුවලින් වටකොට ඉලුක් හා පොල්අතු සෙවිලි කර තැනූ ඉතා සරල එකකි. එදින අවදිව මා එහි කවුළුවෙන් පිටත බැලුවේ සෑම හිරු උදාවකම දැනෙන අවිනිශ්චිත බවින් යුතුවය. පොලොන්නරු, මඩකලපු ප්‍රධාන මාර්ගය එක එල්ලේ පෙනුනද උදෑසන නිසාදෝ එතෙක් එහි වාහන ධාවනය වීමක් නොපෙනිණ. පාලු මුසල බව අතරේ වුව කඳවුර වටා පිහිටි තේක්ක ගස් යාය සිසාරා ඇදී එන සුළං සැරින් නිලධාරී නිවස්නයේ ජනේලය ආවරණ කොට තිබූ කළු පැහැති ඉටිකොළය සර සර හඬදෙමින් සෙලවෙන්නට විය. "සර් තේ එකක් බොමු" මා තිගැස්සී එතෙක් නිමග්නව සිටි කල්පනාවෙන් මිදී හැරී බැලුවෙමි. නිලධාරී නිවස්නයේ කටයුතුභාර සෙබලා මා අසල වූ කුඩා බංකුව මත තේ කෝප්පයක් තැබුවේය. මා මොහොතක් ඒ දෙස බැලීය. තේ කෝප්පය වෙනුවට මට එහි පෙනුනේ කෝඩියල් වීදුරුවකි. විජේබණ්ඩාරගේ රුව එතුලින් මැවී පෙනෙන්නට විය.

# බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ නේවාසිකාගාරය විවෘත කෙරේ



15 (සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ආර්එම්ජේබී රාජපක්ෂ ගේ අධීක්ෂණය යටතේ එම ඒකකයේ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් යුතුව අභිනවයෙන් ඉදිකරන ලද ඒකක බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නය 562 වන පාබල බලසේනාධිපති කර්නල් ජේඑම්ඒ ජයසේකර ආර්එස්පී යූඑස්පී විසින් ඉකුත් සැප්තැම්බර් 07 වන දින සුබ මොහොතින් විවෘත කරන ලදී.





# ජල ගැලීම් අවම කිරීමට යුද්ධ හමුදා සහාය



පසුගියදා අඛණ්ඩව ඇදහැලුණු අධික වර්ෂාව හේතුවෙන් කැලණි ගඟ පිටාර ගලා බෝමිරිය ප්‍රදේශයේ පිහිටි ඉහළ බෝමිරිය අමුණ උතුරා ගංවතුර තත්ත්වයක් ඇතිවිය. එහිදී, 144 වන පාබල බලසේනාව යටතේ ස්ථාපිත 2 (සේවා) ශ්‍රී ලංකා පාබල බලඇණියේ භටපිරිස් වහා ක්‍රියාත්මකව ඉතාමත් කැපවීමෙන් යුතුව එම බෝමිරිය අමුණෙහි ජලය පිටාර ගලන ස්ථාන වෙත වැලි කොට්ට යොදා පිළිසකර කිරීමට කටයුතු කළහ.



## පාසල් ළමුන්ට ප්‍රවාහන පහසුකම් සලසමින්

බියගම මල්වාන ප්‍රදේශයේ පසුගියදා ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් මල්වාන - බණ්ඩාරවත්ත මාර්ගය අඩි 3 ක් පමණ ජලයෙන් යටවිය. ඒ හේතුවෙන් මල්වාන අල් මුබාරක් පාසලේ ඉගෙනුම ලබන සිසුන්ට තම පාසලට යාමට නොහැකි වූ අතර, එම ප්‍රදේශයේ වෙසෙන ජනතාවටද තම එදිනෙදා කටයුතු කරගෙන යාමටද අපහසුතා මතුවිය. එහිදී, 141 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ උපදෙස් පරිදි, මල්වාන රක්ෂපාන ගම්මානයේ සිට අල් මුබාරක් පාසල දක්වා ළමුන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා පාබල හමුදාවේ 8 වන බලඇණියේ භටපිරිස් පියවර ගත්හ.



## ආරක්ෂක සේනා (බටහිර) භටපිරිස් ආපදා සහන කටයුතුවල

පසුගියදා දිවයිනට බලපෑ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් මට්ටක්කුලිය අංක 259 ග්‍රාමනිලධාරී කොට්ඨාශය ගංවතුරින් යට විය. එහිදී, බටහිර ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් පරිදි 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ පූර්ණ අධීක්ෂණයෙන් 7 වන බලඇණිය ගැමුණු හේවා බලකායේ භටපිරිස් විසින් විපතට පත් එම ජනතාව වෙත ආහාර පාර්සල් බෙදාදීමට කටයුතු කරනු ලැබීය. තවද, ප්‍රදේශයේ අතරමංව සිටි ජනතාව මුදාගැනීමට ද ඔවුහු ක්‍රියා කළහ.




## “ක්‍රීඩාව තුළින් ලක්මව රනින් සැරසීමට යොවුන් පරපුර එක් විය යුතුයි ”

– කෝප්‍රල් දිලංක ඉසුරු කුමාර

**මහා බ්‍රිතාන්‍යයේ මෙවර පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී සවි එසවීමේ ක්‍රීඩාවෙන් ලෝකඩ පදක්කමක් දිනා ගනිමින් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් ඉමහත් කීර්තියක් අත්පත් කර දුන් විශිෂ්ට ක්‍රීඩකයකු වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට අනුයුක්ත කෝප්‍රල් දිලංක ඉසුරු කුමාර සමගින් සිදුකරන ලද විශේෂ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් රණවිරුවා පාඨක ඔබ සැමගේ රසවින්දනය උදෙසා මෙවර මෙම විශේෂාංග ලිපිය සකස් කෙරිණි .**



සංවාද සටහන -:
ලුතිනන් දුමින්ද සෙනරත් ශ්‍රීලියනපොඩුපේශ,
ජනමාධ්‍ය අධ්‍යක්‍ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

**ප්‍රශ්නය :-** ඔබගේ පාසල් කාලසීමාව පිළිබඳව මෙන්ම බර එසවීමේ ක්‍රීඩාව වෙනුවෙන් ඔබ යොමු වූ අයුරු පිළිබඳව කෙටියෙන් පැවසුවහොත් ?

**පිළිතුර :-** මගේ නම දිලංක ඉසුරු කුමාර. මම ජීවත්වෙන්නෙ කුරුණෑගල ප්‍රදේශය උඩගම කියන ගමේ මගේ පළමු පාසල ගැටඹ මහා විද්‍යාලය ඒ පාසලෙන් තමා මම බර ඉසිලීමෙ ක්‍රීඩාවට යොමු වන්නේ. එම විදුහලේ ක්‍රීඩා පිටියේ සෙල්ලම් කරමින් සිටියදී එම ස්ථානයට පැමිණි ක්‍රීඩා භාර නිලධාරී තුමන් බර එසවීමේ ක්‍රීඩාවට සම්බන්ධ වීමට කැමැතිද කියලා අපගෙන් ඇසුවා. ඒ වෙලේ අපි දැන හිටියේ නෑ බර ඉසිලීමේ ක්‍රීඩාව කියන්නේ කුමක්ද යන බවවත්, ඊට අදාළ පුහුණුවීම් කටයුතු සිදුකරන ස්ථානයක් කුරුණෑගල තියෙනවා කියලවත් මම දැනගෙන හිටියේ නෑ. එහෙත් 2006 වසරේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී සවි එසවීමේ ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට රන් පදක්කමක් දිනාදුන් චින්තන ගීතාල් අයියගේ පින්තූරයක් අපේ අච්චු පොතේ තිබ්බා ඒ ආසාවට ගුරුවරයා කියපු හින්දා අපි කැමැති වුණා බර ඉසිලීමේ ක්‍රීඩාවට සම්බන්ධ වන්න. ඊට පස්සේ ගුරුතුමා ගිහිල්ලා කුරුණෑගල බර ඉසිලීමේ ගෘහස්ථ ක්‍රීඩාගාරයට අපිව බාරදෙනවා. එතැන් පටන් තමා බර ඉසිලීමේ ක්‍රීඩාවට යොමු වන්නේ. ඔය අතරේ මම උසස් පෙළ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කොතලාවල මහා විද්‍යාලයට ඇතුළත් වෙනවා. එම විද්‍යාලයේ අධ්‍යාපන කටයුතුවල නිරත වෙමින් සිටියදී මට මගේ මුල්ම ජාත්‍යන්තර තරඟාවලිය වෙනුවෙන් සහභාගීවීමට අවස්ථාව උදාවුණා. ඒ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟාවලිය වෙනුවෙන් සහභාගීවීමටයි. එම තරඟාවලියේදී එහි සිව්වන ස්ථානය දිනාගැනීමට මට හැකියාව ලැබුණා.

**ප්‍රශ්නය :-** බර එසවීමේ ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් අත්පත් කරදෙමින් ඔබ දිනා ගන්නා ලද ලෝකඩ පදක්කම දීර්ඝකාලීනව ඔබ විසින් සිදුකරන ලද පුහුණුවීම්වල හා කැපකිරීම්වල ප්‍රතිඵලයක්, එමෙන්ම මේ සඳහා ඔබට ශ්‍රී ලංකා යුද හමුදාවෙන්ද අති විශාල සහයෝගයක් හා මාර්ගෝපදේශකත්වයක් ලැබුණා. ඒ පිළිබඳව යමක් පැවසුවොත්?

**පිළිතුර :-** ඇත්තෙන්ම මම යුද හමුදාවට බැඳෙන්නෙ 2016 වසරේදීය. මගේ පුහුණුකරු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරියකු වන රුක්ෂාන් ගුණතිලක මහතා ලබාදුන් උපදෙස් මත ක්‍රීඩාව ඉදිරියට කරගෙන යන්න අවශ්‍ය වූ නිසා මම ශ්‍රී ලංකා යුද හමුදාවට බැඳීමට තීරණය කළා. ඒ අනුව මම ශ්‍රී ලංකා යුද හමුදා පොදු හමුදා බලකායට ඇතුළත් වුණා. ඉතිං යුද හමුදාවට බැඳුනට පස්සෙ මම මගේ ප්‍රථම ජාත්‍යන්තර පදක්කම දිනා ගත්තා. ඒ අනුව මම යොවුන් හා පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟාවලියේ රන් පදක්කම හිමිකරගනු ලැබුවා. ඒක තමා මම ප්‍රථමයෙන්ම ලබාගත් ජාත්‍යන්තර පදක්කම හා යුද හමුදාවට ඇතුළත් වූ පසු ලබාගත් පළමු පදක්කම. ඇත්තටම කියනවා නම් යුද හමුදාවෙන් මට ලොකු සහයෝග යක් ලැබෙනවා. ඒ නිසා තමයි අද මට මේ වගේ ක්‍රීඩාව හොඳින් කරගෙන යන්න හැකි වෙලා තියෙන්නේ. කොටින්ම කිව්වොත් මාව කඳවුරට ගෙන්වන්නේත් නැති තරම්, මාව රාජකාරී කටයුතුවලින් නිදහස් කර පූර්ණ වශයෙන් බර එසවීමේ ක්‍රීඩාව කරගෙන යෑම වෙනුවෙන් නිදහස් කරලා තියනවා ඉතින් මට ඒක ලොකු හයියක්, ඒ අනුව නිදහස් මනසකින් යුතු ව බර එසවීමට අදාළ ක්‍රීඩා කටයුතු කරගෙන යාමට මට ඉඩ ප්‍රස්ථාව සැලසී තිබෙනවා. ඉතින් මම මෙම අවස්ථාවේදී ඊට අනුග්‍රාහකත්වය ලබාදුන් ශ්‍රී ලංකා යුද හමුදාපතිතුමන් ඇතුළු යුද්ධ හමුදා පොදු සේවා බලකායේ බලකාධිපතිතුමාත්, යුද හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂකතුමන් මෙන්ම දැනට

මම සේවය කරන ශ්‍රී ලංකා පොදු සේවා බලකායේ නිලධාරීන් ඇතුළු සෙසු නිලයන් සියලුම දෙනාට ඉතාමත් ගෞරව පූර්වකව මට ලබාදුන් සහයෝගය පිළිබඳව මගේ ස්තූතිය පළ කර සිටිනවා.

**ප්‍රශ්නය :-** පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී ඔබේ ඉලක්කය වූයේ එහි රන් පදක්කම දිනාගැනීම නේද?

**පිළිතුර :-** ඇත්තටම කිව්වොත් මගේ බලාපොරොත්තු වූයේ ලෝකඩ පදක්කම නොව එහි රන් පදක්කම දිනාගැනීමයි. එනමුත් මගේ පුහුණුකරු දූරදර්ශී අයුරින් තීරණයක් ගනිමින් මා කල් තබා දැනුවත් කර තිබුණේ එම තරගාවලියට සහභාගී වන ක්‍රීඩකයන් ගැන මුල සිටම සිදුකරන ලද මනා අධ්‍යයනයකින් පසු එම ක්‍රීඩකයින් සිදුකරන පුහුණුවීම්වලට වඩා වැඩියෙන් මා පුහුණුවීම්වල නිරත විය යුතු බවයි. ඇත්තටම මම එම තරගාවලියේ රන් පදක්කම දිනා ගැනීම වෙනුවෙන් සිදුකළ යුතුව තිබූ පුහුණුවීම් වාරයන්ටත් වඩා වැඩි ප්‍රමාණයකින් මගේ පුහුණුවීම් කටයුතු සිදුකළා. රන් පදක්කම ඉලක්ක කරගනිමින් පුහුණුවීම් කටයුතු සිදුකරනවා නම් වඩා වැඩි බර ප්‍රමාණයක් ඔසවා එහි පිළිබඳ පුහුණුවීම් සිදුකළ යුතුයි. නමුත් එහි ඇති අවදානම වන්නේ වඩා වැඩි බරක් එසවීමේදී එම උත්සාහයන් අසාර්ථකවීමේ සම්භාවිතාවය වැඩි වීමයි. එමෙන්ම යම් හෙයකින් පළමු උත්සාහය අසාර්ථක වුවහොත්, දෙවෙනිවර සිදුකරන උත්සාහය වෙනුවෙන් මනස නිරවුල්ව තබා ගැනීම මෙම තරගයේ ඇති දැඩි තරගකාරී ස්වභාවය නිසා අපහසු වනවා. ඉතින් මගේ පුහුණුකරු මා දැනුවත් කළේ අනවශ්‍ය අයුරින් අවදානමකට එළඹෙනවට වඩා රට වෙනුවෙන් සිතා ශ්‍රී ලංකාවට කවර හෝ පදක්කමක් ලබාදීමේ අරමුණින් එම තරග වටයන්ට අවතීර්ණ වෙමු කියලා. ඉතිං ඒ නිසාම මම ලෝකඩ පදක්කම ඉලක්ක කරගනිමින් එම තරග වටයට සහභාගී වුණා. ඇත්තටම කියනවා නම් මේක මුළු ලෝකෙටම තවත් එක් පදක්කමක් පමණක් වුනාට මට මුළු ලෝකයක් හා වටිනවා. ඒ මක් නිසාද යත් මේ මා රට වෙනුවෙන් දිනාදුන් පළවෙනි පදක්කමවීම නිසයි. ඒ නිසා එම තරගාවලියේ ආරම්භයේ සිට ම තියුණු තරගයක් ලබාදෙමින් රට වෙනුවෙන් පළවෙනි පදක්කම ලබා ගැනීමට හැකි වීම ගැන මට ගොඩක් සතුටුයි. ඒ කෙසේ වුවත්, රන් පදක්කම ඉලක්ක කර ගනිමින් එහි පුහුණුවීම් කටයුතු සිදු කළා නම් එම රන් පදක්කම පවා දිනාගැනීමට මට හැකියාව තිබූ බව දැන් මට වැටහෙනවා.

**ප්‍රශ්නය :-** බර ඉසිලීමේ ක්‍රීඩාව වෙනුවෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී එහි ලෝකඩ පදක්කම ඔබ විසින් දිනාගැනීමත් සමගින් ඔබට ඇතිවූ හැඟීම වචනයෙන් විස්තර කළ හොත් ?

**පිළිතුර :-** ඇත්තටම අවුරුදු ගණනක් පුරා සිදු කරනු ලැබූ උත්සාහය, අධිෂ්ඨානය වගේම විවිධ බාධක අභියෝග හා ආර්ථික අපහසුතා මැද මෙම තරගාවලියේ පුහුණුවීම් කටයුතු වෙනුවෙන් මම සහභාගී වුණා. ඉතින් ඒ කුමන බාධක ආවත් කිසි විටකත් පුහුණුවීම් කටයුතු මගහැරීමට මම කටයුතු කළේ නැහැ. මොකද ක්‍රීඩාවට ඇති කැමැත්ත මෙන්ම ශ්‍රී ලංකා ධජය විදෙස් රටකදී ඉහළ නැංවීමේ ඒ බලාපොරොත්තුව නිසා හැම දෙයක්ම කැප කරමින් පුහුණුවීම්වල නිරත වීමට මම කටයුතු කළා. ඇත්තටම මේ මා විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵල මල්පල ගැන්වූ අවස්ථාවක්. ඒ අනුව තරගයට අවතීර්ණ වුණු දවසේ දැඩි ආයාසයකින් තොරවම අදාළ පදක්කම ලබාගැනීමට මට හැකිවීම ගැන දැඩි සතුටක් මට තිබෙනවා ඒ වෙලේ ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය මගේ පදක්කම් තුළින් ඉහළ අහසට එසවීමට ලැබීම ගැන මට දැනුණු සතුට කියා නිම කරන්න බෑ. ඇත්තෙන් ම මට ගොඩක් සතුටුයි.

**ප්‍රශ්නය :-** ජයග්‍රාහී ඉලක්කය වෙත ළඟාවීම වෙනුවෙන් ඔබේ පුහුණු කරුවන්ගෙන් ලැබුණු මාර්ගෝපදේශකත්වය මෙන්ම සහයෝගය පිළිබඳව යමක් සඳහන් කළොත්?

**පිළිතුර :-** මගේ පුහුණුකරුවා ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරියකු වන රුක්ෂාන් ගුණතිලක මහතායි. ඉතිං එතුමා මට පියෙක් වගේ මගේ පුහුණුවීම් කටයුතුවලට අවශ්‍ය උපදෙස් නිරන්තරයෙන් ලබාදුන්නා. මම කුඩා කාලේ සිටම පුහුණුවීම් කටයුතු සිදුකරනු ලැබුවේද එතුමා ළඟයි. මට වඩා කැපවීමක් එතුමාට තිබ්බා එතුමාගේ පෞද්ගලික වැඩ පවා අතපසු කරගනිමින් දැඩි කැපවීමක් සිදුකර මගේ පුහුණුවීම් කටයුතු පිළිබඳ සොයා බැලීමට ඔහු නිරතුරුවම කටයුතු කළා. ඒ වගේම මගේ ඇඳුම් පැළඳුම්. යන එන තැන් මෙන්ම මට අවශ්‍ය ආහාර පාන පිළිබඳව පවා සෑම දෙයක්ම සොයා බලමින් හෙවනැල්ලක් මෙන් මා පසුපස සිටිමින් මගේ ක්‍රීඩා කටයුතු වෙනුවෙන් මට ලොකු ශක්තියක් ලබාදීමට ඔහු කටයුතු කළා. ඉතින් එතුමා නිසා තමා අද මට මේ පදක්කම ලබාග න්න පුළුවන් වුනේ. එනිසා මා දිනා ගන්නා ලද මෙම ලෝකඩ පදක්කමේ සම්පූර්ණ ගෞරවය එතුමන්ට හිමිවිය යුතුයි. එතුමන්ගේ කැපවීම මෙන්ම මගේ උත්සාහය යන කාරණා ද්විත්වය මට මේ තරගාවලිය වෙනුවෙන් ලෝකඩ පදක්කම දිනාගැනීමට මහෝපකාරී වුණා.

**ප්‍රශ්නය :-** ඔබගේ මීළග ඉලක්කය හා අනාගත අභිප්‍රායන් පිළිබඳව යමක් පැවසුවොත් ?

**පිළිතුර :-** මගේ මීළග බලාපොරොත්තුව වනුයේ 2022 වසරේ දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත ලෝක බර ඉසිලීමේ තරගාවලිය වෙනුවෙන් සහභාගී වී එහි බර ඉසිලීමේ ක්‍රීඩාවෙන් පදක්කමක් ලබාගැනීමයි. ඒ මක් නිසාද යත්, බර ඉසිලීමේ ලෝක ශූරතාවලියකින් කිසිවෙකුත් පදක්කමක් මේ වනතුරු දිනාගෙන නැහැ. ඉතින් මගේ ලොකුම බලාපොරොත්තුව එම තරගාවලියට සහභාගී වී රටට කුමන හෝ පදක්කමක් ලබාදීම. ඒ වගේම තමා ක්‍රීඩකයෙක්ගේ තියන ලොකුම ආසාව ඔලිම්පික් තරගාවලියක් නියෝජනය කිරීම. ලෝක ශූරතා තරගාවලියෙන් අනතුරුව 2024 වර්ෂයේ පැවැත්වෙන ඔලිම්පික් තරගාවලිය නියෝජනය කිරීමත් මගේ තවත් එක් බලාපොරොත්තුවක්.

**ප්‍රශ්නය :-** බර ඉසිලීමේ ක්‍රීඩාව වෙනුවෙන් ඉදිරියේදී අවතීර්ණ වීමට නියමිත නවක ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ඔබට කිසියම් උපදේශයක් ලබාදීමට ඇත්නම් ?

**පිළිතුර :-** ඇත්තටම බර ඉසිලීමේ ක්‍රීඩාව කියන්නේ ලොවක් ජයගන්න පුළුවන් ක්‍රීඩාවක්. මම කියන්නේ පාසල් යන නංගිලා මල්ලිලාට බර ඉසිලීමේ ක්‍රීඩා කරන්න කැමතිනම් එකතුවෙන්න අපිත් එක්ක. එකතුවෙලා රට දිනන්න ලොව දිනන්න පුළුවන් ක්‍රීඩකයෙක් වෙන්න. මම පුහුණුවීම් කරන්නේ කුරුණෑගල බර ඉසිලීමේ ක්‍රීඩාගාරයේ. ඔබ සියලුදෙනාට කිසිදු මුදල් අය කිරීමකින් තොරව පුහුණුවීම් කටයුතු සිදුකිරීමට අපිට අවස්ථාව උදාවෙලා තියෙනවා. ඉතිං එක්වන්න අපිත් එක්ක ක්‍රීඩාව අතින් ඉදිරියට යන්න ලොවක් දිනන්න. රටේ කොඩිය ඉහළ නංවන්න අපිට පුළුවන් හැමදේම අපි නංගිලා මල්ලිලා වෙනුවෙන් කරන්න අපි බැඳී සිටිනවා. එන්න, ක්‍රීඩාව තුළින් ශ්‍රී ලංකා මාතාව ජයග්‍රහණය කරන්න අපිත් සමග එකතු වෙන්න කියලා මම ඉතාමත් ආදරයෙන් ක්‍රීඩාවට ලැදියාවක් ඇති යොවුන් පරපුරේ ඔබ සැමගෙන් ඉල්ලා සිටිනවා.



# මානසික නිරෝගිතාවයෙන් තොර කායික සැපතක් නැත



කර්නල් එම්බීපී පෙරේරා
(විශ්‍රාමික)

නූතන විද්‍යාව හා තාක්ෂණයේ උපරිම දියුණුවක් සමගම අප ජීවත්වන සමස්ථ ලෝකයම එකම විශ්ව ගම්මානයක් යැයි උදම් ඇනුවත්, එවන් පසුබිමක අහේතුක ප්‍රතිඵල ලෙස මිනිස් ජීවිත අතිශය සංකීර්ණත්වයට පත්ව ඇත. මෙම සංකීර්ණ ජීවන රටාව තුළ දිනෙන් දින උදාවන මානුෂික ගැටලු හමුවේ ඒවා නිරාකරණය කර ගැනීමට නොහැකිවීමෙන් අසරණ වන වර්තමාන මිනිසා ඛේදජනක ලෙස ජීවන යාත්‍රාවේ අතරමංවී ඇති බවක් පෙනේ. දිවා කාලයේ අපමණ වෙහෙසී රාත්‍රී කාලයේ පවා සැලසුම් සාදමින් වර්තමාන මිනිසා වෙහෙසෙන්නේ ජීවිතයේ සතුට ලබාගැනීම උදෙසාය. මෙලෙස දිවා රෑ නොබලා ඇතමුන් සතුට සොයා යනමුත් ලබාගත් සතුටක් නම් පෙනෙන්නට නැත. එබැවින් මිනිසා කොතැනක හෝ වරද්දාගෙන ඇති බවක් පෙනේ. අප ජීවත්වන සමාජයේ බොහෝ මිනිසුන් දෙස බැලීමේදී ඔවුන් තුළින් නීරෝගී පෙනුමක් හෝ අව්‍යාජ නොකැළැල් සිනවහක් දැකීම ඉතා අසීරුය. ඒ වෙනුවට ඔවුන්ගේ මුහුණෙන් දිස්වන්නේ සැමවිටම මොකක්දෝ අවුලකින් පෙළෙන බවයි. ජීවිතය ඔය තරම් පීඩා විඳීමට තරම් සංකීර්ණ දෙයක් නොවන අතර මිනිසා විසින් අනවශ්‍ය ලෙස ජීවිතය සංකීර්ණ කරගෙන ඇත. සැබැවින්ම සතුට සෙවීම සඳහා මෙතරම් වෙහෙසිය යුතුද?

මෙම සංකීර්ණ තරගකාරී සමාජයේ අහේතුක ප්‍රතිඵල ලෙස වර්තමාන මිනිසා බොහෝ මානසික ව්‍යාධීන්වලට ගොදුරු වී ඇත. මේවාට හේතු වන මානසික ගැටලු විවිධාකාරය. කුඩා දරුවන් තුළ දක්නට ලැබෙන අධ්‍යාපන දුර්වලතා හෝ වෙනත් සාමාන්‍ය නොවන මානසික තත්ත්වයන් ළමා මානසික ගැටලුයැයි හඳුන්වනු ලැබේ. එලෙසම සමාජයේ බහුලව තරුණ මානසික ගැටලුද ඇත. ජීවිතයේ තනිකම, අසහනය, අපචාර, සමාජ බිය, සියදිවි නසාගැනීම, අපරාධ, මත්පැන් හා මත්ද්‍රව්‍යය වලට යොමුවීම, සමලිංගික ක්‍රියා ආදිය ඉන් සමහරකි. විවාහකයන් විෂයෙහිද පවතින පවුල් අඩදබර, අයහපත් ලෙස බිඳුනු පවුල් ජීවිත, දරුවන් අසරණ වීම, මත්පැන් ලෝලීත්වය, අනියම් සම්බන්ධතා, දික්කසාද ආදිය හි අවසාන ප්‍රතිඵලය නොයෙකුත් මානසික ගැටලු ඇතිවීමයි. ජීවිතයේ සැඳෑසමය ගෙවන වැඩිහිටියන් තුළද මානසික රෝග ඇතිවීම උදෙසා තනිකම, අසරණකම, අසහනයෙන් කල් ගෙවීම ආදිය සෘජුවම බලපානු ලැබේ.මෙවැනි තත්ත්වයන් හේතුකොට ගෙන හටගන්නා මානුෂික රෝග බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව හඳුනාගෙන විවිධ මානසික රෝගයන් ලෙස වර්ග කර ඇති අතර, ඉන් සමහරක් පහත පරිදි වේ.

ඉහත දක්වා ඇති පරිදි මිනිසාට වැළඳෙන විවිධාකාර මානසික රෝගී තත්ත්වයන් උදෙසා බටහිර වෛද්‍ය විද්‍යාව අනුව නොයෙකුත් ප්‍රතිකාර ක්‍රම අනුගමනය කරනු ලැබේ. ඒ අනුව හුදෙක් ඖෂධ ප්‍රථිකාර තුළින් පමණක් මෙවැනි මානසික රෝගී තත්ත්වයන් සම්පූර්ණයෙන් සුව කිරීමට හැකියාවක්

නොමැත. ඒ සඳහා නින්ද, විවේකය මෙන්ම පුද්ගල ජීවන ආකල්ප වෙනස් කිරීම, ජීවන රටාව හෝ පරිසරය වෙනස් කිරීම, විවිධ තෙරපුම් ක්‍රම, පැවරුම් අභ්‍යාස ආදියද අදාල පරිදි යොදා ගැනේ.

බුදුසමයට අනුව මිනිසුන්ට වැලඳෙන රෝග දෙවර්ගයක් ලෙස බුදුන්වහන්සේ පෙන්වා දී ඇත. එනම් කායික රෝග හා මානසික රෝග වශයෙනි. මිනිසුන්ට කායික රෝගවලින් තොපෙලී කොතරම් කාලයක් ගතකිරීමට හැකිවූවද මානසික රෝගවලින් බේරී සුළු මොහොතක් හෝ ගතකිරීමට අපහසු බව බුදුන් වහන්සේ අනුදැන වදාරා ඇත. බුදු සමයට අනුව මෙම මානසික රෝග ඇතිවීමට පැහැදිලි හේතුවක්ද පෙන්වාදී තිබේ. එනම් බොහෝ ලෞකික වස්තූන් කෙරෙහි ආශාවන් ඒවා සියල්ල තමන් සතුකර ගැනීමේ අධිෂ්ඨානයෙන් නිරතුරුව, උත්සාහයක යෙදී සිටින මිනිසා කොතරම් සැප සම්පත් ලැබුනත් ඒවායින් සෑහීමකට පත් නොවේ. මේවා පසුපස තව තවත් හඹා යාමේදී අත්‍යප්තිකර මානසික තත්ත්වයකට පත්වන මිනිසා තුළ ඔහුගේ දෛනික ජීවන රටාවේ විවිධ විකෘති අපිළිවෙලවල් ස්වභාවිකවම මතුවන්නට පටන් ගනී.

මේ අනුව වස්තු කාමයන්ට ලොල් වී සැප සොයා යෑම මානසික රෝගී තත්ත්වයක් ලෙසත් එම ක්ලේශතාපයන්ට ලොල් නොවී නිරාමිස සුවයෙන් කල් ගතකිරීම මානසික නිරෝගිතාවයේ ලක්ෂණයක් ලෙසත්, බුදුසමය පෙන්වා දී තිබේ. මේ අනුව මිනිසා පීඩා විඳින මානසික රෝග සඳහා මූලිකව අප තුළ පවතින නොහික්මුණු රාගාධී ක්ලේශයන් ඍජුවම බලපාන බව බුදුසමය පෙන්වා දී ඇත. මෙහි සත්‍යතාවය වර්තමාන සමාජයෙහි පුද්ගලයන් කටයුතු කරන ආකාරය දෙස බැලීමේදී මනාවට පැහැදිලි වේ. මෙලෙස රාගාධී ක්ලේශයන් හේතුකොට මිනිසුන් මුහුණපාන මානසික රෝග 44ක් බුදුරදුන් සල්ලේඛ සූත්‍රයෙහි පෙන්වා දී ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ. යම් අයෙකුට මේවා මානසික රෝගී තත්ත්වයන් නොවේයැයි තර්ක කළ හැකිය. එසේ වුවද රහතන් වහන්සේලා හැර සියලු පෘථග්ජන මිනිසුන් උන්මත්තකයෝ ලෙසට බුදුසමය තුළින්ම පෙන්වා දෙන බැවින් පෘථග්ජන මනසින් බැලීමේදී මේවා මානසික රෝගී තත්ත්වයන් නොවන ලෙසට පෙනීයා හැකිය. එහෙත් එය සත්‍ය නොවේ. මානසික රෝග හට ගැනීම සඳහා බලපාන්නේ මිනිසුන් තුළ පවතින රාගාදී ක්ලේශයන්මය.එබැවින් බුදුසමයට අනුව මානසික රෝගයන් හා ඒවා සමනය කරගත හැකි ක්‍රමයද (ප්‍රතිකාරය) පහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇත.

| ආතතිය | Stress |
|---|---|
| උන්මාදය | Mania |
| විශාදය | Depression |
| කාංසාව | Anxiety |
| කායික රූපී ආබාධ | Somata From Disorders |
| මත්ද්‍රව්‍ය නිසා ඇතිවන ආබාධ | Substance Related Disorders |
| භින්න උන්මාදය | Schizoiphonia |
| භීතිකා | Phobia |
| ග්‍රස්ථීය | Obsessive Compulsive Disorders |
| පශ්චාත් ව්‍යසන ක්ලමථකාරී ආබාධ | Post Traumatic Stress Disorders: PTSD |
| ලිංගික ගැටලු | Sexual Disorders |

| රෝගය | ප්‍රතිකාරය |
|---|---|
| අනුන්ට හිංසා කිරීම | අනුන්ට හිංසා නොකිරීම හෙවත් අවිහිංසාව |
| සතුන් මැරීම | සතුන් නොමැරීම |
| අනුන් සතු දේ ගැනීම | අනුන් සතු දේ නොගැනීම |
| කාමයෙහි වරදවා හැසිරීම | කාමයෙහි වරදවා නොහැසිරීම |
| බොරු කීම | ඇත්ත කීම |
| කේලාම් කීම | කේලාම් නොකීම |
| පරුෂ වචන කීම | පරුෂ වචන නොකීම |
| නිෂ්ප්‍රයෝජන වචන කීම | නිෂ්ප්‍රයෝජන වචන නොකීම |
| අනුන්ගේ දේ ගැන ඇති ආශාව | අනුන්ගේ දේ ගැන ආශා නොකිරීම |
| දූෂිත නරක සිත් ඇති බව | දූෂිත නරක සිත් නැති බව |
| වැරදි සහිත දර්ශණ | නිවැරදි දර්ශණය |
| වැරදි අකුසල සංකල්ප | නිවැරදි කුසල් සිතුම් පැතුම් |
| අයහපත් වචන කථා කිරීම | යහපත් වචන කථා කිරීම |
| වැරදි කර්මාන්ත කිරීම | නිවැරදි කර්මාන්ත කිරීම |
| වැරදි ජීවිකාව | නිවැරදි ජීවිකාව |
| වැරදි ව්‍යායාමය | නිවැරදි ව්‍යායාමය |
| වැරදි සිහිය | නිවැරදි සිහිය |
| වැරදි සමාධිය | නිවැරදි සමාධිය |
| නරක ක්‍රියා කොට කලේ හොඳ ක්‍රියා යැයි සිතීම | යහපත් නුවණ ඇති බව |
| වැරදි විමුක්තිය | නිවැරදි විමුක්තිය |
| ථිනමිද්ධයෙන් මඩනා ලද බව | පහවූ ථිනමිද්ධ ඇති බව |
| උඩගු බව | නිහතමානී බව |
| සැක බව | නිසැක බව |
| කිපෙන සුලු බව | නොකිපෙන සුලු බව |
| බද්ධවෛර ඇති බව | බද්ධවෛර නැති බව |
| ගුණමකු බව | ගුණමකු නොවූ බව |
| යුග ග්‍රාහ ඇති බව | යුග ග්‍රාහ නැති බව |
| ඊර්ෂියාවන්තකම | ඊර්ෂියාවක් නොමැති බව |
| මසුරු බව | මසුරුකමක් නැති බව |

| | |
|---|---|
| කෛරාටික බව | කෛරාටික කමක් නැති බව |
| මායා ඇති බව | මායා නැති බව |
| තද බව | තදකම නැති බව |
| මානාධික බව | මාන්නය නැති බව |
| අකීකරු බව | කීකරු බව |
| පාප මිත්‍රයන් ඇති බව | කල්‍යාණ මිත්‍රයන් ඇති බව |
| ප්‍රමාද බව | අප්‍රමාද බව |
| සැදැහැ නැති බව | සැදැහැ ඇති බව |
| ලැජ්ජා නැති බව | ලැජ්ජා ඇති බව |
| පවට බිය නැති බව | පවට බිය ඇති බව |
| ඇසූ පිරූ තැන් නැති බව | ඇසූ පිරූ තැන් ඇති බව |
| කුසීත බව | ආරබ්ධවීර්ය ඇති බව |
| සිහි මුළා බව | සිහි නුවණ ඇති බව |
| මෝඩ බව | නුවණ ඇති බව |
| තම අදහසම දැඩි කොට ගත් බව | තම අදහසම දැඩි කොට නොගත් බව |

බුදු සමයට අනුව සියලුදෙයට සිත ප්‍රධාන වේ. ඉහත සඳහන් කල රෝග 44 හට ගැනීමටද මූලික වන්නේ සිතෙහි ඇතිවන ක්ලේෂ තත්ත්වයන්ය. අපගේ සිත මනාව පිහිටුවා නොගැනීමෙන් සිතෙහි ඇතිවන විෂමකාරී තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහත රෝගයන් හටගන්නා බව බුදුන්වහන්සේ අනු දැන වදාළහ. මෙම මානසික රෝගී තත්ත්වයන් පසුකාලීනව නොයෙකුත් ශාරීරික රෝග ලෙස ඉස්මතුවන බව වර්තමාන බටහිර වෛද්‍යවරුන්ගේ පවා මතයයි. එසේ වුවද, අපගේ සැම කරුණකටම සිත ප්‍රධානවන බවත් මිනිසාට වැළඳෙන මෙම රෝගී තත්ත්වයන් පිළිබඳවත් බුදුරදුන් විසින් දේශනා කරනු ලැබුවේ මෙයින් වසර 2500කටත් ඉහතදීය. සිද්ධාර්ථ කුමාරයා මෙලොව උප්පත්තිය ලැබුවේ දෙවියකු ලෙස නොවේ. අප මෙන්ම මෙම භූමි තලයේ වාතාශ්‍රය හුස්ම ගන්නා සාමාන්‍ය දරුවකු ලෙසය. එසේම රාජකුමාරයකු ලෙසද කටයුතු කළේ අනෙකුත් සමකාලීනයන් සමග සාමාන්‍ය තරුණයකු ලෙසයි. එහෙත් මෙලොවෙහි අනිත්‍ය ස්වභාවය පිළිබඳ නිරන්තර අවධානයෙන් පසුවූ සිදුහත් කුමරු සියලු කෙලෙස් ප්‍රහීන කොට බුද්ධත්වයට පත්වූ පසු මිනිසාත් මිනිස් සිතත් පිළිබඳව දැනගත යුතු සියල්ල අවබෝධ කර ගත්තේය. බුදුන් වහන්සේ මිනිසුන්ට වැළඳුණු බොහෝ ශාරීරික හා මානසික රෝගී තත්ත්වයන්ට ප්‍රතිකාර කර ඇති බව බුදුසමය පෙන්වා දෙයි. කිසාගෝතමී, අංගුලිමාල වැනි තදබල ලෙස මානසික රෝගී තත්ත්වයන්ගෙන් පෙළුණු අයවලුන් සඳහා ප්‍රතිකාර ලබාදී සුමගට යොමුකරනු ලැබුවේ අතිදක්ෂ මානසික වෛද්‍යවරයකු ලෙසයි. මෙවැනි අවස්ථා බුද්ධ චරිතයේ ඕනෑ තරම් සොයා ගැනීමට ඇත. බෞද්ධ සම්ප්‍රදාය තුළ බුදුන් වහන්සේ හඳුන්වා ඇත්තේ කායික හා මානසික රෝග පිළිබඳ ශ්‍රේෂ්ඨතම වෛද්‍යවරයා ලෙසයි. මක්නිසාදයත් සියලු රෝගවලට උපත වන සසර දුකට උන් වහන්සේ ඖෂධ නියම කරන නිසාය. බෞද්ධයින් වශයෙන් අපට ඇති ලොකුම සතුට ප්‍රීතිය සැනසීම හා ආඩම්බරය වන්නේ අප අදහන ශාස්තෘවරයා ඉතිහාසයක් නැති දෙවියකු නොව් ඉතිහාසයක් ඇති උත්තරීතර මනුෂ්‍යයකු වීමයි.

# ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) වෙතින් සංස්කරණ පාඨමාලාවක්





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ සේවයේ නියුතු නිලධාරීන් සහ නිලධාරිනියන්ගේ දැනුම තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් හටකාර්ය සම්පාදනය සහ පරිපාලන කටයුතු පිළිබඳ සංස්කරණ පාඨමාලාවක් ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) මූලස්ථානය වෙතින් අගෝස්තු මස 15 දින මින්නේරියේ පිහිටි 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා මූලස්ථානයේදී ආරම්භ කරනු ලැබීය. ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ගේ උපදෙස් මත දින 4 ක් පුරාවට පැවති මෙම සංස්කරණ පාඨමාලාව සඳහා නිලධාරීන් 29 ක් සහභාගී වූහ.



# ඵලදායී නායකයකු වීමට නම්



සටහන

මේජර් ජෙනරාල් කීර්ති කෝට්ටවත්ත (විශ්‍රාමික)

ඵලදායී නායකයකු යනු තම අනුගාමිකයින්ගේ හැසිරීම්, ක්‍රියා කලාපයන් මෙන්ම ඔවුන් සිතන පතන ආකාරයට පවා බලපෑම් කළහැකි අයකි. එවන් නායකයකු යටතේ අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් වෙත ළඟාවීම පහසුය. යම් කණ්ඩායමක් ප්‍රතිඵලදායී ලෙස මෙහෙයවීමට ඕනෑම මට්ටමක නායකයකු සතුව සුවිශේෂී ගුණාංග රැසක් තිබිය යුතුය. එසේම දක්ෂ නායකයකු සැමවිටම සාම්ප්‍රදායික නායකත්ව මොඩලයන්ගෙන් පරිබාහිරව සිය කණ්ඩායම ඉලක්කයන් වෙත මෙහෙයවිය යුතු අතර පහත දක්වා ඇති නායකත්ව ගුණාංගයන්ගෙන් සහ ආකල්පයන්ගෙන් ඔහු සන්නද්ධ නම් ඔහු අවිවාදයෙන්ම ඵලදායී නායකයෙකි.

බොහෝ දෙනකු සිතන්නේ සාර්ථක නායකයකු වීමට නම් කෙනකු දක්ෂතා රැසකින් පරිපූර්ණ විය යුතු බවයි. එහෙත් යථාර්ථය එය නොවේ. සාර්ථක නායකයකු යනු සියලු දේ දැනසිටියයුතු අයෙකු නොවේ. එහෙත් විවිධ ක්ෂේත්‍රයන් තුළ සිය අනුගාමිකයින් නිපුණ කිරීමට ඔහු ක්‍රියා කළයුතු වනවා මෙන්ම ඔවුන්ට නිසි මඟපෙන්වීමටද ඔහුට හැකියාවක් තිබිය යුතුය. නායකත්වය යනු තමා දක්ෂතාවලින් පරිපූර්ණ වීමම නොවේ. නායකත්වය යනු අනුගාමිකයන් දක්ෂතාවලින් පරිපූර්ණ කිරීමයි.

සාර්ථක නායකයකු වීමට නම් ඔබ ධනාත්මක සිතුවිලි ඇත්තකු විය යුතුය. සෘණාත්මක සහ දුර්වල සිතුම් පැතුම්වලින් ඔබ ඔබේ මනස පුරවාගෙන ඇත්නම් ඔබේ කණ්ඩායම සාර්ථක ලෙස ඉලක්කයන් වෙත මෙහෙයවීම අපහසුවිය හැකිය. ධනාත්මකව සිතන්නන්ට සෑම ගැටළුවකටම විසඳුමක් තිබේ. එහෙත් සෘණාත්මකව සිතන අයකු සෑම විසඳුමකම ගැටළුවක් දකී. එය සාර්ථක නායකත්වයක ලක්ෂණයක් නොවේ.

බොහෝ නායකයින් සිතන්නේ යමක් කරන ආකාරය සිය අනුගාමිකයිනට තමා විසින්ම කියා දියයුතු බවයි. එහෙත් ඵලදායී සහ දක්ෂ උපායශීලී නායකයකුගේ ක්‍රමවේදය මීට හාත්පසින්ම වෙනස්ය. යමක් කරන ආකාරය හොඳ නායකයකු කිසිදු විටෙක සිය අනුගාමිකයන්ට කියාදීමට යන්නේ නැත. ඔහු සැමවිටම සිය අනුගාමිකයින්ට පවසන්නේ තමන්ට අවශ්‍ය කුමක්ද යන්නයි. එවන් විටෙක බොහෝවිට අනුගාමිකයින් ඔවුන්ගේ සහජ දක්ෂතාවයන්ගෙන් සිය නායකයාව පුදුමයට පත් කරනු ඇත.

දක්ෂ නායකයකු යනු සිය නායකත්වයේ අනුහසින් සහ බලයෙන් මත්ව අත්තනෝමතිකව ක්‍රියාකරන්නකු නොවේ. සැමවිටම නායකයින් ශ්‍රේෂ්ඨ වන්නේ ඔවුන්ගේ බලය නිසා නොව ඔවුන්ගේ අනුගාමිකයින් බලගැන්වීමට නායකත්වයේ ඇති සුවිශේෂී හැකියාව මතය.

තම අනුගාමිකයින් නිරන්තරයෙන් පෙළමින් සහ සැමවිටම ඔවුනට එදිරිව යමින් ක්‍රියා කිරීම හොඳ නායකයකු සතු ලක්ෂණයක් නොවේ. බොහෝවිට

**ඇතැම් නායකයින් ස්වභාවයෙන්ම සිය අනුගාමිකයින් දුකට, මානසික පීඩාවට සහ කළකිරීමට පත් කරයි. ඔවුන් සිතන්නේ සිය අනුගාමිකයින් මානසිකව හා කායිකව පීඩාවට පත් කිරීම සහ බිය ගැන්වීම සිය නායකත්ව කාර්යභාරයේ කොටසක් ලෙසිනි. එහෙත් යථාර්ථය නම්, ඔවුන් සැබෑ නායකයින් නොවේ. ඔවුන් නායකයන් සේ වෙස්වළාගත් දුර්වල පෞරුෂයක් ඇති පුද්ගලයන්ය. එවන් නායකයින් කිසිදා සිය අනුගාමිකයින්ගේ සැබෑ ගෞරවාදරයට පත් වන්නේද නැත.**

මෙසේ හැසිරෙන්නේ දුර්වල පෞරුෂයක් ඇති මිනිසුන්ය. ඔබේ අනුගාමිකයින් හා අමනාපව සහ හිතෛෂී නොවී සිටීමෙන් ඔබ කිසිදා ශක්තිමත් නොවේ. එම තත්වය ඔබට මෙන්ම අනුගාමිකයින් හටද නීරස අත්දැකීමක් වනු ඇත. අනුගාමිකයින්ගේ ඇතැම් අත් වැරදීම් සහ අතපසුවීම්වලට සමාවදීම ඔබ දුර්වලයකු නොකරයි. එය ඔබගේ මනස නිදහස් කරයි.

බොහෝ නායකයින් සිටින්නේ සැමවිටම කේන්තියෙනි. ඔවුන් සිතන්නේ සිය අනුගාමිකයින් හා නිරන්තර කේන්තියකින් සහ තරහවකින් පසුවීම තුළින් ඔවුන්ට සිය පාලනය පහසුවෙන් සහ ක්‍රමවත්ව පවත්වාගෙන යා හැකි බවකි. ඔවුන් නිතරම වැරදි සොයයි. එහෙත් යථාර්ථය ඊට ඉඳුරාම වෙනස්ය. යමෙකුගේ කෝපය කිසිවක් විසඳන්නේ හෝ සාර්ථකව යමක් ගොඩනගන්නේද නැත. නමුත් ඊට සියල්ල විනාශ කළ හැකිය.

සාර්ථක නායකයකු සැමවිටම සිය අපේක්ෂිත ඉලක්කයන් වෙත ළඟාවීමට සිහින දැකිය යුතුය. ඒ සඳහා ක්‍රියා කළ යුතුය. සිය අනුගාමිකයින් ඉලක්කයන් වෙත මෙහෙයවිය යුතුය. සාර්ථක නායකයකු සැමවිටම සඳ ඉලක්ක කිරීමට වගබලාගත යුතුය. එය ඔබට මග හැරුණහොත්, ඔබට තරුවක් වෙත හෝ ළඟාවිය හැකිවනු ඇත.

නායකයකු දැනුමින් සන්නද්ධ විය යුතු බවට විවාදයක් නැත. දැනුමක් නොමැති නායකයකු ඵලදායී නොවේ. මේ දැනුමට අමතරව සාර්ථක නායකයකු වීමට ඔබේ චරිතයද විශිෂ්ට විය යුතුය. නායකයකු ලෙස දැනුම ඔබට ශක්තිය සහ බලය ලබාදෙනු ඇත. නමුත් ඔබේ යහපත් චරිතය ඔබට ඔබගේ අනුගාමිකයින්ගේ ගෞරවය නිබඳව ලබාදෙයි.

ඇතැම් නායකයින් ස්වභාවයෙන්ම සිය අනුගාමිකයින් දුකට, මානසික පීඩාවට සහ කලකිරීමට පත් කරයි. ඔවුන් සිතන්නේ සිය අනුගාමිකයින් මානසිකව හා කායිකව පීඩාවට පත් කිරීම සහ බිය ගැන්වීම සිය නායකත්ව කාර්යභාරයේ කොටසක් ලෙසිනි. එහෙත් යථාර්ථය නම්, ඔවුන් සැබෑ නායකයින් නොවේ. ඔවුන් නායකයන් සේ වෙස්වළාගත් දුර්වල පෞරුෂයක් ඇති පුද්ගලයන්ය. එවන් නායකයින් කිසිදා සිය අනුගාමිකයින්ගේ සැබෑ ගෞරවාදරයට පත් වන්නේද නැත.

නායකත්වය යනු කලාවකි. එම කලාව නායකයකු ලෙස ඔබ හොඳින් පුරුදු පුහුණු කළ යුතුය. මේ සඳහා සාම්ප්‍රදායික නායකත්ව ගුණාංග සහ ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට ගොස් ඔබගේ අනුගාමිකයින් මෙහෙයවීම තුළින් අපේක්ෂිත ඉලක්කයන් වෙත ඔබගේ කණ්ඩායම මෙහෙයවීමට හැකිවනවා පමණක් නොව ඔබ මෙහෙයවන කණ්ඩායම, ඒකකය හෝ අංශය තුළ ඵලදායිතාවද ඉහළ නැංවෙනු ඇත. එසේම ඉහත දක්වන ලද කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඔබ ක්‍රියා කළහොත් සාර්ථක නායකයකු ලෙස දිගු කලක් ඔබේ අනුගාමිකයන්ගේ හදවත් තුළ ඔබ නිබඳවම රැඳෙනු ඇත.

# අභිමානවත් 13 වන සංවත්සරය සමරමින්



ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) හි 13 වන සංවත්සරය එහි ආඥාපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන් ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු මස 13 වන දින පවත්වන ලදී. තවද, එම අවස්ථාවට සමගාමීව යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී එහි සංචාරයකද නිරත විය. ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) හි රාජකාරියෙහි නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවති එම අවස්ථාවන්හි විශේෂ මතක සටහන් මෙහි දැක්වේ.





# ක්‍රීඩා විත්ති

## තායිලන්තයේ පැවති විවෘත රෝද පුටු ටෙනිස් ශූරතාවලියේ විවෘත යුගල ඉසව්වේ අනුශූරතාව මෙරටට




පසුගිය අගෝස්තු මස 22 දින සිට සැප්තැම්බර් මස 2 වන දින දක්වා තායිලන්තයේ, පතායා ප්‍රදේශයේ පැවති විවෘත රෝදපුටු ටෙනිස් විවෘත යුගල ඉසව්වෙන් තරඟවැදුණු 4 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ මාණ්ඩලික සැරයන් ධර්මසේන ඩීඑස්ආර් එම තරගාවලියේ අනුශූරතාව දිනාගැනීමට සමත් විය. මෙම තරගාවලිය සඳහා තවත් ආසියානු රටවල් නියෝජනය කරමින් රෝදපුටු ටෙනිස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් එක්ව තිබිණ.



## ආධුනික දියපන්දු තරගාවලිය - 2022

ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ආධුනික දිය පන්දු තරගාවලිය - 2022 ඉකුත් අගෝස්තු 22 වන දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණ පිහිනුම් තටාකයේදී පැවැත්විණ. එහිදී, පිරිමි විවෘත කණ්ඩායම් ශූරතාවය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම විසින් දිනාගන්නා ලද්දේ ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායම අනුශූරයින් කරමිනි. 16 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රයිෆල් සෙබළ විමලසිරි ආර්ඩබ්ලිව්ඒයිඑස් එහි විවෘත අංශයේ දක්ෂතම ක්‍රීඩකයා විය.

## ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක පිහිනුම් තරගාවලිය



පසුගියදා පැවති සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක පිහිනුම් තරගාවලියේ ශූරතාවය දිනාගැනීමට 15 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම සමත් වූහ. එහි අණදෙන නිලධාරී මේජර් ආර්එම්ජේබී රාජපක්ෂ ගේ අණදීම යටතේ වූ එම ඒකක පිහිනුම් කණ්ඩායම අදාළ ක්‍රීඩා තරගාවලියේ දී සිංහ රෙජිමේන්තුවට අයත් ඒකක සියල්ල අභිබවා එම ජයග්‍රහණය ලබාගැනීම විශේෂය. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මෙන්ම ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ කර්නල් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී ගේ සහභාගීත්වයෙන් යුතුව තරගාවලියේ අවසන් අවස්ථාව පැවැත්විණ.

වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ
ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි
"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.



21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**යූඩබ්ආර් වීරකෝන්**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 අගෝස්තු මස 31 වන දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ බලකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්ඩබ්ලිව්ටීබී මෙත්තානන්ද**
**යූඑස්පී එන්ඩීසී**
**2022 සැප්තැම්බර් මස 01 වන දින රාජකාරි භාරගන්නා ලදී.**

තවද ඉදිරි තබන්තු පෙදෙස (හැංගෙහිරි) ආඥාපති ලෙස 2022 සැප්තැම්බර් මස 22 වන දින රාජකාරි භාරගන්නා ලදී.



64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එච්ඩීඩබ්ලිව්ජේඑන් ජයගම**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 අගෝස්තු මස 30 වන දින සිට**



මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**එස් කස්තුරිමුදලි**
**ආර්එස්පී එන්ඩීසී පීඑස්සී**

**2022 සැප්තැම්බර් මස 16 වන දින සිට**



මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**ටීසීකේ පීරිස්**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2022 සැප්තැම්බර් මස 21 වන දින සිට**



112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**

**ටීඕඑම්පීඑස්ටී කුරේ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**යූඑස්පී පීඑස්සී**

**2022 සැප්තැම්බර් මස 14 වන දින සිට**



512 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එල්පීජේඑන් ආරියතිලක**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2022 සැප්තැම්බර් මස 29 වන දින සිට**



522 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**කේඑම්සීඑස් කුමාරසිංහ**

**2022 සැප්තැම්බර් මස 16 වන දින සිට**



242 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**එස්ඒයූඑ් සෝලංගආරච්චි**
**ආර්එස්පී පීඑස්සී**

**2022 සැප්තැම්බර් මස 14 වන දින සිට**



221 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ආර්එම්එස්පී රත්නායක**
**යූඑස්පී පීඑස්සී අයිජී**

**2022 සැප්තැම්බර් මස 12 වන දින සිට**



ආරක්ෂක සේනා (වන්නි) කර්නල් (පාලන/භාණ්ඩ) ලෙස

**කර්නල්**
**ඩීපීකේ ගමගේ**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 සැප්තැම්බර් මස 06 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ජ්‍යෙෂ්ඨ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස

**කර්නල්**

**පීකේඑන්ආර් රත්නසිංහ**
**කේඑස්පී**

**2022 සැප්තැම්බර් මස 27 වන දින සිට**



532 වන පාබල
බලසේනාවේ ජ්‍යෙෂ්ඨ
මාණ්ඩලික නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**අයිඩීඑස් ධර්මරත්න**
**ආර්එස්පී අයිඑස්සී**
**2022 අගෝස්තු මස 24 වන**
**දින සිට**



වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ
මණ්ඩලයේ
මානි 1 - වැටුප් හා ලේඛන ලෙස
**ලුතිනන් කර්නල්**
**ජේඊසී පද්මකුමාර**
**2022 සැප්තැම්බර් මස 19 වන**
**දින සිට**



12 වන බළඇණිය විජයබාහු
පාබල රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**එච්එම්ජේඑස් බංඩාර ආර්එස්පී**
**2022 අගෝස්තු මස 08 වන**
**දින සිට**



ඉඩම්, දේපළ සහ ගට නිවාස
අධ්‍යක්ෂ මණ්ඩලයේ
මානි 1 (ඉඩම්) ලෙස
**ලුතිනන් කර්නල්**
**එම්පීඑස්ඩී විජේසූරිය ආර්එස්පී**
**2022 සැප්තැම්බර් මස 27 වන**
**දින සිට**



16 වන ශ්‍රී ලංකා සිංහ
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**කේආර් පෙරේරා ආර්එස්පී**
**2022 සැප්තැම්බර් මස 30 වන**
**දින සිට**



12 වන බළඇණිය ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ අණදෙන
නිලධාරී ලෙස
**මේජර්**
**එම්සීඑස් ජයසේකර යූඑස්පී**
**2022 අගෝස්තු මස 02 වන**
**දින සිට**



8 වන විජයබාහු පාබල
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**පීඑන්පීආර් සිල්වා**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2022 සැප්තැම්බර් මස 01 වන**
**දින සිට**



4 වන ශ්‍රී ලංකා විදුලි හා
යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ටීඑම්ඩබ්ලිව්බී**
**කරුණාරත්න එල්එස්සී**
**2022 සැප්තැම්බර් මස 12 වන**
**දින සිට**

# පවස නිවාලීමට ජල පිරිපහදු යන්ත්‍රයක්





15 (සේවා) බළඇණිය ගජබා රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් ජේ/343 වරණි ඉයට්ටාල් ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති යා/වරණි ඉයට්ටාල් විද්‍යාලයට අඩුපාඩුවක්ව පැවති සිසු දරු දැරියන්ගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ජල පිරිපහදු යන්ත්‍රයක් පසුගිය සැප්තැම්බර් 28 වන දින ආරක්ෂක සේනා යාපනය ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් සිසු අයිතියට පත් කරන ලදී. මෙම ජල පිරිපහදු යන්ත්‍රය සඳහා 522 වන පාබල බලසේනාවේ ප්‍රමානි 111 කපිතාන් එන්ඩබ්ලිව් හිතේෂ ගේ සම්බන්ධීකරණයෙන් Korea Friends of Hope International රාජ්‍ය නොවන සංවිධානය විසින් මූල්‍ය දායකත්වය සපයන ලදී. මෙම අවස්ථාවට Korea Friends of Hope International ආයතනයේ සභාපති Sun Bong Choi මහතා සහ එම මැතිණිය, 5 (සේවා) බළඇණිය ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී, විද්‍යාලේ ගුරුවරුන්, සිසු සිසුවියන් සහ දෙමාපියන් සහභාගී වූහ.




## විමසා සමුගත් මතකය...

සෙමෙන් මා ඇස දැවටෙන්නෙ
එන්න මදනළ ඔබ එන්න
නුඹට මුසු වූ සුසුම
උණුසුමින් මට දෙන්න
මාලතී සුවඳ ගෙන
ඒ හදවත පුරවන්න
මගෙන් අවසර කුමට
මතකයට සුමදෙන්න
නොකියාම උන්නු තැන්
සිත් කොහින් වියකන්න
සිනාපිරි මතකයන්
තිළිණියක් සේ දෙන්න

සෙ/631566
කාංස මෙන්ඩිස් එම්වීඑස්ඩී
5 ශ්‍රීලවියාඉ

## නිමා වූ වස්සානය...

වස්සානයේ සිත සැනසූ වැස්ස ඔබයි
ඔබේ සෙනෙහෙබර ආලයයි
හිඟුරුම් දුන් ගෙණ හඬ ඔබයි
ඔබේ සිනහවයි
ඇසිල්ලකින් ඇදී මැකී ගියා වූ
අකුණු සැර ඔබයි ඔබේ රුවයි
දිය පොදක් නොහී ඉකිගසනා
පොළව මමයි මගේ සිතයි
ඔබ ගිම්හය අදයි
ඉඩෝරය මමයි

සෙ/632226
කාංස තිලකරත්න ඩීඑම්පීඩී
7 ශ්‍රීලවියාඉ

## මිනිසා...

මිනිසත් බව ලබා
මෙලොවට බිහි වුවද
මිනිසකු යයි හඳුනාගෙන
කිසිවෙකුත් ලොවෙහි නැත
විස පිරුණු කුරිරු වුණු
මිනිසුනම දිවි ගෙවන
ලොවෙක ජීවත් වෙන්න
නොහැක මිනිසකු විලස

සෙ/627874
ඔහි 1 එස්ඩබ්ඩබ්එස්ආර් ද සිල්වා
වියාඉ පුහා - ගන්නොරුව

## නුඹව ආයෙත් දකින්නට...

තරු කෙතරම් බලා සිටිනවා ඇතිද
සඳ ආයෙත් පුර සඳ වී දකින්නට
පොළොව කෙතරම් බලා සිටිනවා ඇතිද
මහ වැස්සක් යළි සිප ගන්නට
බිළිඳෙක් කෙතරම් බලා සිටිනවා ඇතිද
මව්කිරි බිඳක් තොල ගාන්නට
මමත් කෙතරම් බලා සිටිනවා ඇතිද
නුඹව අයෙත් එක් වරක් දකින්නට

සෙ/632122
කාංස කරුණාතිලක කේඩබ්ඩබ්
ශ්‍රීලවියාඉමුවා - උඩවලව

## හදවත තුළ නොමියෙන අසිපත...

යුද සෙන්පතියාණෙනි ගරු
පියෙකි උපදේශකයෙකි රණවිරුවෙකි නුඹ අපහට
මිදූ මෙලෙක් මිලිනව ගිය අමරණීය
අසිපත වෙනුවෙන් සාමග ෂමගිය
අපමණ වෙහෙසක් ගත් ඔබ
අභිමි විය සැමට ලක්වැසි
වීර සෙන්පතිදානෙනි
මැරුණා නොවේ ඔබ
කුසුමක් විය පිපී දිලෙන
මිය ගියද මිය යන්නෙද නැත
රටට දැයට ජාතියට මහත් ගෞරවයන් ලබාදී
සමුගත්තද සමුගෙන නොමැත
සදා නොමියෙන සේ ජීවමානය අප හද තුළ
ගුරු පියාණෙනි යුද සෙන්පතියාණෙනි
ඔබට ජාතියේ උත්තමාචාරය
නිවන් සුව සුබ ගමන්
පියාණෙනි ගරු

හි/70207
ලුතිනන්(උපා) ඒපීඑස් චන්ද්‍රසිරි
ගරෙ

## සිතුවිල්ල...

නිවසක් සමග සසඳන විට
දොර ඉතා කුඩා
දොරට සාපේක්ෂව අගුල කුඩා වේ
සියල්ලටම වඩා යතුර කුඩා වුවද
යතුරට මුලු නිවසම විවෘත කළ හැක
ඔබගේ කුඩා සිතුවිල්ලකින් පවා
විශාල ගැටලු විසඳිය හැක

සෙ/ඩී00716
කෝප්‍රල් සම්පත් එම්ඩබ්එම්
14(සෙවී) ශ්‍රීලපාහ

## සොඳුරු හසරැල්...

මවමින් සොඳුරු හසරැල
ලක් මව මනසේ
සුවබර සෙනෙහේ
හැඟුමෙන් හදවත සැනසේ
මුව මදහාස පෙන්වයි හිරු නැග අහසේ
නව ලොව මල් පිපෙයි පුබුදා සිත් රගසේ

සෙ/415493
ඔහි 11 අමරසිංහ ඒපීඑන්කේ
5 ගැගෙබ - අභිමංසල 3

# No one knows..?

People blame.....People scream...
They say that to be ashamed
That I'm to be ashamed
Being a soldier's daughter
And, then I ask myself slowly
Why should I disgrace the sacrifice
They did for us
And fearful moments they suffered
For your joy tomorrow
Why should I insult the bravery
which they showed with
Sleepless nights in the fields
Why should I not cherish "A Nation Hero"
Who sacrificed the hope
Of living everyday in war
But unfortunately....No one knows..

Why yelling at them saying
You'll scrammed saying
" Remove the uniform"
But what if they really do..?
What if they did it before 2009
Shouldn't judge 'em
We all would be in the doom
Back then in 2009
They only had a day called today
Planning for tomorrow
And a little hope to live in
Day after tomorrow
And...No one knows...

People in power rules them
People without power rejects them
But they standstill for the command
With no choice to give up
But they still feel your pain
People only see the guns they have
The poles they hold &faces covered
To shlow no fear
But nobody sees the
Pain with no choice
'Cuz.. No one Knows

Do we want a kingdom?
Without a barrier?
A country without a law?
They choose to be helpless
Against making country unstable
At least let's try not to insult
Those souls who sacrificed
Their only life in those battles
And to they who lost half of their bodies
Just to give justice for you & me
But now I guess...No one knows

What will happen when
Their shelter is needed again
What will happen when
Their protection is needed again
Will they back off?
Or will they blame you?
'Cuz you're the one who
Dishonored they're power of sacrifice
Or will they come up with
The same bravery for you?
Cuz "Ones a solider always a soldier"
But ...No one knows...

By: Naduni Kaluaggala

I would love to dedicate this poem as an honour
to my father who was awarded the gallantry medals
of "Ranashura Padakkama" & "Uththama Seva Padakkama"
during the Eelam war from 1998 to 2009

# ENGLISH VISION

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## As far as I

යම්කිසි වාක්‍යයක් ප්‍රකාශ කිරීමට ආරම්භ වාක්‍යය කණ්ඩයක් ලෙස **"දන්න තරමට, යම්තාක් දුරට"** ආදී වශයෙන් අර්ථය ඇතිව මෙම වාක්‍යය රටාව භාවිතයෙන් දක්නට ලැබේ.

***Fomular*** :- සූත්‍රය

> **As far as I + Subject + Verb + Object + Rest.**
> ඇස් ෆා ඇස් අයි + සබ්ජෙක්ට් + වර්බ් + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> දන්න තරමට, යම්තාක් දුරට + කතෘ + ක්‍රියාපදය + කර්මය+ ඉතිරිය.

***Ex*** / උදා :-

1. As far as I remember he didn't come home until midnight.
   ඇස් ෆා ඇස් අයි රිමෙම්බර් හී ඩිඩ්න්ට් කම් හෝම් අන්ටිල් මිඩ්නයිට්.
   මම දන්න තරමට ඔහු මධ්‍යම රාත්‍රිය වෙනකම් ගෙදර ආවේ නැහැ.

2. As far as I know she is married now.
   ඇස් ෆා ඇස් අයි නෝ ෂී ඉස් මැරීඩ් නව්.
   මම දන්න තරමට ඇය දැන් විවාහකයි.

3. As far as I know they don't live here.
   ඇස් ෆා ඇස් අයි නොව් දේ ඩොන්ට් ලිව් හියර්.
   මම දන්න තරමට ඔවුන් මෙහි ජීවත් වෙන්නෙ නැහැ.

4. As far as I know she is good.
   ඇස් ෆා ඇස් අයි නොව් ෂී ඊස් ගුඩ්.
   මම දන්න තරමට ඇය හොඳයි.


***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී කාල අර්ථයෙන් එම වාක්‍යය භාවිතා වී ඇති බව වටහාගත හැක. මෙම වාක්‍යය රටාව භාවිතා කිරීමේදී,

- **As far as I** :- "මම දන්න තරමට, යම්තාක් දුරට" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම ඛණ්ඩය කිසිඳු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.
- **Subject** :- කතෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමග ව්‍යාකරණානුකූලව භාවිතා වේ.
- **Verb** :- ක්‍රියා පදය උගත් ව්‍යාකරණ රීතීන්ට අනුව වාක්‍යයේ භාවිතා කළ යුතුය.
- **Object** :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයකු හෝ පදයක් වෙනම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිතා වේ.
- **Rest** :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

> **<u>Analysis of the sentence formation</u>** <u>- වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශණය.</u>
>
> **As far as I + Subject + Verb + Object + Rest.**
> ඇස් ෆා ඇස් අයි + සබ්ජෙක්ට් + වර්බ් + ඔබ්'ජෙක්ට් + රෙස්ට්.
> දන්න තරමට, යම්තාක් දුරට + කර්තෘ + ක්‍රියාපදය + කර්මය+ ඉතිරිය.
>
> **As far as I remember he didn't come home until midnight.**
> ඇස් ෆා ඇස් අයි රිමෙම්බර් හී ඩිඩ්න්ට් කම් හෝම් අන්ටිල් මිඩ්නයිට්.
> මම දන්න තරමට ඔහු මධ්‍යම රාත්‍රිය වෙනකම්ම ගෙදර ආවෙ නැහැ.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද, ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



මේජර් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොදුසේබ
ජනමාධ්‍ය අංශ - යුහමු
*www.englishvision.lk*

# 59 වන පාබල සේනාංකය වෙතින් DINERS CLUB වැඩසටහනක්







59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ අදහසකට අනුව එම පාබල සේනාංකය සහ ඒ යටතේ පාලනය වන පාබල බලසේනාවන් හා ඒකකයන්හි රාජකාරී නියුතු නිලධාරීන් සහ නිලධාරිනියන්ගේ සහභාගීත්වයෙන් DINERS CLUB වැඩසටහන ඉකුත් සැප්තැම්බර් 02 වන දින එම පාබල සේනාංක නිලධාරී නිවස්නයේදී පවත්වනු ලැබූහ. ඒ සඳහා ආරාධිත දේශකයා ලෙස 59 වන පාබල සේනාංකයේ ආරම්භක සේනාංකාධිපති වූ මේජර් ජෙනරාල් එන් උඩවත්ත (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. එහිදී, ඔහු මානුෂික මෙහෙයුම සහ 59 වන පාබල සේනාංකයේ කාර්යභාරය පිළිබඳව තම අත්දැකීම් ඉතාමත් විශිෂ්ට ලෙස ඉදිරිපත් කළ අතර, එය ඉතාමත් හරවත් හා කණිෂ්ඨ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරගැනීමට අවස්ථාවක් විය. තවද, දේශනය අවසානයේ ඒ පිළිබඳ කථිකාවක්ද පැවැත්විණ.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩීඑච එම්ඩී ආරච්චි යූඑස්පී අයිඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආරඑම්එච්පීජීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුමිත චමින්ද වීරසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්යූ ලක්මිණා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 මහී II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජේඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# අන්තර් රෙජිමේන්තු බොක්සිං තරඟාවලිය - 2022









යුද්ධ හමුදා බොක්සිං කමිටුව මගින් සංවිධානය කරන ලද "අන්තර් රෙජිමේන්තු බොක්සිං තරඟාවලිය - 2022" ඉකුත් සැප්තැම්බර් 20 වන දින පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය ඇතුළු රෙජිමේන්තු 15 ක් නියෝජනය කරමින් තරඟකරුවන් රැසකගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු මෙම තරඟාවලිය සැප්තැම්බර් මස 17 දින සිට 21 දින දක්වා දින පහක් පුරාවට පැවැත්විණි. බර පන්ති 14 ක් යටතේ ක්‍රීඩකයින් 78 දෙනෙක් සහ ක්‍රීඩිකාවන් 11 දෙනෙක් තරඟ වැදුනු මෙම තරඟාවලිය යුද්ධ හමුදාවේ නව බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතාවයන් ඔප්නැංවීමට මහගු අවස්ථාවක් විය. මෙහි අවසන් තරඟයට යුද්ධ හමුදා බොක්සිං කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ ආරාධනයෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

එහිදී, ඉතා තියුණු තරඟයකින් අනතුරුව අවසන් මහා තරඟයේ ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ බොක්සිං ක්‍රීඩකයින් සමත් වූ අතර, එහි අනුශූරතාවය විජයබාහු පාබල රෙජිමේන්තු බොක්සිං ක්‍රීඩකයින් හිමිකරගත්හ. එමෙන්ම, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බොක්සිං ක්‍රීඩකයින් එහි තෙවැනි ස්ථානය දිනාගැනීමට සමත්වූහ. මේ අතර, කාන්තා අංශයේ ශූරතාවය දිනාගැනීමට 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා ක්‍රීඩිකාවන් සමත්වූ අතර, එහි අනුශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා කාන්තා බොක්සිං ක්‍රීඩිකාවන් විසින් දිනාගත්හ.

එමෙන්ම, පිරිමි ආධුනික අංශයේ ප්‍රථම ස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තු බොක්සිං ක්‍රීඩකයින් දිනාගත් අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා බොක්සිං ක්‍රීඩකයින් ප්‍රථම අනුශූරතාවයත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා බොක්සිං ක්‍රීඩකයින් දෙවන අනුශූරතාවයත් දිනාගනු ලැබූහ. ආධුනික කාන්තා අංශයේ පළමු ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය දිනාගත් අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බොක්සිං ක්‍රීඩිකාවන් දෙවන ස්ථානය දිනාගනු ලැබීය.

තරඟාවලියේ දක්ෂතම පිරිමි බොක්සිං ක්‍රීඩකයා ලෙස විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ප්‍රසන්න පීඊආර් සම්මානයට හිමිකම් කී අතර, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කෝප්‍රල් සංජීව නුවන් එම්පීපී දක්ෂතම පරාජිතයා ලෙස සම්මාන හිමිකරගත්තේය. මේ අතර හොඳම කාන්තා බොක්සිං ක්‍රීඩිකාව ලෙස 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කාන්තා සෙබළ රත්නපුලි එස්ඩබ්ලිව් සම්මානයට හිමිකම් කී අතර දක්ෂතම පරාජිතයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ සාමාන්‍ය සෙබළ මනතුංග එම්ඩීඩී සම්මානයට හිමිකම් කීය.

තරඟාවලිය සමාප්තියේ යුද්ධ හමුදාධිපති ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත කුසලාන සහ සහතිකපත් ප්‍රදානය කරන ලදී. එමෙන්ම, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද ජයග්‍රාහකයින් වෙත කුසලාන සහ සහතිකපත් ප්‍රදානය කිරීමට එක්වූහ.




# හිමිදිරියේ සූදානම...

කොහෙ හිටියත් හමුදාවෙ සූදානම එහෙමමයි. ඒකට ඉන්න තැන අදාළම නැහැ. ක්‍රියාන්විතයකට ගියත් පිලිවෙල පිරිසිදුකම හමුදාවේ අංක එක. ඒක විනයට අයිති කොටසක්. විශේෂයෙන්ම ක්‍රියාන්විතයක ඇරඹුමේදීත් එය අවසනදීත් සෙබළුන්ගේ මේ සූදානම නොවෙනස්. යුද බිමේ මෙවැනි මඩ වගුරු, දිය කඩිති පවා හමුදාවේ ඒ සංග්‍රාමික විනය පිළිබඳ සාක්ෂි දරාවි.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.